# බෞද්ධ දරුවාගේ අත්පොත

සම්පාදක
පූජ්‍ය දස්වත්තේ සුමනසීල ස්වාමින් වහන්සේ

බෞද්ධ දරුවාගේ අත්පොත

ප්‍රථම මුද්‍රණය : 2016

© : දස්වත්තේ සුමනසීල ස්ථවිර

ප්‍රකාශනය : කර්තෘ ප්‍රකාශනය

මුද්‍රණය

දිමුතු මුද්‍රණාලය
අංක 103/A, නුවර පාර, යක්කල.
දුර: 033-2239662 / 077-8829705
විද්‍යුත් තැපෑල: dimuthupub@yahoo.com
දහම් පොත් කියවීම සඳහා පිවිසෙන්න.
වෙබ්: www.dhammadanabooks.com

# පටුන


| | |
|---|---|
| 1. හැඳින්වීම | iv |
| 2. නමස්කාරය | 7 |
| 3. ප්‍රාර්ථනය සහ සිල් ඉල්ලීමේ වාක්‍යය | 8 |
| 4. සරණාගමණය | 10 |
| 5. පඤ්ච සීලය | 10 |
| 6. උපොසථ අට්ඨඞ්ග සීලය } ආහාර ප්‍රත්‍ය වේක්ෂාව | 11 |
| 7. බුද්ධ වන්දනාව | 14 |
| 8. බෝධි වන්දනාව | 32 |
| 9. පඤ්ච සීල ආනිසංස | 33 |
| 10. සීලානුස්සති භාවනාව | 36 |
| 11. තුණුරුවන් ගුණ භාවනාව | 40 |
| 12. මෛත්‍රී භාවනාව | 51 |
| 13. මව්පිය දරු යුතුකම් | 56 |
| 14. ගුරුවර ශිෂ්‍ය යුතුකම් | 58 |
| 15. ඡත්ත මානවක කතාව | 59 |
| 16. දෙතිස් කථා | 64 |
| 17. දස කථා | 65 |
| 18. දස කුසලය | 65 |
| 19. දස පුණ්‍ය ක්‍රියා | 66 |
| 20. බෞද්ධයාගේ ගුණ | 67 |
| 21. බෞද්ධයාගේ ලක්ෂණ | 67 |
| 22. සෙත් පිරිත් | 69 |
| 23. ස්වාමීන් වහන්සේලාට වැඳීම | 89 |
| 24. සාසනික පුණ්‍ය ප්‍රාර්ථනාව | 90 |
| 25. පුණ්‍යානුමෝදනා | 93 |




# හැඳින්වීම

## ළමා ජීවිතයට ලැබෙන සුතමය ඥාණය

සසර පාරමී පුරාගෙන එන බෝසත් ළමා ජීවිතය මුලු ලොවටම ඉතාමත් ආදර්ශයකි. එවැනි පිංවන්ත දරුවන් ලබන්නට දයාබර මව් පියන්ද බලාපොරොත්තුවේ. එම දරුවන් ලබන්නට සසර පිං වාසනාවක් තිබිය යුතුමය. අපේ ලංකාව එවැනි වීර දරුවන් පහළ වෙන මහා පුණ්‍ය භූමියකි. මද්දුම බණ්ඩාර කුඩා වීර පුතුනුවන්ද සිංහල ජනතාවට බෞද්ධ ජනතාවට ඉමහත් ආදර්ශයකි. ඒවාගේ අප ලංකාව එක් සේසත් කළ වීර දුටු ගැමුණු අභය කුමාරයාද අපට ඉමහත් ආදර්ශයකි. ගැහැණු දරුවන් අතර සංඝමිත්තා කුමරියද, විශාඛා කුමරියද අපට ඉතා ආදර්ශවත්ය. එවැනි දරුවන් ලබන මව් පියවරුන්ද ඉතා යහපත්ය. දරුවාගේ හැදීම දෙමාපියන්ගේ වගකීමකි.පිංවත් මව්පියෝ දරුවෙක් මව් කුසට එන්නට පෙර මෙවැනි වාසනාවන්ත සත්පුරුෂ බෝසත් ගුණ ඇති දරුවන් ලබන්නට සුදුසු පාරමී ගුණ පුරමින් වාසනාවන්ත දරුවන් ප්‍රාර්ථනා කළ යුතුය. ගුණවත් මව්පියෝ එසේම කරන්නාහ. සත්පුරුෂ දරුවන්ද ජීවිතයේ කුඩා කල පටන් සත්පුරුෂ ගුණ දියුණු කරමින් පරම්පරා නියත චාරිත්‍ර, වාරිත්‍ර, සිරිත්, විරිත් මැනවින් පුරුදු කළ යුතුය. අතීතයෙහි ගුරුවරුද මව්පියන් මෙන් තම තමන්ගේ ගෙවල් වල දරුවන් නවත්වාගෙන තම ශිල්පය ඉගැන්නුවෝ ය. එම ගෙවල්වල කුදු මහත් වැඩ කටයුතුද දරුවා විසින් ගුරුවරයා කෙරෙහි සපයා දුන්හ. එම නිසා භාහිර අධ්‍යාපනය මෙන්ම අධ්‍යාත්මික ගුණයද දරුවාට සපයා දුන්හ. එම නිසා මව්පිය, ගුරු, ශිෂ්‍ය සම්බන්ධතාවය ඉතාමත් හොඳින් පැවතුනාහ. අතීතයෙහි එවැනි දරු පරපුරක පැවැත්ම ඉතාමත් සාර්ථක විය. අද වාර්තාවන ළමා ජීවිතයට එය අඩු පාඩුවක් බව පෙනෙන්නට ඇත. එය මගහරවා ලීමට ගන්නා උත්සහයක් ලෙස මෙම ධර්ම ග්‍රන්ථය සකස් කරන්නට යෙදුන බව මෙයින් සදහන් කරමි. අපවෙත මෙම අදහස් ඉදිරිපත් කළේ යක්කල චන්ද්‍රජෝති මහා විද්‍යාලයේ ආචාර්ය සමීර මහත්මා විසින්ය. පාසල් දරුවන්ගේ ආගමික ආචාර ධර්ම දියුණු කිරීමේ පරමාර්ථයෙනි. එම නිසා එම කටයුත්තට මව්පියන් වන ඔබලාටත්, ආචාර්ය මණ්ඩලයටත්, දයාබර දරු දූරියන්ටත් මෙය මහත් උපකාරයක් වේවා.

## මව්පියන්ගෙන් කුඩා දරුවන්ට ලැබෙන සුතමය ඥාණය

දයාබර මව්පියන් කුඩා කල දරුවන්ට ඇසෙන්නට මේ අම්මා, මේ තාත්තා, මේ අයියා, මේ නැන්ද, මේ මාමා ආදී වශයෙන් කුඩා කල නැදෑකමත් සමග වචනය දරුවාට ඇසෙන්නට කියයි. එම ඇසීම මුල් කරගෙන දරුවාද එම වචනය නැවත නැවත කියයි. නැවත නැවත මව්පියෝ කියන නිසාත් දරුවාද කියන නිසා කථා කිරීම සමග මව්පියන්ද ඥාතීන්ද කුඩා කල හැඳින ගනී. ඥාතීන් හඳුනා ගැනීමේ නුවණ පලමු කොට පහළ වෙයි. මෙය ජීවිතයෙහි යුතුකම් ඉටු කරන නුවණක් බව තේරුම් ගත යුතුය.

## ගුරුවරුන්ගෙන් පාසල් දරුවාට ලැබෙන සුතමය ඥාණය

මව්පියන්ගේ අභ්‍යාසයෙන් පසුව දරුවා පෙර පාසලට යයි. පෙර පාසලේ පටන් යම්තාක් ගුරුවරුන්ගේ වචනය අසා දැනගෙන රටේ සම්භාවනීය සත් පුරුෂයන් බවට පත් වන්නේය. විභාග සමර්ථ කරවලා රැකියාවන් වලට යොමු කරවන්නට වාසනාව උදාකර දෙයි. අනාගත ජීවිතය සෞභාග්‍ය කරා ගෙන යන්නට දරුවාට අවශ්‍ය උපදෙස් මාලාව සකස් කර දෙන්නේ යහපත් සත් පුරුෂ ගුරුවරුන්ය. සත් පුරුෂ ගුරුවරුන් ලබන්නටත් වාසනාව තිබිය යුතුය. මෙලොව ජීවිතයක ආලෝකය ලබා දෙන්නේ දරුවාගේ ගුරුවරුන් සහ අධ්‍යාපනයයි. මෙය ඇසීමේ අවධානය අධ්‍යාපනයේ සුතමයේ ඥාණයයි.

## ලොව්තුරා භාග්‍යවතුන් වහන්සේගෙන් ලැබෙන සුතමය ඥාණය

ලොව්තුරා බුදුරජාණන් වහන්සේගෙන් ලැබෙන සුතමය ඥාණය මුලු සසර පුරාවෙම පවතී. අවසානයේ ලොවින් එතෙර වී නිවන් සුවය අවබෝධ කර ගැනීමට උපකාර වේ. මුලු සසරටම බෝධිසත්ව ළමා කාලය අපට ඉතාමත් අදර්ශයකි. ජීවිතයෙහි ආධ්‍යාත්මික වර්ධනයට ලොව්තුරා ධර්මශ්‍රවණයෙන් ලැබෙන නුවණ දෙලොව ජයගන්නට තිබෙන මාර්ගයයි. දරුවන්ගේ සංවර විනය පිලිබඳ චාරිත්‍ර සීලය, වාරිත්‍ර සීලය, සිරිත්, විරිත් වශයෙන් ජාතික ආගමික වශයෙන් කළයුතු සත්පුරුෂ සාරණීය ධර්මයන් වශයෙන් කරුණාව, දයාව, මෛත්‍රිය, අනුකම්පාව වැනි ගුණ



ධර්මයන් දරුවාගේ මනසට එක්විය යුතුය. දරුවාගේ නිවසින්, පාසලෙන් එය සිදුවිය යුතුය. එය මහත් උපකාරයක් වෙයි. සත්පුරුෂ ආශ්‍රය, ගුණ ගරුක කල්‍යාණ මිත්‍ර, බෝසත් ගුණ ඇති සිව්වනක් පිරිසේ ආශ්‍රය අවශ්‍යයි. සිල්වත් ගුණවත් බොධිසත්ව ගුණෙන් යුත් සත්පුරුෂ වහන්සේලාගේ ඇසුර, ගුණවත් සත්පුරුෂ ගුණ ඇති මව්පියන්ගේ ඇසුර, ගුණවත් සිල් මැණිවරුන්ගේ ඇසුර, සිල්වත් ගුණවත් සත්පුරුෂ උපාසක උපසිකා පිරිසගේ කල්‍යාණ මිත්‍ර ඇසුර, සද්ධර්මය ශ්‍රවනය, සද්ධර්ම සාකච්ඡා, සද්ධර්ම විනිශ්චය, සමගි සමාදාන සාකච්ඡා මහත්සේ උපකාර වේ. උපකාර වේ. සෞඛය ළමා වැඩසටහන් වැඩිහිටියන්ගේ මග පෙන්වීම මත එය පුරුදුකර ගත යුතුය. ළමා ආගමික වැඩසටහන් වලට යෙදවිය යුතුය. සෑම මොහොතකම ළමා ජීවිතයකට ආරක්ෂාව මව්පියන්ගෙන්, ගුරුවරුන්ගෙන්, වැඩිහිටියන්ගෙන් අනිවාර්‍යය විය යුතුය. මෙය සියල්ලටම ලොව්තුරා ධර්මය එකතුවිය යුතුමය. නුවණින් අත්හැරිය යුතු පාප සිතුවිලි, පාප වචන, පාප ක්‍රියා අත් හැරීමට උත්සහ විය යුතුය. යහපත් සිතිවිලි, යහපත් වචන, යහපත් ක්‍රියා පුරුදු විය යුතුය. අසත් පුරුෂ ආශ්‍රය, අසත් පුරුෂ ශ්‍රවනය අත් හැරිය යුතුය. සත් පුරුෂ ආශ්‍රය, සත් පුරුෂ සාරධර්ම ශ්‍රවනය කළ යුතුය. නුවණින් ඇසූ හොද දෙය නැවත නැවත සිහි කිරීම චින්තාමය ප්‍රඥාව ලබන්නට හේතු වේ. හොද දේ සිතීමෙන් ප්‍රඥාව ලැබේ. අලසකම, කම්මැලිකම, උදාසීනකකම, උදේ දවල් වෙන තුරු නිදා ගැනීම, ගෙදර වැඩට කම්මැලි වීම, මව්පියන්ට ගුරුවරුන්ට වැඩිහිටියන්ට අවනත නොවීම, මේ දේ නුවණින් සිතා අත් හැරීමත් නිදුක් වීම, නිරෝගී වීම, සුවපත් වීම, සිහි නුවණ ඇති වීම, හොද දේට ශක්තිය බලය ධෛර්ය යෙදවීම, අලුයම අවදි වී ගෙදර වැඩ වලදී මව්පියන්ට උපකාර වීම, කාර්ය ශූර භාවයෙන් දවසේ වැඩ කටයුතු ආරම්භ කිරීම ආදිය නොපිරිහෙලා සිදුකර ගත යුතුය. අනාගත සාසනික දරු පිරිසක් වශයෙන්, අනාගත හොද ජාතික පරපුරක් වශනේ ගොඩ නැගෙන, සාරධර්ම සිහි නුවණින් අනාගත ජීවිත සැපවත් කරන වාසනා ශක්තිය ඔබ අතේමය බව සිහිපත් කර ගත යුතුය. සියලු දරුවන්ට සුභ අනාගතයක්, සුභ වාසනාවක් උදා වේවා.!

මෙයට සසුන් ලැදි
දස්වත්තේ සුමනසීල ස්ථවිර

# <u>නමස්කාරය</u>

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා**
**සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා**
**සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා**
**සම්බුද්ධස්ස**

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!!!

## <u>නමස්කාර පාඨයේ තේරුම</u>

පලමු කොටම සර්වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර කළේ සාතාගිරි යක්ෂයායි, පසුව රාහු අසු රේන්ද්‍රයා, සතර වරම් දෙවිවරු, සක්‍ර දේවේන්ද්‍රයෝ සහ සහම්පති බ්‍රහම රාජයා නමස්කාර පාඨය සම්පූර්ණ කරමින් නමස්කාර කළහ. භාග්‍යවතුන් වහන්සේ ජය ශ්‍රී මහ බෝ මුලදී සියලු කෙලෙස් නැසූ හෙයින් සාතාගිරි යකෂයා **<u>නමෝ</u>** කියා නමස්කාර කළේය. දීපංකර පාද මූලයේ සිට බෝවැට දක්වාම තෘෂ්ණාව ක්ෂය කරන්නට අනුන්ට වැඩ සැලසීමට අසත්‍ය වචනය හැර සත්‍ය වචනය ප්‍රිය තෙපුල් හා සාර බසින් අනුන්ට වැඩ සැලසූ බුදුරජාණන් වහන්සේට අසු රේන්ද්‍රයා **<u>තස්ස</u>** කියා නමස්කාර කළේය. සතරවරම් දෙවිවරු සතරදෙනා චතුෂ්ඨ අක්ෂයන් කියා **<u>භගවතෝ</u>** කියා නමස්කාර කළේය. සක්දෙවි රජතුමා අනවසාගර සංසාර කුඩුල් සත් මෙන් සොලවා අවිද්‍යා තෘෂ්ණා බෝ මැඩදී විධ්වංසනය කොට අනන්ත අප්‍රමාණ ගුණය දරන්නා වූ භාග්‍යවතුන් වහන්සේට **<u>අරහතෝ</u>** කියා නමස්කාර කළේය. තමන් වහන්සේ විසින්ම ආර්‍යසත්‍ය සතර අවබෝධ කරගත් නිසා සහම්පති බ්‍රහම රාජයා **<u>සම්මා සම්බුද්ධ</u>** කියානමස්කාර කළේය. එම නිසා පිංකමට පලමු සියලු දෙනාම මෙම නමස්කාරය කොට පැවැත්ම චාරිත්‍ර සීලයකි.



# <u>ප්‍රාර්ථනා වාක්‍යය</u>

අවසර ස්වාමීනි,

ඕකාස ඕකාස ඕකාස පළමුවද, දෙවනුවද, තුන්වනුවද බුද්ධ රත්නයට, ධම්ම රත්නයට, සංඝ රත්නයට, රත්නත්‍රයට මවුපිය ගුරු උතුමන් වහන්සේලාට, කායද්වාරයෙන්, වාග්ද්වාරයෙන්, මනොද්වාරයෙන්, ද්වාරත්‍රයෙන්, දොහොත් මුදුනේ තබා ආදරයෙන් ගෞරවයෙන් භක්තියෙන් ප්‍රේමයෙන් චිත්තප්‍රසාදයෙන් නිහතමානීව වැඳ නමස්කාර කරමි. නමස්කාර වේවා.

මෙසේ ආදරයෙන්, ගෞරවයෙන්, භක්තියෙන්, ප්‍රේමයෙන්, චිත්තප්‍රසාදයෙන්, නිහතමානීව, වැඳ නමස්කාර කිරීමේ කුසල චේතනාවේ ආනුභාවයෙන් සසර සැරිසරනාතුරා නරකාදී සතර අපායෝත්පත්තියෙන් ද, ත්‍රිවිධසත්ව විනාශයෙන් ද, අෂ්ඨ දුෂ්ඨක්ෂණයෙන් ද, පඤ්චවිධ අන්තරාවෙන් ද සම්පූර්ණ යෙන්ම සදහටම අත මිදෙම්වා.

ස්වාමීනි, අන්තිම ආත්ම භාවයේදී මර්ගඵල නිර්වාණ ධර්මය සුවසේ අවබෝධ වේවා.!

## ප්‍රාර්ථනා වාක්‍යයේ ගැටළු තැන්

1.මෙහි ප්‍රේමයෙන් යනු
හිතෛෂී බව නම් වූ මෛත්‍රිය බව දත යුතුය

2.සතර අපාය
නරකය, තිරිසන් අපාය, ප්‍රේත අපාය, අසුර අපාය

3.ත්‍රිවිධ සත්ත්ව විනාශය
මනුලොව පරමායුෂ දස වර්ෂ වන කාලයේදී (දුර්භික්ෂයෙන්, ආයුධයෙන් හා රෝගයෙන්) සිදුවන සත්ත්ව විනාශ තුනයි.

4.අෂ්ට දුෂ්ඨක්ෂණය

එකසිය සතියක් වූ නරකය (136)
තිරසන් අපාය
ප්‍රේත හා අසුර අපාය
අරූපතලය හා අසඤ්ඤතලය
පිටසක්වල
ඉන්ද්‍රිය විකල භාවය (අඳ,ගොළුබිහිරි ආදිය)
නියත මිථ්‍යා දෘෂ්ටිය
අබුද්ධොත්පාදය

පඤ්චවිධ අන්තරාය

1. කර්මාන්තරාය - පඤ්චානන්තරිය කර්මය
2. ක්ලේශාන්තරාය - නියත මිසදිටු බව
3. විපාකාන්තරාය - අහේතුක, ද්විහේතුක ප්‍රතිසන්ධි ගැනීම
4. උපාවාදාන්තරාය - බුද්ධාදි ආර්‍යයන්ට ගර්හාකිරීම
5. ආණාවීතික්කමනාන්තරාය - සිල්පද බිඳ ගැනීම

## සිල් සමාදන් වීම

**සිල් ඉල්ලීම :**

ඕකාස අහං භනෙත තිසරණෙන සද්ධිං (ආජීව අට්ඨමක සීලං, උපොසථ අට්ඨමකසීලං, ගහට්ඨ දස සීලං) ධම්මං යාචාමි. අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භනෙත.

දුතියම්පි ඕකාස අහං භනෙත තිසරණෙන සද්ධිං (ආජීව අට්ඨමක සීලං, උපොසථ අට්ඨමගසීලං, ගහට්ඨ දස සීලං) ධම්මං යාචාමි. අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භනෙත.

තතියම්පි ඕකාස අහං භනෙත තිසරණෙන සද්ධිං (ආජීව අට්ඨමක සීලං, උපොසථ අට්ඨමගසීලං, ගහට්ඨ දස සීලං) ධම්මං යාචාමි. අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භනෙත අනුකම්පං උපාදාය.



දේශක : යමහං වදාමි තං වදෙථ
ශ්‍රාවක : ආම භනේත

### සරණාගමණය

බුද්ධං සරණං ගච්ඡාමි.
ධම්මං සරණං ගච්ඡාමි.
සංඝං සරණං ගච්ඡාමි.

දුතියම්පි, බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි, ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි, සංඝං සරණං ගච්ඡාමි

තතියම්පි, බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි, ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි, සංඝං සරණං ගච්ඡාමි

### පංච සීලය

**1.පාණාතිපාතා වේරමණී සිකඛා පදං සමාදියාමි.**
ප්‍රාණඝාතයෙන් හෙවත් සතුන් මැරීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

**2.අදින්නාදානා වේරමණී සික්ඛා පදං සමාදියාමි.**
අදින්නාදානයෙන් හෙවත් අනුන් සතු ඔවුන් කැමැත්තෙන් නොදුන් දෙය සොර සිතින් ගැනීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

**3.කාමෙසුමිච්ඡා චාරා වේරමණී සික්ඛා පදං සමාදියාමි**
කාම මිථ්‍යාචාරයෙන් හෙවත් කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන්වෙමි.

**4.මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි.**
මුසාවාදයෙන් හෙවත් දැන දැන බොරුකීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

**5.සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි.**
සුරාපානයෙන් හෙවත් මත්වීම හා සිහි මුලාවීමට කාරණා වූ මද්‍යපානයෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

## උපෝසථ අෂ්ඨාංග සීලය

**1.පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි.**
ප්‍රාණඝාතයෙන් හෙවත් සතුන් මැරීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

**2.අදින්නාදානා වේරමණී සික්ඛා පදං සමාදියාමි.**
අදින්නාදානයෙන් හෙවත් අනුන් සතු, ඔවුන් කැමැත්තෙන් නොදුන් දෙය සොර සිතින් ගැනීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

**3.අබ්‍රහ්ම චරියා වේරමණී සික්ඛා පදං සමාදියාමි**
අබ්‍රහ්ම චරියාවෙන් හෙවත් ඉන්ද්‍රිය බද්ධ කාම සේවනයෙන් වැළකීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

**4.මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි**
මුසාවාදයෙන් හෙවත් දැන දැන බොරුකීමෙන් වැළකීමේ ශික්ෂපදය සමාදන් වෙමි.

**5.සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි.**
සුරාපානයෙන් හෙවත් මත්වීම හා සිහි මුලාවීමට කාරණා වූ මද්‍යපානයෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

**6.විකාල භෝජනා වේරමණී සික්ඛා පදං සමාදියාමි**
විකාල භෝජනයෙන් හෙවත් ඉර අවර වූ තැන් පටන් ආහාර ගැනීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

**7.නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩණ විභූස නට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි.**
නැටුම්, ගී කීම්, වාදනය කිරීම්, විසුලු දැක්වීම්, මල්ගඳ විලවුන් දැරීම,



ඇඟ සැරසීම, අඩු තැන් පිරවීම, යනාදිය තමන් කිරීමෙන් හා තමන් උදෙසා අනුන් ලවා කරවීමෙන්ද, අනුන්ලවා කරවා ගැනීමෙන්ද වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

**8.උච්චා සයන මහා සයනා වේරමණී සික්ඛා පදං සමාදියාමි.**
පමණට වඩා උස්වූද, අකැප ඇතිරිළි සහිත වූද, උසසුන් හා මහසුන් සේවනයෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

### ශික්ෂා පදය

**දේශක**
තිසරණේන සද්ධිං උපෝසථ අට්ඨංග සීලං ධම්මය සාධුකං සුරක්ඛිතං කත්වා අප්පමාදේන සම්පාදෙතබ්බං
තිසරණ සහිත උපෝසථ අට්ඨාංග සීල ධර්මය මනාව සුරක්ෂිත කොට සිහිනුවණින් දියුණු කළ මැනවි.

**ශ්‍රාවක**
ආම භන්තේ
''එසේය, ස්වාමීන් වහන්ස.''

# ආහාර ප්‍රත්‍යවේක්ෂාව

## පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාව (ගිහි අයට අහාර ප්‍රත්‍යවේක්ෂාව)

පටිසංඛා යෝනිසො පිණ්ඩපාතං පටිසෙවාමි නෙව දවාය න මදාය න මණ්ඩනාය, න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්ම චරියා නුග්ගහාය ඉති පුරාණංච වෙදනං පටිහංඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි යාත්‍රාච මෙ භවිස්සති අනවජ්ජතාච ඵාසුවිහාරොචති.

**තේරුම**

මම සිහි නුවණින් යුත්තව පිණ්ඩපාතය වැළඳිය යුතුය (වලඳමි) (ගිහි අයට සිහිනුවණ සලකා ආහාරය පරිහරණය කිරීම) කුමක් පිණිසද, ගම් දරුවන් මෙන් ක්‍රීඩා පිණිස නොවේය. මල්ලවයන් මෙන් පොරබැදීම පිණිසනොවේය. මද වැඩීම පිණිසද නොවේය. අඟ පසඟ පිණවීම පිණිස නොවේය. වර්ණය පිණිස නොවේය. ජීවිතයෙහි පැවැත්ම පිණිස වන්නේය,ජීවිතය යැපීම පිණිස වන්නේය, කුසගිනි නිවීම පිණිස වන්නේය. ශාසන බ්‍රහ්ම චරියාවට අනුග්‍රහ පිණිස වන්නේය. පැරණි බඩගිනි වේදනා නැසීම පිණිස වන්නේය. අලුත් බඩගිනි වේදනා නූපදවීම පිණිස වන්නේය. ජීවිතය බොහෝ කල්පැවැත්ම පිණිස වන්නේය. ජීවිතය නිවැරදි බවට පත්වන්නේය. ජීවිතයට පහසු විහරණය පිණිස වන්නේය.

**පිණඩපාතය ධාතුවශයෙන්, පටික්කුල වශයෙන්**

යථා පච්චයං පවත්තමානං ධාතුමත්ත මෙවෙතං යදිදං පිණඩපාතො තදුපභුඤ්ජකොච පුග්ගලො ධාතුමත්තකො, නිස්සත්තො, නිජ්ජීවො සුඤ්ඤෙ සබ්බෙපනායං පිණ්ඩපාතො අජිගුච්ඡනීයො ඉමං පූතිකායං පත්‍වා අතිවිය ජිගුච්ඡනීයො ජායති.

යම් ප්‍රයෝජනය පිණිස පවත්නාවූ ඒ සියලුම පිණ්ඩපාතය (ආහාරය) ඒකාන්තයෙන් ධාතුමාත්‍රයකි. එය පරිභෝජනය කරන පුද්ගලයාද, නිස්සත්‍ව වූ, නිජ්ජීවවූ, ශූන්‍යවූ, ධාතුමාත්‍රයකි, මුලදී ප්‍රණිතවූද මේ පිරිසිදු පිණ්ඩපාතය (ආහාරය) දෙතිස් කුණපයකින් යුත්ත වූ මේ කය සමග එකතුවී මෙන් අතිශයින්ම පිළිකුල් බවට පත්වන්නේය.



අතීත ප්‍රත්‍යවේක්ෂාව

පිණ්ඩපාතය ගැනීම (ආහාරය ගැනීම) නුවණින් සිහි නොකලානම් ප්‍රත්‍යවේක්ෂා නොකළානම් අතීත වශයෙන් සිහිකළ යුතුය (මයා පච්ච වෙක්ඛිත්‍වා) නැවත මුලට යොදා නැවත ප්‍රත්‍යවේක්ෂා කළ යුතුය.

# බුද්ධ පූජාව හා වන්දනාව

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!!!

**ආරාධනාව**

**යාවතා භගවා ලෝකේ - තිට්ඨෙය්‍ය තව සාසනං**
**තාවතා පතිගණ්හාතු - පූජා ලෝකානු කම්පයා.**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, යම්තාක් ඔබ වහන්සේගේ ශාසනය ලොව පවතීද, ඒ තාක් ලෝකානුකම්පාවෙන් සියලු පූජාවන් පිළිගන්නා සේක්වා!

**පහන් පූජාව**

**ඝනඩ තේලප්ප දිත්තේන - දීපේන තම ධංසිනා**
**තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමි තමෝ නුදං**

සුවඳ තෙලෙන් දැල්වූ අඳුර දුරලන්නා වූ මේ පහනින් තුන් ලොවට පහනක් වූ මෝහාන්ධකාරය දුරලූ සම්මා සම් බුදුරජාණන් වහන්සේට මම මේ පහනින් පුදමි. පූජාවේවා !

**තිලෝක මහිතං සම්බුද්ධං - දීපෙන පූජයාමහං**
**තේන ධම්මේන සංසා - චක්ඛු සුජ්ජසු සබ්පදා**

තුන්ලෝක වාසීන් විසින් පුදන ලද සම්මා සම්බුදුරජාණන් වහන්සේට මම පහන් ආලෝකයෙන් පූජා කරමි. ඒ පහන් පූජාවේ කුසලානිසංසයෙන් සසරේදී ප්‍රඥා චක්‍ෂු සම්පත්තිය මනාකොට පහළ වේවා!

**වෙනෙය්‍ය හදයේ මෝහ - තමෝක්ඛන්ධ විනෝදකං**
**දීපේනේතේන පූජෙමි - පඤ්ඤා දීප ධරං ජිනං**

වෙනෙය්‍ය ජනයාගේ හදවතෙහි ඇත්තාවූ මෝහ නැමැති අන්ධකාරය දුරුකළාවූ ප්‍රඥා නැමැති ආලෝකය දරන්නා වූ පස්මරුන් දිනූ ජිනේන්ද්‍රයන් වහන්සේට මම මේ පහන් ආලෝකයෙන් පූජා කරමි. පූජා වේවා!

**ඉමිනා පුඤ්ඤ කම්මේන - පඤ්ඤවා සීලවා සදා**
**හවිස්සාහං ලහෙ සීඝං - ධම්ම චක්ඛුං අනුත්තරං**

මේ සිදු කර ගන්නා ලද පුණ්‍ය කර්මයෙන්
මම සැම කල්හිම සීලවන්තයෙක් වී,
ප්‍රඥාවන්තයෙක් වී අනුත්තරවූ ධර්ම චක්‍ෂුව
ලබන්නෙමි. ලබන්නෙම්වා !

### විදුලි ආලෝක පූජාව

**විජ්ජුල්ලතා පදිත්තේන - දීපෙන තම ධංසිනා**
**තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමී තමෝනුදං**

විදුලි ආලෝකයෙන් දැල්වූ, අඳුර දුරු කරන්නාවූ මේ විදුලි පහනින් තුන් ලොවට පහනක් වූ මෝහාන්ධකාරය දුර ලූ සම්මා සම්බුදු, රජාණන් වහන්සේට මම මේ පහන් පූජා කරමි. පූජා වේවා!

### සුවඳ දුම් පූජාව

**සුගන්ධිකාය වදනං - අනන්ත ගුණ ගන්ධිනං**
**සුගන්ධිනාහං ගන්ධේන - පූජයාමී තථාගතං**



සුවඳවත් මුව පියුමක් ඇත්තාවූ අනන්ත ගුණ සුවඳින් සුවඳවත්වූ තථාගත බුදුරජාණන් වහන්සේට මම මේ සුවඳින් පූජා කරමි. පූජා වේවා!

### කපුරු පූජාව

**සණ සාරප්ප දිත්තෙන - දීපේන තම ධංසිනා**
**තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමී තමෝනුදං**

මේ ප්‍රදීපආලෝකයෙන් කෙලෙස් අඳුර දුරුකළාවූ මේ පහනින් තුන්ලොවට පහනක් වූ මෝහාන්ධකාරය දුරලූ සම්මා සම්බුදු රජාණන් වහන්සේට මම කපුරු ඉටිපන්දම් ආලෝක පූජාවෙන් පූජා කරමි. පූජා වේවා!

### සිසිල් පැන් පූජාව

**සුගන්ධං සීතලං කප්පං - පසන්න මධුරං සුහං**
**පානීය මේතං හගවා - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' සුවඳවත් වූ සිසිල් වූ කැප වූ පහන් වූ මිහිරි වූ පිවිතුරු වූ උතුම් වූ මේ පැන් උත්තමයන් වහන්ස පිළිගන්නා සේක්වා !

**අනන්ත ඤාණොවිමලො-දක්ඛිණෙය්‍යො ගුණාකරො**
**පතිගණ්හාතු හගවා - දක්ඛිණොදක මුත්තමං**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' නිර්මල පිරිසිදු අනන්ත ඥාණයෙන් යුක්ත වූ දක්ෂිණාවට ගුණ ආකරයක් වූ භාග්‍යවතුන් වහන්ස උතුම් වූ මේ දක්ෂිණෝදකය පිළිගන්නා සේක්වා!

### උණු පැන් පූජාව

**අධිවාසේතු නො හන්තේ - උණෝදකං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන

සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ උණු පැන් අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

**කිරි ආහාර පූජාව**

**අධිවාසේතු නො හන්තේ - පායාසං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ ක්ෂීරපායාසය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

**කැඳ පූජාව**

**අධිවාසේතු නො හන්තේ - තරලං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ කැඳ ආහාරය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

**ආහාර පූජාව**

**අධිවාසේතු නො හන්තේ - භෝජනං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ ආහාර දානය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

**ව්‍යඤ්ජන පූජාව**

**අධිවාසේතු නො හන්තේ -ව්‍යඤ්ජනං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**



''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ ව්‍යඤ්ජන ආහාරය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

**කැවිලි පූජාව**

**අධිවාසේතු නො හන්තේ - ඛජ්ජකං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ රස කැවිලි ආහාරය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

**පලතුරු පූජාව**

**අධිවාසේතු නො හන්තේ - පලා ඵලං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ පලතුරු අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

**තැඹිලි පැන් පූජාව**

**අධිවාසේතු නො හන්තේ - සංනීරං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ තැඹිලි පැන් අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

**කිරි ගිලන්පස පූජාව**

**අධිවාසේතු නොහන්තේ-ඛීර පානං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ කිරි ගිලන්පස අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

### කිරිපැණි පූජාව

**අධිවාසේතු නො භන්තේ-දධි ඵාණිතං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ කිරි පැණි අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

### දැහැත් පූජාව

**නාගවල්ලී දලූපේතං - චුණ්ණ පූග සමායුතං**
**තාම්බූලං පතිගණ්හාතු - සකප්පූර මිදං ජිනො**

බුලත්, හුණු, පුවක් වලින් යුක්ත වූ කපුරු සහිත මේ බුලත් ජිනේන්ද්‍රයන් වහන්සේ පිළිගන්නා සේක්වා!

### වැළඳීමට ආරාධනාව

**නිවේදයාමි සම්බුද්ධං - වීතරාගං මහාමුනිං**
**නිමන්තයාමී සුගතං - ලෝක ජෙට්ඨං නරාසභං**

වීතරාගී වූ ලෝකයට ජ්‍යෙෂ්ඨ වූ සත්වයන්ට ශ්‍රේෂ්ඨ වූ සෝභන ගමන් ඇත්තා වූ මහා මුනීන්ද්‍ර වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේට දන්වමී ආරාධනා කරමි.

### මල් පූජාව

**වණ්ණ ගන්ධ ගුණෝපේතං - ඒතං කුසුම සන්තතිං**
**පූජයාමි මුනින්දස්ස - සිරිපාද සරෝරුහෙ**



මනා වර්ණයෙන් හා සුගන්ධයෙන් යුත් මේ මල් සමූහයෙන් මුනීන්ද්‍රයන් වහන්සේගේ ශ්‍රී පාද පද්මයෙහි පූජා කරමි. පූජා වේවා!

**පූජේමි බුද්ධං කුසුමේන නේන**
**පුඤ්ඤේන මෙතේන ලභාමි මොක්ඛං**
**පුප්ඵං මිලායාති යථා ඉදම්මෙ**
**කායෝ තථා යාති විනාසභාවං**

මම මේ මලින් බුදුරජාණන් වහන්සේ පුදන්නෙමි. මේ පිනෙන් නිවන් ලබම්වා. මේ මල මැලවෙන්නාසේ මාගේ සිරුරද විනාශයට පත්වන්නේය.

### ගිලන්පස පූජාව

**අධිවාසේතු නො භන්තේ - පානකං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ සිසිල් ගිලන්පස පානය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

### අෂ්ඨපාන ගිලන්පස පූජාව

**අධිවාසේතු නො භන්තේ -අට්ඨපානං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ අෂ්ඨපාන ගිලන්පස අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

### චතුමධුර පූජාව

**අධිවාසේතු නො භන්තේ - චතුමධුරං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන

සේක්වා! උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ ප්‍රණීත චතුමධුර ආහාරය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

### බෙහෙත් පූජාව

**අධිවාසේතු නො භන්තේ - භේසජ්ජං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ බෙහෙත් ඖෂධ අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

### අටපිරිකර පූජාව

**අධිවාසේතු නොභන්තේ - අට්ඨපරික්ඛාරං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ අටපිරිකර අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

### සෙසු පිරිකර පූජාව

**අධිවාසේතු නොභන්තේ- සේස පරික්ඛාරං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සෙසුපිරිකර අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

### විලඳ පූජාව

**අධිවාසේතු නොභන්තේ-ලාජා පුප්ඵං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**



''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා, උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ විලඳ අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

### කොඩි පූජාව

**ධම්මද්ධජ ධරං ධීරං - ධජුග්ගත මහායසං**
**ධජේනේතෙන පූජේමි - ධම්ම රාජං ධජූපමං**

ධර්මය නැමති ධජය දරන්නා වූ මහ යසස් නැමති ධජයෙන් නැගී ගියාවූ ධීර වූ ධජයක් (කොඩියක්) බඳු වූ ධර්ම රාජයාණන් වහන්සේට උස් වූ කොඩියෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු !සාධු!! සාධු!!!

## <u>බෝධි පූජාව හා වන්දනාව</u>

### බෝධි පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**වන්දාමි බෝධි රාජානං - නිබ්බාන සුඛ සිද්ධියා**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජයශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට මම නිවන් සුවය අවබෝධ වීම පිණිස වන්දනා කරමි. නමස්කාර කරමි. නමස්කාර වේවා!

### පහන් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජේමි බෝධි රාජානං - දීපා ලෝකේන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන්

වහන්සේට මේ පහන් ආලෝකයෙන් සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

## විදුලි බුබුලු පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - විජ්ජුදීපේන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ විදුලි බුබුළු පහන් ආලෝකයෙන් පූජා කරමි. පූජා වේවා!

## සුවඳ දුම් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - ගන්ධ ධූපේන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ සුගන්ධ ධූපයෙන් පූජා කරමි. පූජා වේවා!

## සුවඳ මල් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - ගන්ධ පුප්ඵේන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ වර්ණගන්ධ සම්පන්න මල් සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!



## සිසිල් පැන් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - සීතොදකේන සාදරං**
ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ ප්‍රණීත සිසිල් පැන් සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## ගිලන්පස පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - පානකේන්නේන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ ප්‍රණීත ගිලන්පස සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## අෂ්ඨපාන පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - අට්ඨපානේන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ ප්‍රණීත අෂ්ඨපාන ගිලන්පස සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## චතුමධුර පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජේමි බෝධි රාජානං - චතුමධුරේන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට

පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ චතු මධුර (ප්‍රණීත ගිලන්පස) සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## දැහැත් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජේමි බෝධි රාජානං - තාම්බූලේන සාදරං**
ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ දැහැත් සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## බෙහෙත් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජේමි බෝධි රාජානං - ඔසධේනෙන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ බෙහෙත් සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## සුවඳ පැන් පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - ගන්ධොදකේන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ සුවඳ පැන් අභිෂේකයෙන් පූජා කරමි. පූජා වේවා!



## මල්දම් පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - මාලාදාමේන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ විසිතුරු මල්දම් සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## කොඩි පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - ධජෙනේතේන සාදරං**
ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ විසිතුරු කොඩි සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## විලඳ පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - ලාජා පුප්ඵේන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ විළඳ සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## අට පිරිකර පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - අට්ඨ පරික්ඛාරේන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන්

වහන්සේට සාදර ගෞරවයෙන් මේ අෂ්ඨපරිෂ්කාර සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## සෙසු පිරිකර පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - සේස පරික්ඛාරේන සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ සෙසු පිරිකර සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු!! සාධු!!!

## ප්‍රතිපත්ති පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - පටිපත්තියාභි සාදරං**

ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධින්වහන්සේට සාදර ගෞරවයෙන් මේ ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු!! සාධු!!!

# තුනුරුවන් වන්දනාව

**ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො**
**විජ්ජා චරණ සම්පන්නො සුගතො**
**ලෝකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථී**
**සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' ඔබවහන්සේ සියලු පූජාවන්ට



සුදුසුවූ හෙයින් අරහං ගුණයෙන්ද, චතුරාර්ය සත්‍ය තමන්ම අවබෝධ කළ හෙයින් සම්මා සම්බුද්ධ ගුණයෙන්ද, ත්‍රිවිද්‍යා, අෂ්ඨ විද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුතු හෙයින් විජ්ජාචරණ ගුණයෙන්ද, මනාගති පැවැත්මෙන් නිවනට පැමිණිහෙයින් සුගත ගුණයෙන්ද, සියලු ලෝක ධාතු දන වදාළ හෙයින් ලෝකවිදූ ගුණයෙන්ද, දමනයට සුදුසු සත්ත්වයන් උත්තරීතර ගුණයෙන් දමනය කළ හෙයින් අනුත්තර පුරිසදම්ම සාරථී ගුණයෙන්ද, දෙව් මිනිසුන් සසර කතරින් එතෙර කරවන හෙයින් සත්ථා දේවමනුස්සානං ගුණයෙන්ද, චතුරාර්ය සත්‍ය අවබෝධ කොට අන්‍යන්ටත් අවබෝධ කරවූ හෙයින් බුද්ධ ගුණයෙන්ද, සියලු පුණ්‍ය භාග්‍යන්ගෙන් යුතු බැවින් භගවා ගුණයෙන්ද, සමන්නාගත වනසේක.

**බුද්ධං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි**
**බුද්ධ රත්නය දිවිහිමියෙන් සරණයමි.**

**යේච බුද්ධා අතීතා ච - යේච බුද්ධා අනාගතා**
**පච්චුප්පන්නා ච යේ බුද්ධා - අහං වන්දාමි සබ්බදා**

අතීත බුද්ධ රත්නයටද, අනාගත බුද්ධ රත්නයටද, වර්තමාන බුද්ධ රත්නයටද, මම සැම කල්හි නමස්කාර කරමි මාගේ නමස්කාරය වේවා!

**නත්ථි මේ සරණං අඤ්ඤං - බුද්ධෝ මේසරණං වරං**
**ඒතේන සච්ච වජ්ජේන - හෝතු මේ ජයමඞ්ගලං**

බුද්ධ රත්නය හැර මට අන් සරණක් නැත්තේය. බුද්ධ රත්නය මාගේ උත්තම රත්නය වන්නේය. මේ සත්‍යානුභාවයෙන් මා හට ජය මංගල්‍යයක් වේවා!

**උත්තමංගේන වන්දේහං - පාදපංසුවරුත්තමං**
**බුද්ධේ යෝ ඛලිතො දෝසො - බුද්ධෝ ඛමතු තං මමං**

භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා පහස ලද දූවිල්ලද, මම හිස මුදුනින් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා ! බුද්ධ රත්නය

කෙරෙහි මා අතින් සිදුවූ සියලු වරදට භාග්‍යවතුන් වහන්සේ සමාවන සේක්වා!

සාධු !සාධු !!සාධු!!!

**ස්වාක්ඛාතො, භගවතා ධම්මො**
**සන්දිට්ඨිකො, අකාලිකො,**
**ඒහිපස්සිකො, ඕපනයිකො,**
**පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහීති**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේගේ ශ්‍රී සද්ධර්ම රත්නය මුල, මැද, අග යහපත් බැවින් ස්වාක්ඛාත ගුණයෙන්ද, මෙලොව මේ ජීවිතයේදීම ඵලවිපාක ලබාදෙන හෙයින් සන්දිට්ඨික ගුණයෙන්ද, කල්නොයවා ඵල විපාක ගෙන දෙන හෙයින් අකාලික ගුණයෙන්ද, මෙහි එව බලවැයි කියහැකි ඒහිපස්සික ගුණයෙන්ද, මගඵල ධර්මය සිතෙහි පහළ කරගත යුතු හෙයින් ඕපනයික ගුණයෙන්ද, නුවණැත්තන් විසින් අවබෝධ කළ යුතු හෙයින් පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී ගුණයෙන්ද සමන්නාගත වන සේක.

**ධම්මං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි**
**ධර්ම රත්නය දිවිහිමියෙන් සරණ යමි.**

**යේච ධම්මා අතීතා ච - යේච ධම්මා අනාගතා**
**පච්චුප්පන්නා ච යේ ධම්මා - අහං වන්දාමි සබ්බදා**

අතීත වූ ධර්ම රත්නයටද, අනාගත වූ ධර්ම රත්නයටද, වර්තමාන ධර්ම රත්නයටද, මම සැම කල්හි නමස්කාර කරමි මාගේ නමස්කාරය වේවා!

**නත්ථි මේ සරණං අඤ්ඤං - ධම්මෝ මේ සරණං වරං**
**ඒතේන සච්ච වජ්ජේන - හෝතු මේ ජයමඞ්ගලං**



ධර්මරත්නය හැර මට අන් සරණක් නැත්තේය. ධර්මරත්නය මාගේ උතුම් සරණය වන්නේය. මේ සත්‍යානුභාවයෙන් මා හට ජය මංගල්‍යයක් වේවා!

**උත්තමංගේන වන්දේහං - ධම්මඤ්ච තිවිධං වරං**
**ධම්මේ යෝ ඛලිතෝ දෝසෝ - ධම්මෝ ඛමතු තං මමං**

ලොව්තුරු, මගඵල, නිවන්, නැමැති ත්‍රිවිධ වූ, ධර්මරත්නයට දොහොත් මුදුන් දී මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා. ධර්ම රත්නය කෙරෙහි සිදුවූ පමා වරදට ධර්ම රත්නය මට සමාවන සේක්වා!

සාධු !සාධු !!සාධු!!!

**සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ**
**උජුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ**
**ඤායපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ**
**සාමීචිපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ**
**යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨපුරිස පුග්ගලා**
**ඒස භගවතෝ සාවකසංඝෝ**
**ආහුනෙය්‍යෝ පාහුනෙය්‍යෝ දක්ඛිණෙය්‍යෝ**
**අඤ්ජලිකරණීයෝ අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං**
**ලෝකස්සාති**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේගේ ශ්‍රාවක සංඝරත්නය මනාව පිළිපන් හෙයින් සුපටිපන්න ගුණයෙන්ද,ඍජු මාර්ගයට පිළිපන් හෙයින් උජුපටිපන්න ගුණයෙන්ද, නිවන් මගට පිළිපන් හෙයින් ඤායපටිපන්න ගුණයෙන්ද, ගෞරව කළ යුතු මාර්ගයට පිළිපන් හෙයින් සාමීචිපටිපන්න ගුණයෙන්ද, යොදුන් සිය දහස් ගණනකින් වුවත් පැමිණ සිව්පස පිළිගැන්වීමට සුදුසු වූ හෙයින් ආහුණෙය්‍ය ගුණයෙන්ද, ආගන්තුක සත්කාරයන්ට සුදුසු වූ හෙයින් අඤ්ජලිකරණීය ගුණයෙන්ද, මෙලොව පරලොව පින්ඵල අදහා දෙන දානයට සුදුසු වූ හෙයින් දක්ඛිණෙය්‍ය ගුණයෙන්ද, දොහොත් මුදුන් දී වැඳ නමස්කාර කිරීමට සුදුසු වූ හෙයින් අඤ්ජලිකරණීය ගුණයෙන්ද, සියලු ලෝකවාසීන්ට කුසල් වැපිරීමට පින්ඵල නෙළාගැනීමට උතුම් පිංකෙත වූ හෙයින් අනුත්තර

පුඤ්ඤක්ඛෙත්තං ගුණයෙන්ද සමන්නාගත වන සේක.

**සංඝං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි**
**සංඝ රත්නය දිවිහිමියෙන් සරණ යමි.**

**යේච සංඝා අතීතා ච - යේච සංඝා අනාගතා**
**පච්චුප්පන්නා ච යේ සංඝා - අහං වන්දාමි සබ්බදා**

අතීත සංඝ රත්නයටද, අනාගත සංඝ රත්නයටද, වර්තමාන සංඝ රත්නයටද, මම සෑම කල්හි නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**නත්ථි මේ සරණං අඤ්ඤං - සංඝෝ මේ සරණං වරං**
**ඒතේන සච්ච වජ්ජේන - හෝතු මේ ජයමඞ්ගලං**

සංඝරත්නය හැර මා හට අන් සරණක් නැත්තේය. සංඝරත්නය මාගේ උතුම් සරණය වන්නේය. මේ සත්‍යානුභාවයෙන් මා හට ජය මංගල්‍යයක් වේවා!

**උත්තමංගේන වන්දේහං - සංඝං ච තිවිධෝත්තමං**
**සංඝේ යෝ ඛලිතෝ දෝසෝ - සංඝෝ ඛමතු තං මමං**

සම්මුති, සේඛ, අසේඛ යන ත්‍රිවිධ වූ උත්තම සංඝරත්නයට මම උත්තමාංගයෙන් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා. මහා සංඝරත්නය කෙරෙහි මාගෙන් සිදුවූ පමා වරදට මහා සංඝරත්නය මට සමාවන සේක්වා!

සාධු !සාධු !!සාධු!!!



## බෝධි වන්දනාව

**යස්ස මූලේ නිසින්නෝව - සබ්බාරි විජයං අකා**
**පත්තෝ සබ්බඤ්ඤුතං සත්ථා - වන්දේ තං බෝධිපාදපං**

යම් බෝධි මූලයක වැඩ සිටියාවූ ජිනේන්ද්‍රයන් වහන්සේ කෙලෙස් සතුරන් නසා දිනූ සේක්ද, ශාස්තෘන් වහන්සේ සර්වඥබවට පත් වූයේ යම් බෝධි මූලයක සිටද ඒ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.!

**ඉමේ එතේ මහා බෝධි - ලෝක නාතේන පූජිතා**
**අහංපි තෙ නමස්සාමි - බෝධිරාජා නමත්ථු තෙ**

මේ බෝධීන් වහන්සේ ලෝකනාථයන් වහන්සේ විසින්ද පූජාලත් සේක. මමද ඒ මේ බෝධිරාජයාණන් වහන්සේට නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

පඨමං බෝධිපල්ලංකං - දුතියං ච අනිමිමිසං
තතියං චංකමණං සෙට්ඨං - චතුත්ථං රතනාඝරං
පඤ්චමං අජපාලං ච - මුචලින්දෙන ඡට්ඨමං
සත්තමං රාජායතනං - වන්දෙ තං මුනිසේවිතං

පළමුව බෝරුකමුලද, දෙවනුව අනිමිස සෑයද, තෙවනුව රුවන් සක්මනද, සිව්වැනි රුවන් ගෙයද, පස්වැනි අජපල් රුකමුලද, සයවැනි මුචලින්ද සෑයද, සත්වෙනි රාජායතනයද යන මුනීන්ද්‍රයන් වහන්සේ සේවනය කළ ඒ සත්සති සෑයන්ට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**මහා කරුණා රස පතිමණ්ඩිතස්ස අනන්ත ඤාණස්ස අසාධාරණ පඤ්ඤස්ස දස පාරමිතා බල සමුදිතස්ස දසබලසමන්නාගතස්ස අපරිමෙය්‍ය ගුණ සාගරස්ස අම්හාකං සත්ථුනො සරස රංසිජාලපරිකිණ්ණං සම්මා සම්බුද්ධ පූජිතං සිරි බෝධි රාජං සිරසා නමාමි**

මහා කරුණා රස ප්‍රතිමණ්ඩිත වූ අනන්ත ඤාණ ඇත්තාවූ, අසාධාරණ ප්‍රඥා ඇත්තාවූ, දස පාරමිතා බලයෙන් පහළවූ, දසබල ඤාණයෙන් සමන්විත වූ, අපරිමාණ ගුණ සාගරවූ, අප ශාස්තෲන් වහන්සේගේ සවනක් ගණ රැස් දහරින් ගැවසී ගත්තාවූ, සම්බුද්ධ පූජිත වූ, ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට දොහොත් මුදුන් දී මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

**ඉන්ද නීල වණ්ණ පත්ත - සේතඛන්ධ භාසුරං**
**සත්‍යු නෙත්ත පංකජාභි - පූජිතග්ග සාතදං**
**අග්ග බෝධි නාමවාම - දේවරුක්ඛ සන්නිභං**
**තං විසාල බෝධිපාද - පං නමාමි සබ්බදා**

ඉන්ද්‍ර නීල වර්ණයෙන් බබළන පත්‍ර ඇති සුදු බෝ කඳින් බබලන්නාවූ , නේත්‍ර සඟලින් බුදුරැස් කවන්නාවූ, පූජනීය වස්තු අතර අග්‍රවූ, මිහිරි සුව ගෙනදෙන්නා වූ අග්‍රවූ දිව්‍ය වෘක්ෂයක් මෙන් බබළන්නා වූ බෝධිය නමින් ප්‍රකට වූ ඒ විශාල බෝධි වෘක්ෂයන් වහන්සේට මම සැමකල්හි පූජා පවත්වමි. මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

## පංචසීල ආනිසංස

1. සතුන් මැරීමෙන් වැළකීමේ ආනිසංස
    1. අංග සම්පූර්ණ වූ අඟපසඟ ඇතිබව
    2. ආරෝග්‍ය සම්පන්න බව
    3. ජව සම්පන්න ඇතිබව
    4. මනාකොට බිම පිහිටවන පා ඇති බව
    5. මනෝඥ ශරීර ඇති බව
    6. මෘදු වූ ශරීර ඇති බව
    7. පිරිසිදු ශරීර ඇති බව
    8. මහත් සූර කාය බලඇති බව
    9. නොපැකිළෙන වචන ඇති බව
    10. ලෝවැස්සන්ට ප්‍රිය බව
    11. නිදොස් බව
    12. නොබිඳෙන පිරිස් ඇති බව
    13. කිසිවෙකුට භය නැති බව



    14. කිසිවෙකුට මැඩ පැවැත්විය නොහැකි බව
    15. අනුන්ගේ උපක්‍රමයකින් නොමියෙන බව
    16. අප්‍රමාණ පිරිවර ඇතිබව
    17. යහපත් ශරීර සටහන් ඇති සුරූපී බව
    18. අල්ප ආබාධ ඇතිබව
    19. ප්‍රිය මනාප අයගෙන් වෙන් නොවීම
    21. බොහෝ ආයුෂ ඇති බව

2. සොරකමින් වැළකීමේ ආනිසංස
    1. මහත් ධනයක් ඇති බව
    2. බොහෝ ධන ධාන්‍ය ඇති බව
    3. අප්‍රමාණ භෝග ඇති බව
    4. නුපන් භෝග උපදින බව
    5. උපන් භෝග ස්ථාවර වන බව
    6. කැමති භෝග වහා ලැබෙන බව
    7. රජුන් විසින් සොරුන් විසින් තමාගේ භෝග විනාශ නොකරන බව
    8. ජලයෙන්, ගින්නෙන්, භෝග විනාශ නොවීම
    9. අප්‍රිය උරුමක් කාරයන්ගෙන් විනාශ නොවීම
    10. අන්‍යයන්ට සාධාරණ නොවූ ධනයට හිමිකරුවීම
    11. ලෝකයා පිළිගත් බව
    12. නැතැයි නොකියා සැපෙන් වාසය කිරීම.

3. අබ්‍රහ්ම චරියාවෙන් වැළකීමේ ආනිසංස
    1. සතුරන් නැති බව
    2. සියලු ජනයාට ප්‍රිය වීම
    3. ආහාර පාන වස්ත්‍ර යනාදිය ලැබීම
    4. සුවසේම සැතපීම (නිදාගැනීම)
    5. සුවසේම අවදිවීම
    6. අපාය භයෙන් මිදීම
    7. ස්ත්‍රී භාවය ලැබීමට හෝ නපුංසක භාවය ලැබීමට නුසුදුසු බව
    8. ක්‍රෝධ නොකරන බව
    9. ප්‍රත්‍යක්ෂ භව තහවුරු කරමින් කටයුතු කිරීම
    10. යටිකුරු නොවන බව, බිම බලාගෙන නොයන බව

11. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙහි ඔහුනොවුන්ට ප්‍රිය බව
12. පිරිපුන් ඉඳුරන් ඇති පිරිපුන් ලක්ෂණ ඇති බව
13. කිසිම තැනක සැක නැති බව.
14. නිරුත්සාහයෙන් කටයුතු කිරීම
15. සැප විහරණ ඇති බව
16 කිසිම තැනකින් එන බියක් නැති බව
17. ප්‍රිය මනාප වස්තූන්ගෙන් වෙන් නොවන බව

4. මුසාවාදයෙන් වැළකීමේ ආනිසංස

1. ප්‍රසන්න ඉන්ද්‍රියන් ඇතිබව
2. නොපැකිළ පැහැදිලි වචන කමා කිරීමට හැකිවීම
3. සමවූ පිරිසිදු දත් ඇති බව
4. ඉතා මහත් හෝ ඉතා කෙට්ටු නොවන බව
5. ඉතා උස් නොවන හෝ ඉතා මිටි නොවන බව
6. සැප ස්පර්ශ ඇති බව
7. මානෙල් මල් සුවඳ හමන මුඛ ඇති බව
8. කීකරු පිරිවර ජනයා ඇති බව
9. ඇදහිය යුතු වචන ඇති බව
10. නෙලුම් මානෙල් මල් පෙති සේ මෘදු වූ රතු වූ තුනී වූ දිවක් ඇති බව
11. උඩඟු නොවන චපල නොවන බව

5. සුරාපානයෙන් වැළකීමේ ආනිසංස

1. අතීත, අනාගත, වර්තමාන, කාලයන්හි කටයුතු කිරීමේදී වහා දැනගන්නා බව
2. හැම විටම එළඹ සිටි සිහියෙන් යුක්ත බව
3. උමතු නොවන, නුවණ ඇති බව
4. අලස නොවන, මත් නොවන බව
5. ජඩ නොවන කෙළි සෙල්ලම් පිණිස නොවන බව
6. අප්‍රමාදව මුලා නොවන බව



7. තැති නොගන්නා බව
8. වැඩි වැඩ නොකරන ඊර්ෂ්‍යා නැති බව
9. සත්‍යවාදි බව
10. රෑ දවල් දෙකෙහි පරුෂ වචන හිස්වචන නොකියනබව.
11. කළගුණ දන්න බව කළ උපකාර දන්න බව
12. කෘතවේදි බව මසුරුනැති බව ත්‍යාගවන්ත බව
13. සීලවන්ත බව ඍජු බව
14. ක්‍රෝධ නොකරන බව
15. පවට ලැජ්ජාභය ඇතිවීම.
16. ඍජු ව සම්මා දෘෂ්ඨි ඇති බව
17. මහත් ඥාණවන්ත පණ්ඩිත බව
18. අවැඩ ඉතා හොඳින් දන්නා බව

මෙම ඉහත සඳහන් මූලික කරුණු මුල් ශික්ෂාපද පහේ යෙදෙන අතර පසු ශික්ෂාපද පහේද සුදුසු අර්ථයෙන් දැනගත යුතුය. ඒ ඒ සික්ඛා පදයට ආවේණික ලක්ෂණද හීන ප්‍රහීන ආදියද දැනගත යුතුය.

## සීලානුස්සති භාවනාව

සීලානුස්සති නම් සීලය ගැන මෙනෙහි කිරීමය. සීලය සම්පූර්ණ වීමට සිව් පිරිසිදු සීලයම ඇතුළත් වේ. ප්‍රාතිමෝක්ෂ සංවරසීලය, ඉන්ද්‍රිය සංවර සීලය. ආජීව පාරිසුද්ධ සීලය, ප්‍රත්‍යසන්නිශ්‍රිත සීලය යනුයි. කායික, වාචසික සික්ඛා පදවල එක් එක් ගුණයක් අරගෙන පැහැදිලි කරමින් භාවනාවට නැංවීමයි. සීල භාවනාවේ මූලික පියවර අර්ථ හතරක් ඇතුළත්වේ.

1. නිවැරදි සීල ගුණ අර්ථය
2. ඍජු සීල ගුණ අර්ථය
3. කුසල සීල ගුණ අර්ථය
4. පිරිසිදු සීල ගුණ අර්ථය

1. නිවැරදි අර්ථය

ප්‍රාණඝාතය පස් පව් (සතුන් මැරීම ආදි ක්‍රියාවන් වැරදි සහගත

ක්‍රියාවන්) එම වැරදි සහගත ක්‍රියාවෙන් වෙන්වීම නිවැරදිය. එසේ හෙයින් සික්ඛා පද සියල්ලම නිවැරදි ගුණයෙන් යුක්ත වේ.

2. ඍජු අර්ථය

පස්පව් ආදි පාප ක්‍රියාවෝ 'වංකය' එයින් වෙන් වීම නම් වූ සික්ඛාපදය පිළිගැනීම, පිළිපැදීම ඍජු මාර්ගයකි. වැරදි සිරිත් වලින් වෙන්වීම ඍජු මාර්ගයකි. එය නම් ආර්ය අෂ්ටාංගික' මාර්ගයයි. සීලය සමාදන් ව රැකීම එම ආර්ය මාර්ගයට පිවිසීමකි. ඍජු ප්‍රතිපත්තියට පිළිපැදීමකි. එම නිසා ඍජු අර්ථයෙන් යුක්ත වේ.

3. කුසල අර්ථය

ශික්‍ෂා පදයන් සමාදන් වීමෙන් සිදුකරන්නේ දුසිරිත් වලින් වෙන්වීමයි. එම නිසා සික්ඛාපද සියල්ලම කුසල් බවට පත්වේ. සෑම ශික්‍ෂා පදයක්ම ආරක්‍ෂා කිරීමෙන් ලෝභය, දෝසය, මෝහය, දුරුවේ. එහෙම නම් එය ආලෝභය, අදෝසය, අමෝහය, බවට පත්වේ. එම නිසා මෙය ශික්‍ෂා පද සියල්ල කුසල මූලයෝ යන අර්ථයෙන් කුසල් නම්වේ.

4. පිරිසිදු අර්ථය

සංසාර ගත පෘථග්ජන පුද්ගලයාගේ සිත ලෝභ, ද්වේෂ, මෝහාදී කෙලෙස් වලින් අපිරිසිදුය. එය අපිරිසිදු වන්නේ ආගන්තුක කෙලෙස් වලිනි. සිත කෙලෙසෙන ස්වභාවය ශික්‍ෂාපද ආරක්‍ෂා කිරීමෙන්, වැරදි වලින් වැළකීමෙන් සිත පිරිසිදු වේ. ශික්‍ෂාපද ආරක්‍ෂාවීමෙන් සිල් පිරිසිදු වේ. සිල් පිරිසිදු වීම සිතේ පිරිසිදුකමයි. (කායික, වාචසික ක්‍රියාවේ පිරිසිදු කමයි)

සීලානුස්සති පළමු භාවනා වාක්‍යය කොටස

ශික්‍ෂා පදයක් පාසා මෙම අර්ථය මෙනෙහි කළ යුතුය.

1. පාණාතිපාතා වේරමණී සික්ඛාපද සීලය :- නිවැරදි සීලයකි, ඍජුවන්ත සීලයකි, කුසලාර්ථයෙන් යුක්ත සීලයකි, පිරිසිදු සීලයකි.

2. අදින්නාදානා වේරමණී සික්ඛාපද සීලය :- නිවැරදි සීලයකි, ඍජුවන්ත සීලයකි, කුසලාර්ථයෙන් යුක්ත සීලයකි, පිරිසිදු සීලයකි.



3. අබ්‍රහ්ම චරියා වේරමණී සික්ඛාපද සීලය :- නිවැරදි සීලයකි, ඍජුවන්ත සීලයකි, කුසලාර්ථයෙන් යුක්ත සීලයකි, පිරිසිදු සීලයකි.

4. මුසාවාදා වේරමණී සික්ඛාපද සීලය :- නිවැරදි සීලයකි, ඍජුවන්ත සීලයකි, කුසලාර්ථයෙන් යුක්ත සීලයකි, පිරිසිදු සීලයකි.

5. සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපද සීලය :- නිවැරදි සීලයකි, ඍජුවන්ත සීලයකි, කුසලාර්ථයෙන් යුක්ත සීලයකි, පිරිසිදු සීලයකි.

6. විකාල භෝජනා වේරමණී සික්ඛාපද සීලය :- නිවැරදි සීලයකි, ඍජුවන්ත සීලයකි, කුසලාර්ථයෙන් යුක්ත සීලයකි, පිරිසිදු සීලයකි.

7. නච්ච, ගීත, වාදිත, විසූකදස්සනා, වේරමණී සික්ඛාපද සීලය :- නිවැරදි සීලයකි, ඍජුවන්ත සීලයකි, කුසලාර්ථයෙන් යුක්ත සීලයකි, පිරිසිදු සීලයකි.

8. මාලා, ගන්ධ, විලේපන, ධාරණ, මණ්ඩන, විභූසනට්ඨානා වේරමණී සික්ඛාපද සීලය :- නිවැරදි සීලයකි, ඍජුවන්ත සීලයකි, කුසලාර්ථයෙන් යුක්ත සීලයකි, පිරිසිදු සීලයකි.

9. උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපද සීලය :- නිවැරදි සීලයකි, ඍජුවන්ත සීලයකි, කුසලාර්ථයෙන් යුක්ත සීලයකි, පිරිසිදු සීලයකි.

10. ජාත රූප රජත පටිග්ගහනා වේරමණී සික්ඛාපද සීලය :- නිවැරදි සීලයකි, ඍජුවන්ත සීලයකි, කුසලාර්ථයෙන් යුක්ත සීලයකි, පිරිසිදු සීලයකි.

මෙම භාවනා මාර්ගය බොහෝ වේලාවක් වශයෙන් සතර ඉරියව්වේදීම සම්පූර්ණ කළයුතුය. අනුලෝම ප්‍රතිලෝම වශයෙන්ද භාවිතා කළ හැකිය. (කාමාවචර සමාධිය බවට පත්වේ.)

සමාධියෙන් නැගී සිට විපස්සනාවට හැරිය හැකිය.

## සීලානුස්සති භාවනාව විපස්සනාවට හැරවීම

ඉහත සඳහන් සීල භාවනා සමාධියෙන් නැගී සිට ඉන් අනතුරුව විපස්සනා වැඩිය හැකිය. ධාතු මනසිකාරයෙන් විපස්සනාවට නැංවිය හැකිය. පළමුව නාම රූප වශයෙන් වෙන් කර ගත යුතුය. රූප කලාපයන් මතුවෙනතෙක් ධාතු වශයෙන් මෙනෙහි කොට රූප කලාප ඉස්මතුකොට ගෙන රූපධර්මයන්ගේ වෙන්වීමෙන් රූප ධර්ම රාශියක එකතුවක් හැර සත්ව පුද්ගල ස්වභාවය අත්හැර රූප ධර්මයන් සම්මර්ෂණය කොට රූප ධර්මයන්ගේ වෙන්වීමෙන්ද, නාම ධර්ම රාශියක එකතුවක් හැර සත්ව පුද්ගල ස්වභාවය ඉක්මවා නාම රූප වශයෙන් එකට එකතු කොට පූර්ව විපස්සනාව නාම රූප වශයෙන් තේරුම් ගෙන ඉන් පසුව ත්‍රිලක්‍ෂණ විපස්සනා වශයෙන් ගුරු උපදෙස් වශයෙන් ගෙන ත්‍රිලක්‍ෂණයට හරවා විපස්සනා කළයුතුය. ත්‍රිලක්‍ෂණයෙහි වචනාර්ථය මෙසේ සඳහන්වේ.

## විපස්සනා භාවනා වාක්‍යය

වෙන්වීම් සංඛ්‍යාත විරති චේතනා සීලයෙහි නාම රූප ධර්මයෝ ඇතිව නැතිව යන හෙයින් අනිත්‍යයෝය. ඇතිවීම නැතිවීම දෙකෙන් නිරන්තරයෙන් පීඩා විඳින හෙයින් අනාත්මයෝය. අනිත්‍යවූ, දුක්ඛවූ, අනාත්මවූ, අසුභ වූ, විරති චේතනා සීලය ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය. ඒ දුක්ඛ සත්‍ය උපදවන්නා වූ පූර්වභාව තෘෂ්ණාව ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය. ඒ දෙකෙහි  නොපැවැත්ම නම් වූ නිර්වාණ ධාතුව ඒකාන්තයෙන් නිරෝධ සත්‍ය නම් වන්නේය. ඒ නිරෝධ සත්‍ය මාර්ගය ඒකාන්තයෙන් ආර්ය අෂ්ඨාඞගික මාර්ගය, මාර්ග සත්‍ය නම් වන්නේය. මාගේ විරති චේතනා ප්‍රතිපත්ති සීල භාවනාමය කුසලය, සමාධිමය කුසලය, ප්‍රඥාමය කුසලය, ආමිස ප්‍රතිපත්තිමය කුසලය, සමථ විපස්සනාමය කුසලය මෙම චතුරාර්ය්‍ය සත්‍ය ධර්මය අවබෝධ කරගැනීම පිණිසම හේතුවේවා. වාසනාවේවා.

සාධු! සාධු!! සාධු!!!



## සීලානුස්සති භාවනාව දෙවන හා තුන්වන කොටස්

විරති චේතනා සීල භාවනාවේ දෙවනි පියවර, තුන්වන පියවරවල් සිල් සමාදන් වන සියලු දෙනා විසින් භාවිතා කළ යුතුය. මෙම සීල භාවනාවේ සඳහන්වන එක් එක් සිල් පදයක විද්‍යමාන වන වටිනා ගුණ පසකින් යුක්තවේ. එක්එක් සිල් පදයක් පාසාම මෙම ගුණ පහේ අර්ථය මෙනෙහි කරමින් සිහියට නගමින් භාවනාව මනාව වැඩිය යුතුය. ඒ සඳහා  කැමති සියලුදෙනා සීලානුස්සති භාවනාව සහ සීල භාවනාමය ඥාණය පොතෙන් කරුණු දැනගන්න.

# තුනුරුවන් ගුණ භාවනාව

**බුදු ගුණය සහ බුදු ගුණ භාවනාව.**

එක ධමෙමා හිකඛවෙ භාවිතො බහුලිකතො එකනත නිබබිදය, එකනත විරාගාය, නිරෝධාය, උපසමාය, අභිඤඤාය, සමෙබාධාය නිබ්බාණය සංවතතති. කතමො එක ධමෙමා බුද්ධානුසසති අයං බො හික්ඛවේ එක ධමෙමා භාවිතො බහුලිකතෝ එකනත නිබ්බිදාය එකනත විරාගාය, නිරෝධාය, උපසමාය අභිඤ්ඤාය සංවතතති සමෙබාධාය නිබ්බාණාය.

මහණෙනි! එකම ධර්මයක් භාවනාවක් වශයෙන් වඩන ලද්දේ බොහෝ කොට වඩන ලද්දේ කල කිරිම පිණිස, නිවීම සංසිඳීම පිණිස හාත් පසින් දැකීම පිණිස,  අවබෝධය, නුවණ පිණිස පවතීද, කවර නම් එකම ධර්මයක්ද බුද්ධානුස්සතියයි. සෙසු ධර්ම අවබෝධයයි. මෙය නිවන් අවබෝධය පිණිස උපකාර වේ.

බුදෙධාපි බුදධසස භණෙයය වණණං
කපපංපි චෙ අඤ්ඤ මහාසමාණො
ඛීයෙථ කපෙපා චිර දීඝමනතරෙ
වණෙණා න ඛීයෙථ තථාගතසස

''බුදුරජාණන් වහන්සේ බුදු වුණු දින පටන් අනික් දෙයක්

නොකොට දිවා රෑ දෙකෙහි නොනවත්වාම ආයු කල්පයක් මුළුල්ලේම බුදුරජාණන් වහන්සේගේම බුදුගුණ වර්ණාව කරන්නේ නම් ආයු කල්පය ගෙවී යයි. බුදු ගුණ කියා අවසන් කිරීමට නොහැකි වේ.''

ලෝකයෙහි බුදුරජාණන් වහන්සේ නමක් පහළවීම ඉතාමත්ම දුර්ලභ. බෝධිසත්ව සංකල්පනාව සිතට ගත් ඥානවන්ත සත් පුරුෂයෝ අති දීර්ඝ කාලයක් බෝසත් සිත පුරුදු කරමින් පැමිණෙන්නේ මහා සම්පත්තිය පුරුදු කරමින්ය. එනම්, අභිනිහාරයේදී සම්පූර්ණ විය යුතු කරුණු, උතුම් මිනිස් භවය, ලිංග සම්පත්තිය රහත් වීමට හේතුවය. ශාස්තෘ දර්ශනය, අධිකාරය බලවත් ඡන්දය (කැමැත්ත) සම්පූර්ණ කරමින් පැමිණ බුදුරජාණන් වහන්සේ නමකගෙන් නියත විවරණ ලබාගෙන එතැන් පටන් සාරා සංඛ්‍ය කල්ප ලක්‍ෂයක් හෝ අටාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් හෝ සොළසා සංඛ්‍ය කල්ප ලක්‍ෂයක් හෝ  බෝධි කාරක ධර්මයන් සම්පූර්ණ කළ යුතුය. මේ තරම් කාලයක් පාරමී  පුරා ලොව්තුරා බුදු බව ලබන්නේ බුදු බව පතා පාරමී දම් පුරන බෝසතාණන් වහන්සේලාගේ සන්තානයෙහි නියතින්ම ආගම ශ්‍රද්ධාව පවතින නිසා බුදුගුණ භාවනාව ඉතා හොඳින් පැහැදිලිව පවතී. බුදුගුණ දේශනා කළ යුතු අය අතරත්, බුදුගුණ ඇසූ අය අතරත්, බුදුගුණ ගැයූ අය අතරත්, බුදුගුණ දරූ අය අතරත් ලොව්තුරා බුදුරජාණන්වහන්සේ ම ශ්‍රේෂ්ඨයි, උත්තමයි, අග්‍රයි, පසේ බුදු මහරහතන් වහන්සේලාද ඉතා උතුම්ය. නිරන්තරයෙන්ම බුදුගුණ සිහිකරන යෝගියාට බුදුබව ලබන්නට සිත යොමු වෙයි. නොඅනුමානය.  බුදුබව අනාගතයෙහි ලැබීමට සිටින අයද අනිවාර්යයෙන්ම බුදුගුණ භාවනාව සිදු කළ යුතුමය.

මහ බෝසතාණන් වහන්සේලා ගේ සන්තානයෙහි බුදුගුණ පිහිටන ආකාරය අනුව අප මහ බෝසතාණන් වහන්සේගේ සන්තානයෙහි බුදු ගුණ පිහිටියේ කල්ප විසි අසංඛ්‍යයකට මත්තෙන්ය. එනම්, මනෝප්‍රනිධානය ආරම්භයේදීය. එතැන් පටන් අති දීර්ඝ කාලයක් බුදුගුණ භාවනාවේ ආනිසංසය  විඳිමින් පාරමී පුරාගත් ආකාරය සෑම කෙනෙකුටම ඉතාමත් ආදර්ශවත්ය.ඉතාමත් විසිතුරුය. ඒ සා දීර්ඝ කාලයක් ඇතුළත ලෝකයෙහි පහළ වූණු (512027) පන්ලක්‍ෂ දොළොස්දහස් විසිහත් නමකගේ රූප විලාසය සිය නෙතින් දැක උන්වහන්සේලාගේ බුදුගුණ තතුසේ නුවණින්



දැනගෙන ඒ උතුමන් වහන්සේලාගේ අවවාදයෙන් , අනුශාසනාවෙන්, උපදේශයෙන්, ආදර්ශයෙන් උන්වහන්සේලාටම අනුකූලව, අනුරූපව, අනුයාතව, අනුබද්ධව, බුදුගුණයටම එල්බ සිටි සිහියෙන් බුද්ධ කාරක ධර්මයන් සම්පූර්ණ කිරීම වශයෙන් බුදුගුණ භාවනාව සම්පූර්ණ කළ සේක. ගුණවත් වූ සිල්වත් වූ අයටම පිහිටන උතුම් ගුණයකි. සාමාන්‍ය කෙනෙක් සිහිකරන බුදුගුණයට වඩා සිල්වත්ව ගුණවත්ව සිහිකරන ගුණය ඉතා මහත්ය. සකල ලෞකික ජනයාගේ බුදුගුණ දැනුමට වඩා බුදුගුණ දැනුමක් එක සෝවාන් පුද්ගලයෙකුට ඇත්තේය. සෝවාන් පුද්ගලයන් දහසකට ඇති බුදුගුණ දැනුමට වඩා බුදුගුණ දැනීමක් එක සකෘදාගාමී පුද්ගලයෙකුට ඇත්තේය. සකෘදාගාමි පුද්ගලයන් දහසකට වඩා බුදුගුණ දැනුමක් එක අනාගාමී පුද්ගලයෙකුට ඇත්තේය. අනාගාමී පුද්ගලයන් දහසකට වඩා බුදුගුණ දැනුමක් එක සාමාන්‍ය රහතන් වහන්සේ නමකට ඇත්තේය. අසූ මහ ශ්‍රවකයන් වහන්සේලාගෙන් කාශ්‍යප, අනුරුද්ධ, මහාකච්චායන ස්වාමීන් වහන්සේලාට අතිරේක දැනුමක් ඇත්තේය. අගසව් දෙදෙනා වහන්සේට ඊටත් වඩා බුදුගුණ දැනුමක්  ඇත්තේය. ඒ උතුමන් වහන්සේලා අතරින්  ඊටත් වඩා බුදුගුණ දැනුමක් දම්සෙනෙවි සැරියුත් මහ රහතන් වහන්සේට ඇත්තේය.

බුදුරජාණන් වහන්සේ එක් සමයක නාලන්දාවේ පාවාරික අඹ වනයෙහි වැඩ වාසය කරන සේක. ඒ සමයෙහි නුවණැති ශ්‍රාවකයන් අතර අගතැන්පත් වූ දම්සෙනෙවි සාරිපුත්ත, මහරහතන් වහන්සේ එම අඹවනයෙහිම ඵල සමාපත්තියට සමවැදී ඉන් නැගී සිට තමන් වහන්සේගේම ගුණය සිහිකරන්නට පටන් ගත් සේක. තමන් වහන්සේගේම සීල ගුණයෙන් පටන්ගෙන අනුපිළිවෙළින් සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්ති ඥාන දස්සන ප්‍රථම ධ්‍යාන සමාපත්තියේ පටන් දෙවැනි තුන්වැනි, සතරවැනි සමාපත්ති වලට සමවැදී අනුපිළිවළින් අරූප සමාපත්ති වලට සමවැදී විපස්සනා ඥාන, පුබ්බේනිවාස ඥාන, දිබ්බචක්ඛු, සෝතාපත්ති ආදී සතර ඵල සමාපත්ති ඥාන, චතුපටිසම්භිදා ඥාන සහිතව සාවක පාරමිතා ඥානය පහළවීමෙන්  අනොමදස්සී බුදුරජාණන් වහන්සේගේ පාද මූලයෙහි පටන් එකාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකින් මත්තෙහි සිට ඒ මොහොතේ වැඩ සිටි ආසනය දක්වා පුන පුනා නැවත නැවත සිහි කරන්නට පටන් ගත්තේය. එවිට තමන් වහන්සේගේම ගුණය මෙතෙකැයි ප්‍රමාණ කළ නොහැකි

බව තමන් වහන්සේටම වැටහෙන්නට විය.

තමන් වහන්සේගේ ගුණය ප්‍රකාශ කළ නොහැකි නම්, මම යම් ශාස්තෘවරයෙක් උදෙසා පැවිදිවූයේය, ඒ අපරිමිත ගුණස්කන්ධයක් ඇති මගේ ශාස්තෘන් වහන්සේගේ ගුණය කෙබඳුදැයි දස බලධාරී සර්වඥයන් වහන්සේගේ ගුණස්කන්ධය සිහි කිරීමට පටන් ගත්හ. එම ගුණ  නා නා ප්‍රකාරයෙන් බෙද බෙදා මෙනෙහි කළ සේක. බුදුගුණය අනන්තය, බුදුරජාණන් වහන්සේගේ සීලය, සමාධිය, ප්‍රඥාව, විමුක්තිය විමුක්ති ඥාන දර්ශනය, සතර සතිපට්ඨාන, සතර සෘද්ධිපාද, සතර සම්‍යක් ප්‍රධාන වීර්ය, පඤ්ච ඉන්ද්‍රිය, පඤ්ච බල,  සතර ඵල, සතර පටිසම්භිදා, ෂට් අසාධාරණ ඤාණ, දසබල ඤාන, චුද්දස බුද්ධගුණ ඤාණ, සොළොස් මහා ඤාණ අට්ඨාරස බුද්ධ ඥාන සූවිසි කෝටිවාර, සමාපත්ති අරහත් ඵල, වජිර ඤාණ, අනන්ත ණය සමන්නාගත. සමන්ත පට්ඨාන ප්‍රකරණ විෂයන්තර්ගත ගම්භිර ඥාන ආදී අනේක විධ ඥානයන්ද, ගුණයන්ද සිහිකිරීමට පටන් ගත්සේක. ලෝකයෙහි හිමාල පර්වතයෙන් ගලා බස්නා මහා ගංගාවට ඉදිකටු මලක් යොමු කළ කල්හි ඉදිකටු මලෙන් යන ජලය ඉතා ස්වල්පය. මහා ගංගාවේ ගලා බසිනා ජලය බොහෝ වන්නාහ. මහ පොලොවෙන් නිය පිටට ගත් පස් ටික හා සමානයයි මම සිහි කළ බුදු ගුණයයි සාරිපුත්ත මහ රහතන් වහන්සේට වැටහුණාහ. බුදුගුණ අනත්ත අප්‍රමාණයැයි තීරණය කොට වදාළේ තමන් වහනසේගේ නුවණින් දැක වදාළ නිසයි. (මෙහි වැඩි විස්තර දීඝ නිකායේ සම්පසාදනීය සූත්‍රය හා සංගිති සූත්‍රය වැනි සූත්‍ර සහ එම අටුවා බලා තේරුම් ගන්න)

## බුදුගුණ භාවනාවෙහි ආනිසංස.

කුසල් අකුසල් නානාවිධ අරමුණුවල විසිරුණු සිත සමාධිමත් වීම බුදුගුණ භාවනාවේ ඉමහත්ම ආනිසංසයයි කිය යුතු  වන්නේමය. බුදුගුණ සිහි කරන්නා වූ භාවනා යෝගියාට බුදුරජාණන් වහන්සේ කෙරෙහි අප්‍රමාණ ගෞරවය, භක්තිය, ඇදහීම, විශ්වාසය ඇතිවේ.  ශ්‍රද්ධාවෙන්, සිහියෙන්, ප්‍රඥාවෙන් ඉමහත් විපුලත්වයට පත් වේ. ප්‍රීති ප්‍රමෝදයෙන් යුක්ත වේ. කුඩා, මහත් දුක් ඉවසන්නෙක් බවට පත්වේ.  මම බුදුරජාණන් වහන්සේ සමඟ වාසය කරන්නෙමියැයි



හැඟීමෙන් බුදු ගුණයෙන් බර ජීවිතයක් බවට පත් වේ. බුදුගුණයෙන් හද සිත පිනා ගිය බුදුගුණ නිදන් වු ඔහුගේ හදවත බුදු මැදුරක් මෙන් පිදිය යුතු වන්නේය. ඔහුගේ සිත බුදු බව ලැබීමට සිත් ඇති වන්නේය. පාපයට සිත  නොනැමෙන්නේය. පාප සිතිවිල්ලක් සිතට ඇති වූ විගසම බුදුරජාණන් වහන්සේ ළඟ සිටින සේ පෙනෙන්නාක් මෙන් පවට ලැජ්ජාව භය උපදින්නේය. පාපයෙන් සිත වලකින්නේය. ඒ වාගේම යම්කිසි නාග, යක්ෂ, භූත, පිසාච, අමනුෂ්‍ය උපද්‍රවයන්ගෙන් සම්පූර්ණයෙන්ම  මිදෙන්නේය. ඒ අයගෙන් සියලු රැකවරණ ලැබෙන්නේය. ඔබ යම් කෙනෙකුගෙන් හෝ බොහෝ දෙනාගේ අවඥාවට, නින්දාවට අවමානයට, අපහාසයට, පිළිකුළට,  ඊර්ෂ්‍යාවට ආදියට පත් වී ඇති නම් එයින් මිදෙන්නට නම් බුදුගුණ නිරන්තරයෙන් සිහි කරන්න. ඔබට නින්ද නොයන්නේ නම් නපුරු සිහින පෙනෙන්නේ නම් සිහිනෙන් භය වෙන්නේ නම්, අදම බුදු ගුණ සිහි කරන්න. බුදු ගුණ භාවනාවේ යෙදෙන්න.

''සුපප බුද්ධං පබුජ්ඣනති - සදා ගෝතම සාවකා
යෙසං දිවා  ච රතෙතාව - නිච්චං බුදධගතා සති''

යම් කෙනෙකුන්ට දිවා රෑ දෙකෙහි නිතර බුදුගුණ අරමුණු කොට උපන් සිහිය ඇද්ද ඒ බුද්ධ ශ්‍රාවකයෝ සැමදා සුවසේ නිදා මනාව පුබුදිත්. යනු ගාථාවේ තේරුමයි.

මේ ගාථා ධර්මය බිම්බිසාර මහරජතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් දේශනා කර වදාළ ගාථාවකි.  මේ නිසා සම්බුද්ධ ශාසනයෙන් මානසික සුවයක් ලබන්නට බලාපොරොත්තු වන සියලු දෙනාම බුදුගුණ සිහිකරමින්, සාසනික උතුම් ගුණයන් සිතේ දරාගෙන බුදු පසේබුදු මහරහතන් වහන්සේලා නෙත් දෙකින් දැක සිය දෑතින් උපස්ථාන කරමින් පාරමී පුරාගෙන අනාගත වාසනා ශක්තිය ඇති කර නිවන් අවබෝධ කර ගත යුතුය. එම නිසා අපටත් අනාගතයේදී වාසනාවක් උදාවේවායි පතමින් පාරමී ධර්මයන් සම්පූර්ණ කරගෙන මෙලොව දියුණුව පිණිසත් පරලොව සුගතිය පිණිසත් අවසානයෙහි දෙලොව ජයගෙන උතුම් වූ නිවන්සුවය අවබෝධ කර ගැනීම පිණිස සියලු දෙනාටම මෙම මග උපකාර වේවා.

## බුදුගුණ භාවනාවේ ආනිසංස.

1.සතර අපායට පත් නොවීම.
2.පිට සක්වළ නොඉපදීම.
3.අඳ, ගොළු, බිහිරි ආදී අභව්‍ය නොවීම.
4.මන්ද බුද්ධික උම්මත්තක නොවීම.
5.මිසදිටු නොගැනීම.
6.පාපයට ලැජ්ජා භය ඇති වීම.
7.ග්‍රහ දෝෂ, අපල උපද්‍රව දුරු වී කුසල විපාක මතුවීම.
8.වස, විස, අවි, ආයුධ ජල ගිනි ආදියෙන් වැළකීම.
9.භූත, පිසාච, ප්‍රේත ආදීන්ගේ විපත්ති වැළකීම.
10.භය, තැතිගැනීම්, ලොමු ඩැහැ ගැන්වීම් ආදිය සිදු නොවීම.
11.කොඩිවින, බන්ධන, ඇස්වහ, කටවහ ආදී විපත්ති දුරුවීම.
12.මරණයට නිර්භයව මුහුණ දීම.
13.සතිය නුවණ එළඹ සිටීම.
14.ධාරණ ශක්තිය හා අවබෝධ කර ගැනීමේ දක්ෂතාව
ඇතිවීම.
15.ගුණ නුවණින් විශාරද වීම.
16.මුහුණේ වර්ණය ඇතිවීම.
17.ලෝකයාට ප්‍රිය වීම.
18.බොහෝ කොට සිවුපස ලැබීම.
19.දෙවියන්ගේ රැකවරණය ලැබීම.
20.අන් අයගේ කරුණාවට මෛත්‍රියට පාත්‍ර වීම.
21.සුවසේම සැතපීම, සුවසේම අවදි වීම.
22.නපුරු සිහින නොපෙනීම.
23.සම්මා දිට්ඨියේ පිහිටීම.
24.බුදු ගුණ වඩන්නාට මනාව සිත සමාධි වීම.
25.බුදුගුණ වඩන්නා හට මේ ජීවිතයෙහිදී මග ඵල නොලැබුනොත්
සුගති සැප ලැබීම.
26.බුදුගුණ වඩන්නා සත්‍යවාදියෙක් වෙයි.
27.බුදුගුණ වඩන්නා නිතර සෝමනස්ස සිතින් යුතුව වාසය කරයි.
28.බුදුගුණ වඩන්නා ට සසරේදී බුදුවරු හමුවෙයි.
29.තමා කෙරෙහි සෑම කෙනෙකුගේම සිත නැමෙයි.



30.බුදුබව පැතීමට සිත නැමෙයි.
31.තම හදවත බුදුමැදුරක් වෙයි.
32.නිහතමානී පැවතුම් හා ගතිගුණ දියුණු වෙයි.
33.ප්‍රභූවරුන්ගේ ගෞරවයට සැලකිල්ලට භාජනය වෙයි.
34.තමන්ගේ සිතුම් පැතුම් ඉටු වෙයි.
35.අධිකුසලයට සිත නැමෙයි.
36.තමන්ගේ යෝජනා, අදහස් අන් අය එක හෙලාම පිළිගනී.

මෙවැනි අදහස් සපුරා ගැනීමට සියල්ලෝම බුදුගුණ වඩත්වා!

සාධු ! සාධු!! සාධු!!!

## දහම් ගුණ - ධම්මානුස්සති භාවනාව.

ශ්‍රී සද්ධර්ම රත්නයේ බලය ඉතාම වැදගත්ය. ප්‍රතිපත්ති ධර්මය ප්‍රධාන වන්නේය. පරියප්තියෙන් ප්‍රතිපත්තියට, ප්‍රතිපත්තියෙන් ප්‍රතිවේධයට, ප්‍රතිවේධයෙන් මගඵල නිවන් අවබෝධයට හේතු වේ. ලෝකෝත්තර මාර්ගයන්ගේ බලය යටපත් කළ කෙලෙස් නැවත නූපදින්නේය, සෝවාන් මාර්ග ඥානයෙන්, ආත්ම අටකට සසර කෙටි කොට සකෘදාගාමී මාර්ගයෙන් ඕලාරික කෙලෙස් යටපත් කොට අනාගාමී මාර්ගයෙන් නැවත කාම ලෝකයට නොයන හෙයින්ද, අර්හත් මාර්ගයෙන් සියලු භවයෙන් නිදහස් වන හෙයින්ද, සසරින් එතෙර වීමට එකම මාර්ගය ධර්ම මාර්ගයම බව සිහිපත් කළ යුතුය.

එක ධමෙමා භිකඛවේ භාවිතො බහුලිකතො එකනත නිබබිදාය, එකනත විරාගාය, නිරෝධාය, උපසමාය, අභිඤ්ඤාය, සමෙබාධාය නිබබානාය සංවතතති කතමො එක ධමෙමා ධම්මානුසසති අයං බො භිකඛවේ එක ධමෙමා භාවිතො බහුලිකතො එකනත නිබබිදාය එකනත විරාගාය, නිරෝධාය උපසමාය අභිඤ්ඤාය සංවතතති.

මහණෙනි! එකම ධර්මයක් භාවනාවක් වශයෙන් වඩන ලද්දේ, බොහෝ කොට වඩන ලද්දේ කළකිරීම පිණිස, නිවීම සංසිදීම පිණිස, හාත්පසින් දැනීම පිණිස, අවබෝධය නිවන

පිණිසම පවතී. කවර නම් එකම ධර්මයක්ද, ධම්මානුස්සතියයි මෙය නිවන් සැප පිණිසම උපකාරී වේ.

ලොව පහළ වන සියළුම බුදුරජාණන් වහන්සේලා සෑම ශාසනයකම එකම ලෙස දේශනා කරන ධර්මය ශ්‍රී සද්ධර්ම රත්නයයි. පර්යාප්ති ධර්මය හා නව ලෝකෝත්තර ධර්මයයි. භාග්‍යවතුන් වහන්සේ බෝධිසත්ව ජීවිතය ආරම්භ කරන ලද්දේ විසි අසංඛ්‍ය කල්ප ලක්‍ෂයකට මත්තෙහි සිට බෝධි මණ්ඩලය දක්වා පුරන ලද පාරමී ශක්තියෙහි බලයෙන් එදා දඹදිව බුද්ධගයා ශුද්ධ භූමියේදී ජය ශ්‍රී මහ බෝ මැඩදී අවබෝධ කොට වදාළා වූ සපරියාප්තික නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්ම රත්නය මුල, මැද, අග යහපත් වන හෙයින්ද, අර්ථ සම්පන්න ව්‍යඤ්ජන සම්පන්න සර්ව සම්පූර්ණ සුපරිශුද්ධ ශාසන බ්‍රහ්මචර්යාව ප්‍රකාශ වන හෙයින්ද, ස්වක්ඛාත නම් වන්නේය. ස්වාක්ඛාත ආදී ගුණයෙන් සමන්නාගත ශ්‍රී සද්ධර්ම රත්නය සර්වප්‍රකාරයෙන් අවබෝධ කළ අවුරුදු පන්සාලිස් වසක් මුළුල්ලේ ඒ ඒ තැන්වලදී දේශනා කළ බුද්ධ වචනය පරියාප්ති ධර්මය නම් වේ. සතර අපායෙන් අත මිදීම සඳහා දෙව් මිනිස් සැප හා නිවන්සැප ලැබීම සඳහා පිරිය යුතු ධර්මය ශාසනික ප්‍රතිපත්ති ධර්මයයි. ගිහියන් විසින් ඔවුන්ට සුදුසු පරිදි පැවිද්දන් විසින් ඔවුන්ට සුදුසු පරිද්දෙන්ද පිළිවෙත් පිරිය හැකිය. අර්ය මාර්ග සතර සහ ඵල ධර්මයන් සතර සහ නිර්වාණය නව ලෝකෝත්තර ධර්මය ප්‍රතිවේධ ධර්මය නම් වේ.

තවද, බුදුන් වදාළ ධර්මය වශයෙන් විනය පිටකය, සූත්‍ර පිටකය. අභිධර්ම පිටකය, යයි පිටක වශයෙන් ත්‍රිවිධ වෙයි. එක හා සමාන ලක්‍ෂණ ඇති බුද්ධ වචන සමූහය වශයෙන් ගත් කල්හි පිටක නම් වෙයි. විනය පිටකය කොටස් 05කින් යුක්තයි. සූත්‍ර පිටකය නිකාය වශයෙන් කොටස් 05කින් යුක්තයි. අභිධර්ම පිටකය කොටස් 7කින් යුක්තයි. ස්කන්ධ වශයෙන් සුවාසු දහසක් ඇත.(84000) එක අනුසන්ධියක් ඇති කොටස් එක ස්කන්ධයකි.

විනය පිටකය ස්කන්ධ වශයෙන් විසි එක් දහසකි. සූත්‍ර පිටකය ස්කන්ධ වශයෙන් විසි එක් දහසකි. අභිධර්ම පිටකය ස්කන්ධ වශයෙන් හතළිස් දෙදහසකි. යන ආදී වශයෙන් නවලෝකෝත්තර ධර්මය වශයෙන් සෝවාන් ආදී මාර්ග සතර ඵල සතර සහ නිර්වාණය නව ලෝකෝත්තර ධර්මයයි.



ධර්මය යනුවෙන් සඳහන් කරන්නේ ''අත්තානං ධාරෙනෙත චතුසු අපායෙසු වටට දුකෙඛ සු ච අපතමානෙ කත්වා ධාරෙතිති ධමෙමා'' ධර්මය දැරීමේ අර්ථයෙන් සතර අපායට නොවැටී සසර දුකට වැටෙන්නට නොදී රැකීමය. ධර්මය දරන්නවුන් සතර අපායටත් සසර දුකටත් වැටෙන්නට නොදී ආරක්‍ෂා කෙරේ යන අර්ථයයි.

මෙවැනි අර්ථයකින් සමන්නාගත ධර්මයක් මනාව අවබෝධ කර ගැනීම ඉතාමත් ගැඹුරුය. දැකීමට ඉතා අපහසුය. අවබෝධ කරගැනීමත් ඉතා දුෂ්කරය. එවැනි ධර්මයක් අමාරුවෙන් වූවත්, දුෂ්කර වූවත් අවබෝධ කර ගන්නේ නම් ඉතාමත් යහපත්ය. ඉතාමත්ම මිහිරිය ඉතාමත්ම සැනසුම් සහිතය. සත්‍ය ධර්මය අවබෝධය ඉතාමත් මිහිරිය. ධර්මය පිළිපැදිය යුතු අවස්ථාවේ පටන් ආනිසංස දැකිය හැකි ධර්මයකි. පිළිපදින්නාට එම මොහොතේම විපාක ලබාගත හැකි ධර්මයකි. විපාකය ආනිසංසය මුල, මැද, අග කියන අවස්ථාවලදී ලබාගත හැකිය. මෙම ජීවිතයේදීම තමා විසින් ම තම සන්තානයේදීම ප්‍රත්‍යක්‍ෂ කරගත යුතු සන්දෘෂ්ටික ධර්මයකි. ඵලය ගෙන දීමට මෙපමණ යයි කාලයක් නැති හෙයින් අකාලික නම් වේ. යම් කෙනෙක් ධර්මය පිළිපැද ඵල විපාක නිර්භයව කිව හැකි හෙයින් ඒහිපස්සික නම් වේ. තමාගේ සිතෙහි එළඹවා ගත හැකි පිහිටුවා ගත හැකි ධර්මය හෙයින්ද 'ඕපනයික' වේ. ඥාණවන්තයන් විසින් ප්‍රත්‍යක්‍ෂ කර ගත යුතු ධර්මය හෙයින් පච්චත්තං වේදි තබ්බෝ නම් වේ. මේ වාගේ උතුම් ගුණයෙන් යුතු ධර්මයක් ශාසනයෙහි බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර සත්ත්වයන්ගේ සිත් වල කෙලෙස් ගිනි නිවාලීමට සමර්ථ වන ධර්මයක් බව අප විසින් ප්‍රත්‍යක්‍ෂ කර ගත යුතුය. ධම්ම පදය දුටු කල්හි, සෑම තැනකදීම එකම අර්ථයක් නොගෙන සුදුසු තැනට ගැළපෙන සේ සුදුසු අර්ථය ගත හැකි ධර්මයකි.

ත්‍රිපිටක ධර්මයෙහි ධර්මය යනු නොයෙක් අර්ථයන් ගෙන හැර දක්වෙන උතුම් දහම් පදයකි. එය අර්ථ විග්‍රහය අනුව ප්‍රධාන කොටස් වශයෙන් ගුණ වශයෙන් 6කට බෙදා වෙන් කර ඇත. ඒ අර්ථය කොට සැකෙවින් හෝ දැනගෙන ධර්මානුකූල ජීවිතයක් ගත කිරීමෙන් මෙලොව පරලොව දියුණුව සඳහාත් නිර්වාණ ගාමිණී

මාර්ගය පැහැදිලි කර ගැනීම පිණිසත් සියලු දෙනාටම උපකාරී වේවා!.

## මහා සංඝරත්නයේ ගුණය
## සඟගුණ සහ සඟගුණ භාවනාව

එක ධම්මො භික්ඛවෙ භාවිතො බහුලි කතො එකනත විරාගාය, නිරෝධාය උපසමාය, අභිඤ්ඤාය සමොබාධාය නිබබිදාය සංවතතති කතමො එකධමෙමා සංඝානුසසති අයං බො භික්ඛවෙ එක ධමෙමා භාවිතො බහුලිකතො එකනත නිබබිදය එකනත විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සමොබාධාය නිබබාණාය සංවතතති.

මහණෙනි, එකම ධර්මයක් භාවනාවක් වශයෙන් වඩන ලද්දේ බොහෝ කොට වඩන ලද්දේ කලකිරීම පිණිස නිවීම පිණිස, සංසිඳීම පිණිස, හාත්පසින් දැකිම පිණිස, නිවන් අවබෝධය පිණිස පවතීද, නුවණ පිණිස පවතීද, කවරනම් එකම ධර්මයක්ද, සංඝානුස්සතියයි. සෙසු ධර්ම අවබෝධය පිණිසද පවති.

සංඝ යන නාමයෙන් හඳුන්වන්නේ සමූහය යන අර්ථයයි. යම් කෙනෙකුගේ ශ්‍රාවකයෝ යන්නය. ලෝකයේ බොහෝ ශ්‍රාවකයෝ සිටියහ. ලෝකයේ බොහෝ නායකයන්ගේ ශ්‍රාවකයෝ සිටියත් අපගේ ශාසන බලය අනුව අප සලකන්නේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක පිරිසයි. අපගේ සංඝ පාඨයේ තේරුම අනුව ''භගවතෝ සාවක සංඝො'' යනු භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සමූහයාටයි. ශ්‍රාවකයෝ යනු අසන තැනැත්තෝය. අපට තිබෙන්නේ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසන තැනැත්තෝයි. තථාගතයන් වහන්සේ ධර්මය අසා එය ගෞරවයෙන් පිළිගෙන එහි පිළිවෙත් පුරන, පිළිපදින, පිළිගැනීමට උත්සාහ දරන සත් පුරුෂයෝ තථාගතයන් වහන්සේගේ ශ්‍රවකයෝ වෙති. ඇසිය යුතු ධර්මයන් අතර අර්ථයෙන් පයඝ්ප්ති ධර්මයයි. ඒ පයඝ්ප්ති ධර්මයට අනුව පිළිවෙත් පුරන්නේ නම් ශ්‍රාවකයා යනුවෙනි. බුදුරජාණන් වහන්සේගේ ධර්මය අසා පිළිවෙත් පුරන ගෞරවයෙන් පිළිගෙන උත්සාහ කරන ශ්‍රාවකයන් අතර මනුෂ්‍ය, දේව, බ්‍රහ්ම වශයෙන් කොටස් තුනකට බෙදේ. ගිහි පැවිදි වශයෙන්



ද, ආර්ය, පෘථග්ජන වශයෙන්ද, උපසම්පන්න, අනුපසම්පන්න වශයෙන් ද කොටස් වලට බෙදේ. මේ නොයෙක් ආකාර ශ්‍රාවක පිරිසක් සිටියත්, මහාසංඝරත්නය යනුවෙන් සළකන ශ්‍රාවක පිරිස ඉතාමත් ශ්‍රේෂ්ඨයි., උත්තමයි යනු පිළිගැනීමයි. මහා සංඝරත්නයේ ගුණය මහත්ය. මහා සංඝරත්නයේ ප්‍රමාණය ගණනින් සීමා කළ නොහැකිය. ගුණයෙන් ප්‍රමාණය කළ නොහැකිය. ශාසනයේ චිර පැවැත්ම මහා සංඝ රත්නය සතුව පවතී. යුගල වශයෙන් සතරක් හා පුද්ගල වශයෙන් අටක් වේ. මාර්ගස්ථ හතරදෙනයි. ඵලස්ථ හතර දෙනයි යනුවෙනි. අධි සීල, අධිචිත්ත, අධිප්‍රඥා, ශික්ෂා ගෞරවය රකිනුයේ මහා සංඝ රත්නයයි. එතුමන් වහන්සේලාගේ ප්‍රතිපදාව ඉතාමත්ම රමණීයයි. සම්‍යක් ප්‍රතිපදාවෙන් යුක්තයි. ශාසන ධර්මය මනාව පිළිපන් හෙයින්ද, ආර්ය මාර්ග ප්‍රතිපදාවට පිළිපන් හෙයින්ද, ගෞරව කළ යුතු මාර්ගයට පිළිපන් හෙයින්ද, ඉතා දුර සිට වුවද ගෙන වුත් දීමට සුදුසු ගුණයෙන් යුක්ත වූ හෙයින්ද, ආගන්තුක සත්කාරයන්ට පිළියෙල කළ දෙයක් වූවත්. දීමට සුදුසු හෙයින්ද, පරලොව සැප පතා දෙන දෙයක් දීමට සුදුසු වූ හෙයින්ද, දෑගිලි බැඳ නමස්කාර කිරීමට සුදුසු ගුණයෙන් යුක්ත වූ හෙයින්ද, ලෝකයාගේ හිත සුව පිණිස කටයුතු කරන හෙයින්ද මහා සංඝ රත්නය ඉතා වටිනා ගුණාංග නවයකින් යුක්ත වන හෙයින්ද, ගුණය අනන්තයි, අප්‍රමාණයි, බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක බුද්ධ පුත්‍රයන් වහන්සේලා වැඩ සිටීම අපට ශාසනයට ලොකු පිහිටකි, උපකාරයකි, එමෙන්ම අපගේ ලෞකික ජීවිතය සැපවත් කර ගැනීමටත්, ලෝකෝත්තර ජීවිතයට පත් වීමටත් මහත් උපකාරයකි. තමන් වහන්සේලාගේ උතුම් ගුණය සිහිපත් කිරීම අනුස්සති භාවනාවකි. උපචාර සමාධියක් ලැබිය හැකි උතුම් ගුණයකි. බුදුරජාණන් වහන්සේගේ උතුම් ශ්‍රාවක භාවයට පත් වූවා වූ සැරියුත් මුගලන් පරම්පරාවෙන් පැවතගෙන එන අවිච්ඡින්නව ශාසන ප්‍රතිපදාව ඉදිරියට ගෙන යනු ලබන්නේ පරියප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේදය දන්නාවූ බුද්ධ පුත්‍රයන් වහන්සේලාය. එවැනි උතුමන් වහන්සේලාගේ කල්‍යාණ මිත්‍ර ඇසුර නිසා ජීවිතයක් යහපතට නංවා ගැනීමට ඉතා මහගු උපකාරයක් වේ. ශාසනික උතුම් පාරමී ධර්මයන් සපුරාලීමට ආමිස ප්‍රතිපත්ති, සමථ විපස්සනා ආදී, උතුම් ගුණ ධර්මයන්ගෙන් ස්වකිය සන්තානය පෝෂණය කර ගැනීමට උපකාරි වේ. නිවන් මග සුගති මග පාදා දෙන කල්‍යාණ මිත්‍රයන්ගේ ඇසුර අප සැම දෙනාටම නිවන

දක්වාම උපකාරී වේවා! මෙවැනි උතුම් සංඝ රත්නයේ ගුණය අප සැම දෙනාගේ සිතට දහම් සැනසිල්ලක් වේවා! දෙලොව ජයගෙන, පැතූ බෝධි ඥානයන් සපුරා ගැනීමටත් සුවසේම පාරමී පුරා අති උතුම් නිවන් සුවය අවබෝධ කර ගැනීමටත් උපකාරි වේවා! සියල්ලෝම සඟ ගුණ වඩත්වා.! නිවනින් සැනසෙත්වා!.

| | | |
|---|---|---|
| තසමා හවේ අපපමාදං | - | කයිරාථ සුමෙධසො |
| එවං මහානුභාවාය | - | සංඝානුසසතියා සදා |

"සඟ ගුණ භාවනාව යම් හෙයකින් මහානුභාව සම්පන්න වේද, එසේ හෙයින් සිල්වත් නැණවන්තයා අප්‍රමාදව සඟ ගුණ භාවනාව වඩන්නේය"

## <u>මෛත්‍රී භාවනාව</u>

සම්බුද්ධ සාසනික වශයෙනුත් සාසනයෙන් පිටත් මෛත්‍රිය වැඩිය හැක. මෛත්‍රිය යනු ද්වේශයට පති පක්‍ෂ වූ අද්වේශය හෙවත් මෛත්‍රියයි. සතර බ්‍රහ්ම විවරණය සමඟ වඩන මෛත්‍රිය මහා බෝසතාණන් වහන්සේලාගේ මෛත්‍රියයි. බෝධිසත්ව ගුණයක් වඩන ලමා කාලයට මෙය ඉතා ප්‍රයෝජනය. වෛරය, ක්‍රෝධය, ඊර්ෂාව, මසුරුකම වැනි සිතිවිලි වලින් ඇතිවන පීඩාවන් සන්සිඳු වීමට ඇති මෛත්‍රිය ඉතාමත් ප්‍රයොජනවත් වේ. ගෙදර මව්පියන් සමඟ සමගියෙන් ජීවත් වෙන්න, සහෝදර සහෝදරියන් සමඟ ජීවත් වෙන්න, පාසලේදී යහළු මිතුරු මිතුරියන් සමඟ සමගියෙන් ඉගෙන ගැනීමට ඉතා ප්‍රයොජනවත්ය. තමාගේ මනස ඉතා හොඳින් තබා ගැනීමට මෛත්‍රිය ඉතාමත් ප්‍රයොජනවත්ය. ඉතා සුන්දර නිරෝගී මනසක් ඇතිකර ගන්නට මෛත්‍රිය ඉතාමත් ප්‍රයෝජනය. මෙය වචනයෙන් නිතර කිය යුතු පුරුදු කර යුතු අරමුණකි. යහපත් ගුණගරුක ජීවිතයක් අනාගතයෙහි ලබන්නට මෛත්‍රිය ඉතාමත් ප්‍රයොජනවත් වෙයි. ළමා කාලයෙහි මෙය සියල්ලෝම මනාව පුරුදු කර ගනිත්වා.



### භාවනා වාක්‍ය - (තමන්ට)

| | |
|---|---|
| අහං අවේරො හොමි | - මම වෛර නොකරමි |
| අහං අබ්‍යාපජ්ජෝ හොමි | - මම තරහ නොවෙමි |
| අහං අනීඝො හොමි | - මම නිදුක් නීරෝගී වෙමි |
| අහං සුඛී අත්තානං පරිහරාමි | - මම සැප ඇත්තෙක් වෙමි |

මෙ වැඩි වෙලාවක් තමන්ට මෙත් වඩන්න.

### ගුරුවරුන්ට මෙත් වැඩීම

අහං විය මය්හං - ආචරියෝ අවේරා හොන්තු
මා මෙන් මාගේ ගුරුවරයා වෛර ඇත්තෝ නොවෙත්වා.!

අහං විය මය්හං - ආචරියෝ අබ්‍යාපජ්ජෝ හොමී
මා මෙන් මාගේ ගුරුවරයා තරහා ඇත්තෝ නොවෙත්වා.!

අහං විය මය්හං - ආචරියෝ අනිඝා හොතු
මා මෙන් මාගේ ගුරුවරයා නිදුක් නීරෝගී වෙත්වා.!

අහං විය මය්හං - ආචරියෝ සුඛී අත්තාන පරිහරන්තු
මා මෙන් මාගේ ගුරුවරයා සැප ඇත්තෝ වෙත්වා!

### මව්පියන්ට මෙත් වැඩීම

අහං විය මය්හං මාතා පිතරො අවේරා හොන්තු
මා මෙන් මාගේ මව්පියෝ වෛර ඇත්තෝ නොවෙත්වා!

අහං විය මය්හං මාතා පිතරෝ අබ්‍යාපජ්ජො හොන්තු
මා මෙන් මාගේ මව්පියෝ තරහා නැත්තෝ වෙත්වා!

අහං විය මය්හං මාතාපිතරෝ අනීඝා හොන්තු

මා මෙන් මාගේ මව්පියෝ නිදුක් නීරෝගී වෙත්වා!

අහං විය මය්හං මාතා පිතරො සුඛී අත්තානං පරි හරන්තු
මා මෙන් මාගේ මව්පියෝ සැප ඇත්තෝ වෙත්වා!

## හිතවත් සත්ත්වයෝ (භාතරාභගිනි)
## සහෝදර සහෝදරියෝ

අහං විය මය්හං භාතරාභගිනි (හිතසත්තා) අවේරා හොන්තු!
මා මෙන් මාගේ සහෝදර, සහෝදරියෝ (හිතවත්) වෛර නොවෙත්වා!
අහං විය මය්හං භාතරාභගිනි (හිතසත්තා) අබ්‍යාපජ්ජො හොන්තු!

මා මෙන් මාගේ සහෝදර, සහෝදරියෝ (හිතවත්) තරහා ඇත්තෝ නොවෙත්වා!
අහං විය මය්හං භාතරාභගිනි(හිතසත්තා) අනිඝා හොන්තු
මා මෙන් මාගේ සහෝදර, සහෝදරියෝ(හිතවත්) නිරෝගී වෙත්වා
අහං විය මය්හං භාතරාභගිනි(හිතසත්තා) සුඛි අත්තානං පරිහරන්තු
මා මෙන් මාගේ සහෝදර, සහෝදරියෝ(හිතවත්) සැප ඇත්තෝ වෙත්වා!

## හිතවත් සත්වයෝ (මාතුල,මාතුලානි)
## මාමා, නැන්දා

අහං විය මය්හං මතුල,මතුලානි අවේරා හොන්තු
මා මෙන් මාගේ මාමා, නැන්දා වෛර නොවෙත්වා!

අහං විය මය්හං මතුල,මතුලානි අබ්‍යාපජ්ජා හොන්තු
මා මෙන් මාගේ මාමා නැන්දා තරහා නොවෙත්වා!



අහං විය මය්හං මතුල,මතුලානි අනිඝා හොන්තු
මා මෙන් මාගේ මාමා නැන්දා නිදුක් නීරෝගී වෙත්වා!

අහං විය මය්හං මතුල,මතුලානි සුඛි අත්තානං පරිහරන්තු
මා මෙන් මාගේ මාමා නැන්දා සැප ඇත්තෝ වෙත්වා!

## නෑදෑ හිත සත්වයෝ.(හිතසත්තා)

අහං විය මය්හං හිත සත්තා අවේරා හොන්තු
මා මෙන් මාගේ නෑදෑ හිත සත්වයෝ වෛර නොවෙත්වා!

අහං විය මය්හං හිත සත්තා අබ්‍යාපජ්ජා හොන්තු
මා මෙන් මාගේ නෑදෑ හිත සත්වයෝ තරහා නොවෙත්වා!

අහං විය මය්හං හිත සත්තා අනිඝා හොන්තු
මා මෙන් මාගේ නෑදෑ හිත සත්වයෝ නිදුක් නිරෝගී වෙත්වා!
අහං විය මය්හං හිත සත්තා සුඛි අත්තානං පරිහන්තු
මා මෙන් මාගේ නෑදෑ හිත සත්ත්වයෝ සැප ඇත්තෝ වෙත්වා!

## මැදහත් සත්ත්වයෝ(මජ්ඣත්තික සත්තා)
## නෑදෑ හිතවත් නොවන

අහං විය මය්හං මජ්ඣත්තික සත්තා අවේරා හොන්තු
මා මෙන් මාගේ මැදිහත් සත්වයෝ (නෑදෑ හිතවත් නොවන) වෛර නොවෙත්වා!

අහං විය මය්හං මජ්ඣත්තික සත්තා අබ්‍යාපජ්ජා හොන්තු
මා මෙන් මාගේ මැදිහත් සත්වයෝ (නෑදෑ හිතවත් නොවන) තරහා නොවෙත්වා!

අහං විය මය්හං මජ්ඣත්තික සත්තා අනිඝා හොන්තු
මා මෙන් මාගේ මැදිහත් සත්වයෝ (නෑදෑ හිතවත් නොවන) නිදුක් නීරෝගී වෙත්වා!

අහං විය මය්හං මජ්ඣත්තික සත්තා සුඛී අත්තානං පරිහරන්තු
මා මෙන් මාගේ මැදිහත් සත්වයෝ (නෑදෑ හිතවත් නොවන) සැප ඇත්තෝ වෙත්වා!

## වෛරී සත්ත්වයෝ (වේරීසත්තා)

අහං විය මය්හං වේරිසත්තා අවේරා හොන්තු
මා මෙන් මාගේ වෛර සත්ත්වයෝ වෛර නොවේත්වා!

අහං විය මය්හං වේරිසත්තා අබ්‍යාපජ්ජා හොන්තු
මා මෙන් මාගේ වෛර සත්ත්වයෝ තරහා නොවේත්වා!

අහං විය මය්හං වේරිසත්තා අනීඝා හොන්තු
මා මෙන් මාගේ වෛර සත්ත්වයෝ නිදුක් නීරෝගී වෙත්වා!
අහං විය මය්හං වේරිසත්තා සුඛී අත්තානං පරිහරන්තු
මා මෙන් මාගේ වෛර සත්වයෝ නිදුක් සැප ඇත්තෝ වෙත්වා

## සියලු සත්ත්වයෝ (සබ්බේ සත්තා)
## සියලුම සත්ත්වයෝ

අහං විය මය්හං සබ්බේ සත්තා අවේරා හොන්තු
මා මෙන් මාගේ සියලුම සත්වයෝ වෛර නෙවෙත්වා!

අහං විය මය්හං සබ්බේ සත්තා අබ්‍යාපජ්ජා හොන්තු
මා මෙන් මාගේ සියලුම සත්වයෝ තරහා නෙවෙත්වා!

අහං විය මය්හං සබ්බේ සත්තා අනීඝා හොන්තු
මා මෙන් මාගේ සියලුම සත්වයෝ නිදුක් නීරෝගී වෙත්වා!

අහං විය මය්හං සබ්බේ සත්තා සුඛී අත්තානං පරිහරන්තු
මා මෙන් මාගේ සියලුම සත්වයෝ සැප ඇත්තෝ වෙත්වා!

මෙසේ තමන්ට මෙත් වඩා ගුරුවරු මව්පියෝ සහෝදර



සහෝදරියෝ මාමා, නැන්ද, ඥාතී හිත මිත්‍රාදීන්ට මැදිහත් සත්වයන් (නෑදෑ නොවන පිට අය) වෛරී සත්වයන්ට සියලු සත්වයන්ට මෙත් වඩන්න.

## <u>මව්පිය දරු යුතුකම්</u>

### බෞද්ධ මව්පියන් ළඟ තිබිය යුතු ගුණධර්ම

1. ''පාපා නිවාරෙන්ති'' - යහපත් මව්පියන් විසින් තම දරුවන් දස අකුසල්වලින් වළක්වා පාප ක්‍රියා, පාප වචන, පාප සිතුවිලි වලින් වළක්වා ගැනීම, නිරන්තරයෙන් 'උත්සාහවත්' විය යුතුයි.

2. ''කල්‍යාණෙ නිවෙසෙනති'' - ස්වකීය දරුවන් පව්කම්වලින් මුදවා ගෙන හොඳ යහපත් කුසල කර්මවල යොදවා දස කුසල ධර්මයෙහි යෙදී දාන, සීල, භාවනා ආමිස, ප්‍රතිපත්ති, සමථ විපස්සනා සදාචාර සම්පන්න සිංහල බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර, සිරිත් විරිත්, ඉතා හොඳින් කියාදී, හොඳ අනාගතයකට මගපෙන්වන්න උත්සාහවත් විය යුතුය.

3. ''සිප්පං සික්ඛාපෙනති'' - ස්වකීය දරු පිරිසගේ අනාගත දියුණුව සඳහා මොනයම් හෝ ශිල්ප ශාස්ත්‍රයක් ඉගැන්විය යුතුය. යහපත් ආර්ථිකයකට සහ සත්පුරුෂ ගුණ ධර්ම වැඩෙන ලෙස මනාව ඉගැන්විය යුතුය.

4. පතිරූපෙන දාරෙන සංයෝංජනති'' - තමන්ගේ දරුවන් නිසි වයසට පැමිණෙන විට අවාහ විවාහ ආදිය දෙමව්පියන් විසින් මනාව කරදිය යුතුය.

5. ''සමයෙ දායජ්ජං නියයාදෙනති'' - තම දරුවා නිසි වයසට පැමිණෙන විට තමන් සන්තක නිසි දේපළ සමව දරුවන්ට නිසි ලෙස පවරාදීම ගුණවත් මව්පියන්ගේ යුතුකමකි.

## 2. බෞද්ධ දරුවන් තුළ තිබිය යුතු ගුණධර්ම

1. ''භතො නෙ සම්භරිස්සාමි'' - ස්වකීය මව්පිය දේපළ ජීවත්ව සිටියදී ආදරය ගෞරවය ඇතිව කෑම්බීම්, ඇඳුම්, පැළඳුම්, බෙහෙත් හේත් ආදිය සපයා දීමෙන් තම ශක්ති ප්‍රමාණයෙන් සියතින් තම දයාබර මව්පිය දෙපළට උපස්ථාන කළ යුතුය.

2.''කිච්චං නෙසං කරිස්සාමි'' - ස්වකීය මව්පිය පරම්පරාවෙන් පැවත එන චාරිත්‍ර වාරිත්‍ර, සිංහල බෞද්ධ සිරිත් විරිත්, සිංහල බෞද්ධ චාරිත්‍ර, පුහුණු කිරීමෙන් හා තම මව්පියන්ගේ වැඩ කටයුතු වලට නොපිරිහෙලා උදව් උපකාර කළ යුතුය.

3.''කුල වංසං ඨපෙස්සාමි'' - ස්වකීය මව්පිය දෙපළගේ කුල පරම්පරාවෙන් පැවත ගෙන එන කුල සිරිත් වෙනස් නොකොට කැළලක් නොවන පරිද්දෙන් ආරක්ෂා කිරීමද බෞද්ධ දරුවාගේ යුතුකම විය යුතුය.
4.''දායජ්ජං පටිපජ්ජාමි'' - ස්වකිය පරම්පරාවෙන් පැවත ගෙන එන මව්පියන් සන්තක වස්තුව දරුවා නිසි වයසට පැමිණෙන විට දරුවාට පැවරෙන ඉඩකඩම්, මිළ මුදල් රන් රිදී ආදි වස්තුව මනාව දරුවා ආරක්ෂා කරනවා නම් මව්පිය දෙපළට කරන උපකාරයකි.

5. ''අථවාපන පෙතානං කාල කතානං දක්ඛිණං අනුපදස්සාමි'' ස්වකීය මව්පිය දෙපළ නිසි වයසේදී මියපරලොව ගිය පසු සිය ප්‍රාණකාරයින් සිහිපත් කරමින් ශාසනික වශයෙන් ප්‍රාප්ති දානමය පිංකම් සිදුකොට සිය මව්පියන්ට පිං අනුමෝදන් කොට පිං පැවරීම දරුවන් විසින් කළ යුතු ඥාති ධර්මයකි කළ ගුණ සැළකීමකි.



## ගුරුවර ශිෂ්‍ය යුතුකම්

### බෞද්ධ ගුරුවරයෙක් තුළ තිබිය යුතු යුතුකම්

1. ''සුවිනීතං විනෙනන්ති'' - ස්වකීය පාසලෙහි හෝ පන්ති කාමරයෙහි හැසිරෙන ශිෂ්‍යයාගේ විනය ආචාර සමාචාර පැවතුම් පාසලෙහි විනය ගරුත්වය, ගුරු මණ්ඩලයෙහි ගරුත්වය, තම ශිෂ්‍යයාගේ ආත්ම ගරුත්වය, රැකෙන පරිදි හොඳ සිරිත් විරිත් ගති පැවතුම් විනය මනාව පුහුණු කළ යුතුය.

2. ''සුග්ගහිතගහා පෙනන්ති'' - තමාගෙන් ඉගෙනුම ලබන සිසු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර දීම සඳහා යහපත් ලෙස අනුපිළිවෙලින් නිවැරදිව නිරවුල්ව මනාව ශිල්ප ශාස්ත්‍ර පුහුණු කළ යුතුය. කියාදිය යුතුය.

3. ''සබ්බ සිප්ප සුතං සමක්ඛායිනො භවන්ති'' තමන් ඉගෙන ගත් සියලුම ශිල්ප ශාස්ත්‍ර කිසි අඩුවක් නොකොට ශිෂ්‍යයන්ගේ දියුණුව සඳහා මනාව ශිල්ප ශාස්ත්‍ර ඉගැන්විය යුතුය.

4. ''මිත්තා මච්චෙසු පටිවේදෙන්ති'' - තමන් යටතේ මනාව ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගන්නා සුවච කීකරු ශිෂ්‍යයන්ගේ ගුණය තම මිතුරන්ට පෙන්වා දිය යුතුය.

### බෞද්ධ ශිෂ්‍යයෙක් තුළ තිබිය යුතු ගුණ ධර්ම

1. ''උට්ඨානෙන'' - තම අධ්‍යාපන කටයුතු දියුණු කරගැනීම සඳහා මනාව මාර්ගය පෙන්වන ගුරුවරයා දුරදීම දක හිඳගෙන සිටිනවා නම් වහාම අසුනෙන් නැගිටිය යුතුය. ආචාර කළ යුතුය.

2. ''උපට්ඨානෙන'' - ශිල්පය ලබා දෙන ගුරුවරයා කෙරෙහි භක්තියෙන් තමන්ට හැකි අයුරින් දවසකට තුන් වේලක් උපස්ථාන කළ යුතුය. හැකි නම් තැනට සුදු වේලාවන්හි සිය උපස්ථානය නොපිරිහෙලා සම්පූර්ණ කළ යුතුය.

3. ''සුස්සුසාය'' - තමාට ශිල්පය ලබාදෙන ගුරු උතුමන් කෙරෙහි සුවච කීකරු බව, යටහත් පහත් ගති පැවතුම් ඇතිව සියලු කටයුතු අසා බලාම කළ යුතුය.

4. ''පාරිචරියාය'' - ස්වකීය ගුරුවරයා වෙනුවෙන් කළ යුතු දෙයක් ඉතා ඕනෑකමින් ගෞරවයෙන් ගුරු භක්තියෙන් කර දිය යුතුය. ලොකු කුඩා සියලු වැඩ කටයුතු නොපිරිහෙලා මනාව සපුරා දිය යුතුය.

5. ''සකකචචං සිපප පටිගගහනෙන'' - තමා ඉගෙන ගන්න පාඨමාලාව මනාව සකස්කර ගනිමින් ශිල්පයට ආදර ගෞරවය දක්වා අනුපිළිවෙලින් ඉගෙන ගත යුතුය.

මෙසේ ඉගෙනීමේ කටයුතු වල යෙදෙන දරුවාට දිවිහිමියෙන් ගුරු භක්තිය ගුරු උපස්ථානය හේතුකොට ගෙන සසර වසනා තුරු කල්‍යාණ මිත්‍ර සම්පත ලබා බෝසත් ගුණයෙහි පිහිටා ගුරු උවටැන් දෙලොව දියුණු සඳහාම කළයුතු වන්නේය.

## ඡත්ත මානවක වස්තුව

ලෝකය සනසා ලන්නට විසි අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් මුළුල්ලේ පාරමී ධර්මය පුරා දස දහසක් ලෝක ධාතුව කම්පා කරමින්, ලොව්තුරා බුද්ධත්වය ලබාගෙන හේතු සම්පත් ඇති අයගේ හේතු සම්පත් දක, ලෝකයාට පිහිට පිණිස අනාථ පිණ්ඩික සිටුවරයා විසින් සාදා දෙන ලද ජේතවන මහා විහාරයෙහි වැඩ වාසය කරන සමයේ දී, එක් අවස්ථාවක ලොව බලා වදාරන අවස්ථාවක භාග්‍යවතුන් වහන්සේගේ මහා කරුණා ගුණයට පෙනුන ඡත්ත මානවක තරුණයාගේ මරණය දක ඔහුට පිහිට විය.

එදා සෙතව්‍ය නගරයේ එක්තරා බ්‍රාහ්මණයෙකු හට ඡත්ත නම් කුමාරයෙක් විය. ඔහු තම පියාගේ උපදෙස් මත උක්කට්ඨ නම් නුවර පොක්ඛරසාති නම් බ්‍රාහ්මණයා සමීපයෙහි ඉගෙනීමේ කටයුතු කර ගැනීම සඳහා පැමිණ ශාස්ත්‍ර ඉගෙනීම ආරම්භ කලහ. ඡත්ත මානවක බ්‍රාහ්මණ කුමාරයා නුවණැති කෙනෙක් නිසා ඉතා අනලස්ව ඉතා ඉක්මණින් සුලු කාලයක දී මන්ත්‍ර ආදියත් සමග



බ්‍රාහ්මණ ධර්මය නිමාවට පත් කළහ. හෙතෙම තම ආචාර්යවරයා සමීපයට ගොස් වැද නමස්කාර අවසර ගෙන මව්පියන් කරා යාමට මත්තෙන් ගුරු පඬුරක් වශයෙන් ගුරු පූජාවක් වශයෙන් කවර පඬුරක් අවශ්‍ය දැයි ඇසීය. බ්‍රාහ්මණ ඇදුරුතුමා (ඉගෙන ගන්න ශිෂ්‍යයන්ගෙන් වත්කම අනුව සිදුවිය යුතුය.) එහෙනම් කහවනු දෙදහසක් ගෙන එන්න යැයි කීහ. ඉන්පසු ඇඳුරුතුමා වැඳ තමන්ගේ මවුපියන් වසන සෙතව්‍ය නුවරට ගොස් මව්පියන් වැඳ තම ශිල්පය නිමාවට පත්කල බව කියා මව්පියන් සන්තෝෂයට පත්කොට එම ගුරුපඬුරු පූජාව ගැන තම පියාණන්ට දන් වූහ. එම දිය යුතු දෙය මට දෙන්න මම අදම ගොස් එම ගුරු පූජාව කර එන්නම් කියා, කියුවේය. කරුණාවන්ත මවුපියන් අද දැන් සුදුසු කාලය නොවෙයි හෙට උදෑසන යන්න යැයි කීහ. මව්පියන් එම කහවනු දෙදහස ගෙන පසුම්බියක් කොට සකසා බැඳ තැබූහ. කෙසේ නමුත් මෙය දැනගත් සොර කණ්ඩායමක් ඡත්ත මානවක තෙමේ මරා මුදල් පැහැර ගැනීමට මග රැක සැඟවී සිටියහ.

පසුදා අලුයම් කාලයෙහි මහා කරුණා සමාපත්තියෙන් නැගී සිට ලොව බලා වදාරන භාග්‍යවතුන් වහන්සේගේ බුදු නුවණට ඡත්ත මානවක ගේ තුරුණුවන් සරණ යාමත්, සීලයක පිහිට වීමත්, සොරු විසින් මරණ ලද කල්හි දෙව්ලොව ඉපදීමත්, ඉන් පසුව දෙව් විමානයත් සමඟ පැමිණ ඔහු එම ආදාහන ස්ථානයට පැමිණ ධර්මය අසා. සිටීමත් රැස්ව සිටියා වූ පිරිසට ධර්ම අවබෝධය සිදුවන බව දැනගත් භාග්‍යවතුන් වහන්සේ එම ඡත්ත මානවක තෙමේ යන ගමන් මාර්ගය වෙත එම මානවක තෙමේ යාමට ප්‍රථමයෙන් භාග්‍යවතුන් වහන්සේ වැඩම කර එම මාර්ගය සමීපයේ ගසක් මුල වැඩ වුන් සේක.

පසුදා උදෑසන ඡත්ත මානවක තෙමේ මවුපියන් වැද එම ගුරු පඬුරුත් රැගෙන සේතව්‍ය නගරයෙන් පිටත්ව උක්කට්ඨ නුවරට යන අතර මග දී ගසක් මුල වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේ දැක භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගියහ. භාග්‍යවතුන් වහන්සේ අසා වදාළා මානවකය, ඔබ කොහි යන්නේද කියා. භාග්‍යවත් ගෞතමයාණන් වහන්ස මට ශිල්පය කියා දුන් ආචාරවරයාට පුද පඬුරු ගුරු පූජාවක් සඳහා මම උක්කට්ඨ නුවරට යන්නෙමි යැයි කීහ. භාග්‍යවතුන් වහන්සේ මානවකයගෙන් අසා සිටියා ඔබ තුන්සරණ සහ පන්සිල් පද දන්නෙහිද කියා. භාග්‍යවතුන් වහන්සේ මේ ඡත්ත මානවක තරුණයාට තිසරණයේ සහ පන්සිල් වල

ආනිසංසය කියා දී මෙය මේ ආකාරයෙන් දැනගන්න යැයි වඳාල සේක. ඉන්පසු ඡත්ත මානවක තෙමේ භාග්‍යවතුන් වහන්සේගෙන් මට කියා දෙනු මැනවැයි ඉල්ලා සිටියේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහු ගේ රුචියට අනුව ගාථා බන්ධන වශයෙන් දක්වමින් ගාථාවන් තුනකින් මෙසේ දේශනා කර වදාළ සේක.

යො වදතං පව රෝමනුජේසු
සක්‍ය මුනී භගවා කත කිච්චො
පාරගතෝ බල විරිය සමංගි
තං සුගතං සරණත්‍ථ මුපේහී.

මිනිසුන් අතරින් ඉතාමත් ශ්‍රේෂ්ඨ වූ උතුම් වූ ශාඛ්‍ය මුනීන්‍ද්‍රයන් වහන්සේ කෙලෙස් නිම කරන ලද නිවනට කළ යුතු වැඩ නිමකළ ආත්ම දෘෂ්ඨියෙන් එතෙර වුන කාය බල ඥාණ බලයෙන් පරතෙරට ගිය ප්‍රධන් විරියෙන් යුත්ත යමෙක් වේද. එම මුනීන්‍ද්‍රයන් වහන්සේ, සුගත තථාගතයන් වහන්සේ මෙන්ද එතුමන් වහන්සේ මම පිහිට කොට සරණ යන්නෙමි.

රාග,විරාග මනේජව සොකං
ධම්ම වසංඛත මප්පටිකූලං
මධුර විමං පගුණං සුවි හත්තං
ධම්ම විමං සරණත්ථ මුපේහි

ආර්ය මාර්ග සහිත වූ අරහත් ඵලය සහිත වූ රාගය දුරුකලා වූ, තෘෂ්ණාව රහිත වූ ශෝකය රහිත වූ, හේතුවකින් හට නොගන්නා වූ, ඉතා මිහිරි වූ, ඉතා මධුර වූ සර්වඥතා ඥාණය ඇසුරු කොට පවතින්නා වූ මේ පරියාප්ති ධර්මය පිහිට කොට මම සරණ යන්නෙමි.

යත්ථච දින්න මහප්ඵල මාහු
චතුසු සුචීසු පුරිස යුගේසු
අට්ඨච පුග්ගල ධම්ම දසාතෙ
සංඝම්මං සරණත්ථ මුපේහි

යම් බඳු ආර්ය මහා සංඝ රත්නයට දෙන ලද දානය මහත්ඵල යැයි කියන ලද්දේ ද, ඒ පිරිසිදු යුගල පුරුෂ සතරයෙහිද,



දක්වන ලද පුද්ගලයන් වශයෙන් අට දෙනෙක්ද යන මේ සංඝයා පිහිට කොට මම වසන්නෙමි.

යන්නෙන් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ වදාළ කල ඡත්ත මානවක තෙමේ මේ තුන් සරණ සිහි කරමි වශයෙන් සරණ සීලයෙහි පිහිට තමාගේ හදවතෙහි පිහිටුවාගෙන එක් එක් ගාථාව වෙන වෙනම කීවේ ය. බුදුරජාණන් වහන්සේ එම ගාථාවන් කියවා ශික්‍ෂා පද සහ ඒවා ගේ යථා ස්වභාවය සහ ආනිංසයන් විපාක වශයෙන් අනුභස් වශයෙන් ද පැහැදිලි කොට ඒවා සමාදන් වන ආකාරය වදාළ සේක. ඡත්ත මානවක තෙමේ මනාව සිතෙහි දරාගෙන ප්‍රසන්න වූ මනසකින් භාග්‍යවතුන් වහන්සේ වැඳ රත්නත්‍රයේ ගුණ සිහිපත් කරමින් ගමන ආරම්භ කළේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට දෙව්ලොව ඉපදීම ප්‍රමාණවත් වේ යැයි සිතා ජේතවන මහ විහාරයට වැඩි සේක.

මෙසේ රත්නත්‍රයේ ගුණ සිහිපත් කරමින් පංච සීලයෙහි ආනිසංස සිහියට නගා ගෙන යන අතරමග දී සොරු කණ්ඩායම ඔහු වට කොට එක හොරෙක් තියුණු විෂ පෙවූ ඊයකින් ඔහු මරණයට පත්කොට කහවනු පොදිය ගෙන ඔහු ගේ සහචරයන් සමඟ එතනින් පලා ගියේ ය. ඡත්ත මානවක තෙමේ එම වේලාවේ සිහි කර කර ගිය තුණුරුවන් ගේ ගුණය සහ පංච සීලයේ ආනිසංස නිසා ඔහු කළුරිය කොට තව්තිසා දෙව්ලොව තිස් යොදුන් රන් විමානයක නිදා පිබිදියාක් මෙන් දිව්‍ය අප්සරාවන් දහසක් පිරිවර ඇතිව ගැල් සැටක් බර ආභරණයෙන් සැරසුණු සිරුරක් ඇතිව පහළ විය. එම විමානයේ ආලෝකය යොදුන් විස්සක් ඈතට විහිදෙන්නේ ය. මෙවැනි උතුම් ආනිසංස ඵලයක් ලැබුණේ රත්නත්‍රය සරණ යාමත් සීලයේ ආනිසංසයත් සිහි නුවණින් මෙනෙහි කර කර ගිය නිසාය.

ඡත්ත මානවක මරණයට පත් වුණ බව සෙතව්‍ය නුවරට යන අය මව්පියන්ටද ඥාතීන්ටද දැන්වූහ. උක්බට්ඨ නුවරට යන අය පොක්ඛරසාති බ්‍රාහ්මණයාටද දැන් වූහ.

එය ඇසූ මව්පියන් අතුළු ඥාතීන්ද පොක්ඛරසාති බ්‍රාහ්මණයා ඇතුලු පිරිස ඇඬූ කඳුලින් යුතු ව ඡත්ත මානවක මරණයට පත්කළ තැනට පැමිණියහ. දෙනුවරින්ම ආ පිරිස සමහර අය වැ පොරෝ ආදියද රැගෙනව පැමිණියෝ ය. ඒ දෙගොල්ලෝම

මහා සමාගමකින් මෙන් වැඩ කටයුතු කරන්නට පටන් ගත්හ. එම ඥාතීන් මාර්ගයට නුදුරින් අදහන කටයුතු කරන්න චිතකයක් සාදවා මාතෘ ශරීරය දවාලන්නට, අවසාන ගෞරවය කරන්නට වැඩ කටයුතු සංවිධානය කළහ. වැඩ ආරම්භ කළහ.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතූහ. මම දැන් එතනට වැඩි කල්හි ඡත්ත මානවක මා වැඳීමට එතනට එන්නේ ය. ඔහු ලවාම තමා කළ පුණ්‍ය කර්මය කියවමින් කර්ම ඵල විපාකය ප්‍රත්‍යක්‍ෂ කරවා මනා දහමක් දේශනා කරන්නෙමි. එකල්හී රැස් වූ වා වූ පිරිස ධර්ම අවබෝධය වන්නේ ය, සිතා භාග්‍යවතුන් වහන්සේ මහත් වූ භික්‍ෂු සංඝයා පිරිසක් සමග එම ප්‍රදේශයෙහි වැඩමවා එක්තරා ගසක් මුල වැඩහුන්නා හ. ඉන්පසු ඡත්ත මානවක දේව පුත්‍රයා තමාට ලැබුණු හේතු සම්පත් ගැන සලකා බලා එය හේතු කරුණු විමසනුයේ සමාදන්වූ සරණාගමණය ද සමාදන් වූ සීලය ද ගැන විශ්මයට පැමිණ ඒ කර්ම ඵල විශ්වාසය කෙරෙහි ප්‍රසාදයට පැමිණ ප්‍රසන්න වූ සිතින් මම දැන්ම ගොසින් භාග්‍යවතුන් වහන්සේද මහා සංඝයාද වඳින්නෙමි. රත්නත්‍රයෙහි ගුණය මහ ජනතාවට පැහැදිලි කරන්නෙමියි සිතමින් කෘතඥතාවය නිසා මුළු ප්‍රදේශයම බබුලුවාගෙන ඒකාලෝක කරගෙන විමානයත් සමගම පැමිණ මහ පිරිසක් සමගම මහත් රූප සම්පත්තිය ඇතිව පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී පාදයට සිරස නමා වැඳ ඇඟිලි බැඳ වැඳ එකස් පසෙක සිටියාය. එම කාරණය රැස්වූ මහ ජනයා දැක කවර නම් දෙවියෙක් ද කවර නම් බ්‍රාහ්ම රාජයෙක් ද කියා සියලුම දෙනා පැමිණ භාග්‍යවතුන් වහන්සේ පිරිවරා ගත්හ.

ඉන්පසු ඔහුගේ පුණ්‍ය කර්මය ඔහු ලවාම ප්‍රකාශ කරනු පිණිස භාග්‍යවතුන් වහන්සේ ඔහුගෙන් මෙසේ ඇසීය. අහසේ සූර්‍ය්‍යා චන්ද්‍රයා මෙසේ නොබබළයි. කිසිවිටක සමාන නොවන මහත් ආලෝකයක් ඇතිව දෙව්ලොවින් මහ පොළොවට පැමිණ ඔබ කවර නම් කෙනෙක් වන්නෙහිද? පිරිසිදු වූ විමල සුන්දර වූ ඔබගේ විමානය සූර්‍ය්‍ය රශ්මියද යහපත් කරයි. යොදුන් විස්සක දුරට ආලෝකය පැතිරෙයි. රාත්‍රියද දවල් මෙන් බැබළෙයි. රන් පියුම් සුදු නෙළුම් වෙනත් මල් වලින් ගැවසීගෙන විසිතුරු ලෙස රන් දැලින් වැසී සූර්යයා මෙන් බබළයි. රතු සුදු කහ වස්ත්‍රයෙන් සැරසුනු අගිල් සඳුන් ආදී රාශියකින් ආලේපිතව රත්රන් පැහැති සමකින් යුතුව තරු වලින් පිරුණු ගුවනක් මෙන් බබළයි. විවිධ වර්ණයෙන් යුත් මල් මෙන් මෙහි මල් වලින් පැළඳි සොඳුරු සිත් ඇති දෙව්ලියෝද,



පුරුෂයෝද, වාතය නිසා නිදහස් සුගන්ධ වාතය හමායයි. ආලෝකය විහිදෙන රන්වන් ශරීර ආවරණය කරගෙන බබළයි. මේ තරම් දමනයක් ඇති මේ තරම් විමන් ඵලයක් ඇති කවර නම් කර්ම විපාකයකින්ද, ඔබට මේ වාගේ විමානයක් ලැබුනේ යැයි භාග්‍යවතුන් වහන්සේ ඡත්ත මානවක දේව පුත්‍රයාගෙන් ප්‍රශ්න කළේ ය.

ඡත්ත මානවක දේව පුත්‍රයා ප්‍රකාශයට පත් කළේ භාග්‍යවතුන් වහන්සේගේ පිහිට මෙම මහා මාර්ගයේදීම මට ලැබුණා භාග්‍යවතුන් වහන්සේගෙන් මීට ඉහතදී මෙම පිහිට මම නොලැබුවෙමි. මීට ඉහතදී බුද්ධ ධම්ම සංඝ රත්නය මම සරණ ගියේ නැත. භාග්‍යවතුන් වහන්සේගෙන් එම සරණ යාම මෙම මාර්ගයේම මට ලැබුණි. රත්නත්‍රය සරණ යාමෙන් මට මෙම පිහිට ලැබුණි. ඉහත මම පංච සීලය සරණ යාම දන්නේ නෑ භාග්‍යවතුන් වහන්සේගේ පිහිටෙන් එය මම දැනගත්තා, එය මම නිසි ආකාරවම පිළිගත්තා, පිළිපැද්දා, එම ආනිසංසය මට ලැබුණා කියා ප්‍රකාශ කළා, සිහිපත් කළා. මාගේ මේ මරණය දැනගෙන මා හට අනුකම්පා උපදවා මේ මහ දවල් කරුණාව උපදවා මට පිහිට උනා යැයි කියා රත්නත්‍රය සරණ යෑම පන්සිල් රැකීම පිහිට කොට ජීවිතය ආරක්‍ෂා කර ගත යුතු යැයි කියා භාග්‍යවතුන් වහන්සේ වැඳ භික්‍ෂු සංඝයාට ගෞරව දක්වා මව්පියන් විචාරා දෙව්ලොවට ගියහ. භාග්‍යවතුන් වහන්සේ ද භික්‍ෂු සංඝයා සමග විහාරයට වැඩියහ. ජේතවනාරාමයට රැස්වුනා වූ පිරිසට භාග්‍යවතුන් වහන්සේ මෙම විමාන වස්තු වර්ණනාව විස්තර වශයෙන් දේශනා කළහ. බොහෝ මහ ජනයාට මෙය සාර්ථක දේශනාවක් විය. මෙයින් අපට ගතහැකි වන්නේ රත්නත්‍රය සරණ යාම සහ පඤ්ච සීලය මනාව ආරක්‍ෂා කර ගැනීමයි. මෙය මනාව පිළිපැදිය යුතුමය.

සාධු සාධු සාධු...

## සිල් සමාදන් වුවන් විසින් අත්හළ යුතු දෙතිස්කතාව

1. රජුන් පිළිබඳ කතා ය, 2. සොරුන් පිළිබඳ කතා ය, 3. රජ ඇමතියන් පිළිබඳ කතා ය, 4. සේනා පිළිබද කතාය, 5. භය පිළිබඳ කතා ය, 6. යුද්ධ කතාය, 7. කෑම පිළිබද කතාය, 8. බීම පිළිබඳ කතා

ය, 9. ඇඳුම් පිළිබඳ කතාය, 10. යහන් පිළිබඳ කතාය, 11. මල්මාලා පිළිබඳ කතා ය, 12. සුවඳ පිළිබඳ කතා ය, 13. නෑයන් පිළිබඳ කතා ය, 14. රථ වාහන පිළිබඳ කතා ය, 15. ගම් පිළිබඳ කතා ය, 16. නියම් ගම් පිළිබඳ කතා ය, 17. නගර පිළිබඳ කතා ය, 20 ශූරයන් පිළිබඳ කතා ය, 21. වීථි පිළිබඳ කතා ය, 22. වැව් පොකුණු ආදි ජල ස්ථාන පිළිබඳ කතා ය, 23. මිය ගිය නෑයන් පිළිබඳ කතා ය, 24. නො කියවුණ නොයෙක් දේ පිළිබඳ නිර්ථක කතා ය, 25. විතණ්ඩ කතා නම් වූ නුවණැතියන්ගේ සිත් තැළෙන කතා ය, 26. මුහුද පිළිබඳ කතා ය, 27. ශස්වත වාදය පිළිබඳ කතා ය, 28. උච්ඡේද වාදය පිළිබඳ කතා ය, 29. දියුණුව පිළිබඳ කතා ය, 30. පිරිහීම පිළිබඳ කතා ය, 31. පස්කම් සැප පිළිබඳ කතා ය, 32. ආත්මය පෙළීම පිළිබඳ කතාය යන මේ දෙතිස් කතාවෙන් සිල් රක්නවුන් විසින් වැළකිය යුතු ය.

## දසකතා

1. අල්පේච්ච ජීවිතයේ වටිනාකම ගැන කතා
2. ලද දෙයින් සතුටුවීම ගැන කතා
3. හුදකලා වාසයේ වටිනාකම ගැන කතා
4. විවේකයෙන් බණ භාවනා කිරීම ගැන කතා
5.මහත් උත්සාහයෙන් අකුසල් ප්‍රහාණය කොට කුසල් දහම් උපදවා ගැනීම ගැන කතා
6. සිල් රැකීම ගැන කතා
7. සමාධිය ඇතිකර ගැනීම කතා
8. ප්‍රඥාව ඇතිකර ගැනීම ගැන කතා
9. විමුක්තිය ගැන කතා
10. විමුක්තිඥාණ දර්ශණය ගැන කතා

## දස කුසලය

දස කුසල ධර්ම නම් දස අකුසල ධර්ම පථයෙන් හා එම කර්මය සිදු කරන අංගයන්ට පත් නොවී කාලය ගෙවීමයි. අකුසල ධර්ම පථයෙන් හා එම කර්මය සිදු කරන අංගයන්ට පත් නොවී



කාලය ගෙවීමයි. අකුසලයට ප්‍රතිවිරුද්ධ කුසලයට යොමුවීම.

1. ප්‍රාණඝාතයෙන් වෙන්වී සියලු සතුන්ට මෛත් සිතින් අභය දානය දීම.
2. සොර සිතින් වෙන්වී ලද පමණින් සතුටු වී වාසය කිරීම
3. වරදවා නොහැසිරී සුචරිත ධර්මයෙහි යෙදී වාසය කිරීම
4. බොරුවෙන් වෙන්වී සත්‍ය වචන, කරුණාබර වචන, මෛත්‍රී සහගත නිහතමානී ප්‍රිය වචනවලින් යුක්ත වීම.
5. කේළාම් වචන නොකියා කෙනෙකු හා කෙනෙකු බිඳ නොවන අදහස් ඇති වචන කතා කිරීම.
6. පරුෂ වචන නොකියා කෙනෙකුගේ සිත නොරිද්දන වචන කීම
7. සම්ප්‍රප්ඵලාප නොකියා යහපත පිණිස, මෙලොව පරලොව යහපත පිණිස කථා කිරීම.
8.දැඩි ලෝභයෙන්, මසුරු බවින් වැළකී දන් දීම.
9.අනුන් නැසේවායි නොසිතා අන් අය කෙරෙහි මෙත් සිතින් ජීවත් වීම.
10. වැරදි අරමුණු නොගෙන සැබෑ සම්මා දෘෂ්ඨියෙන් යුක්තව වාසය කිරීම.

## දස විධ පුණ්‍ය ක්‍රියා

1. දානය
2. සීලය
3. භාවනා
4. අපචායනය
5. වෙයාාවච්ච කුසලය
6. ප්‍රාප්තිදානය හෙවත් පින්දීම
7. පින් අනුමෝදන් වීම
8. ධර්ම ශ්‍රවණය
9. ධර්ම දේශනය
10. දිට්ඨිජ්ජු කම්මය හෙවත් අදහස් පිරිසිදු වීම

මෙම ඉහත කී දසවිධ පුණ්‍ය ක්‍රියාවන් සම්පූර්ණ කරන්නට සියල්ලෝම ප්‍රාර්ථනා කරත්වා. කුසලයට, ලැජ්ජානොවේවා,

පිළිකුල් නොවේවා, කිසි ලෙස භය නොවේවා, පින යනු ඉෂ්ඨ ප්‍රිය මනාප වූ සැපයට හේතුවක් වන්නේය. සියල්ලෝම දස විධ පුණ්‍ය ක්‍රියාවෙන් නිවන් මග පැහැදිලි කර ගනිත්වා.

## බෞද්ධයා ගේ ගුණය (උපාසක,උපාසිකා)

1. සාසනික සංඝයා වහන්සේලාගේ සුවදුක් විමසන්නේද ධර්මය අධිපති කොට ජීවත් වන්නේද, දුකේදි සැපේදි සමානව පිහිට වන්නේය.

2. දන් දීමෙහි ඇලුණේ වෙයි. ඥාණවන්තව තුන් සිත පහදවාගෙන දන් දෙන්නේය. කර්ම ඵල විශ්වාසයෙන් දන් දෙයි. දන් දීමෙන් නිවනද බලාපොරොත්තු වෙයි.

3. සර්ඥ ශාසනයෙහි පිරිහීම දැනගෙන ශාසනය නගා සිටුවීමට මහත් උත්සහයක් ගනී.

4. කුතුහල නගින මිථ්‍යා අදහස් අත්හැර සම්මා දිට්ඨියෙන් යහපතම දකින්නේය. හේතුඵල ධර්මයට ගරු කරන්නේය.

5. ජීවිතය පරදුවට තබා ජීවිත පරිත්‍යාගයෙන් සර්වඥයන් වහන්සේ හැර අන් ආගමිකයන් කරා නොයන්නේය.

6. කාය කර්ම වශයෙන් ප්‍රාණඝාත, අදත්තාදාන, කාමේසුමිච්චා චාරයෙන් මනාව ආරක්ෂා කරන්නේය. බොරුකීම, පරුෂ වචන කීම, කේලම් කීම, හිස් වචන කීම ආදියෙන් මනාව ආරක්ෂා කරන්නේ වෙයි.

7. ඇසුරු කරන සෑම දෙනා සමඟම සමගියෙන් සමාදානයෙන් ඇලීමෙන් කටයුතු කරන්නේ වෙයි. මෛත්‍රියෙන් මෙන් කටයුතු කරන්නේ වෙයි.

8. සෑම කල්හිම අනුන්ගේ දියුණුව කැමතිව කටයුතු කරන්නේ



වෙයි. අන්‍යයන්ට ඊර්ෂියා නොකරන්නේ වෙයි.

9. සාසනික වශයෙන් අන් අය රැවටීමෙන්, මුලා කිරීමෙන්, කපටිකම් වලින් තොරව සාසනික වශයෙන් සාසනයෙහි හැසිරෙන්නේ වෙයි.

10. සාසනික වශයෙන් බුද්ධ, ධම්ම, සංඝ රත්නත්‍රය ජීවිතාන්තය දක්වාම සරණ යන්නේ වෙයි.

මෙය මහනාම ශාක්‍ය රජතුමාට උපදෙස් වශයෙන් භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ සේක. මෙය භාග්‍යවතුන් වහන්සේ මහනාම ශාක්‍ය රජතුමාට පසලොස් චරණ ධර්මයන්ද දේශනා කරවන ලද්දේය.

1. සාසනයෙහි සද්ධාව ඇත්තේම වෙයි.
2. සාසනයෙහි සිල්වත් ඇත්තේම වෙයි.
3. අසන දකින දේවල් හොඳ නරක දෙක අනුව තේරුම් ගනී.
4. අන්‍ය මංගල්ලයන් නොගෙන කර්මයම මුල් කොට අදහන්නේ වෙයි.
5. බුදු සසුණෙන් පිට පිනට සුදුස්සන් නොසොයයි. බුදු සසුන මුල් කොටම සාසනයටම මුල් තැන දෙයි.

## සත් පුරුෂයෝ තමාගේ අන් අයගේ යහපත පිණිස පිළිපන්නේ වෙයි.

1. තමා සාසනික සද්ධාවෙහි පිහිටා අන්‍යයන්ද සද්ධාවෙහි පිහිටුවයි.

2. තමා සීලයෙහි පිහිටා අන්‍යයන්ද සීලයෙහි පිහිටුවයි.

3. තමා දෙන ස්වභාවයෙහි පිහිටා අන්‍යයන්ද දෙන ස්වාභාවයෙහි යොදවයි.

4. තමාද භික්ෂූන් දැකීමෙන් සිත පහදවා ගෙන අනුන්ද භික්ෂූන් කෙරෙහි සිත පහදවයි.

5. තමන් මනාව සද්ධර්මය ශ්‍රවණය කොට අන් අයටත් ධර්මය ශ්‍රවණය කරවන්නේය.

6. තමන් ඇසූ ධර්මයෙහි පිහිටා අන් අයවත් එම ධර්මයෙහි පිහිටුවයි.

7. තමන් සාසනික වශයෙන් ධර්මයට අනුකූලව හැසිරීමෙහිදී අන් අයත් එම ධර්මයට අනුව යොදවයි.

8. තමන් යෙදුනු ධර්මයෙහි පරීක්ෂාව මනාව සිදුකරන්නේ නම් අන් අයද මෙම ධර්මයෙහි යොදවන්නේය.

මහනාමය මෙතෙකින් තමන්ගේ උපාසක උපාසිකා ගුණ පිළිපන්නේ වෙයි. අන්‍යයන්ද මෙම ගුණයේ යොදවන්නේය.

# සෙත් පිරිත්

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස)**

## මහා මංගල සූත්‍ර නිධානය

ලෝකයේ ඒ ඒ කාලවලදී කෝලාහලයන් ඇති වේ. මංගලයයි ඇති වුණු කෝලාහලය ''මංගල කෝලාහලය'' ලෝක විනාශයේ දී ඇති වන කෝලාහලය '' කල්ප කෝලාහලය'' සක්විති රජ කෙනෙකු පහළ වන විට ඇති වන කෝලාහලය ''සක්විති කෝලාහලය'' බුදු කෙනෙකු පහළ වන විට ඇති වන කෝලාහලය ''බුද්ධ කෝලාහලය'' මෙතනින් පෙන්නුම් කරන්නේ මංගල කෝලාහලයයි.

එකල දඹදිව බොහෝ ජනයා එකතුව විවිධ බාහිර බොහෝ



කථා, බොහෝ ධනය වියදම් කොට ප්‍රීතියෙන් යුක්තව ඒ කතාවන් අසන සිරිතක් තිබුණි.

මේ කාලයේදී දඹදිව මිනිසුන් අතර මංගල නම් කුමක් දැයි පැන නැගුණු කථාවකි. යම් කෙනෙකු ඇසින් දුටු ප්‍රිය දෙය මංගල යැයි ද, තව කෙනෙකු කණට ඇසෙන දේ මංගල යැයිද, තව කෙනෙකු නාසයට දැනෙන දේ ප්‍රිය නම් මංගල යැයි ද, තව කෙනෙක් දිවට දැනෙන දේ ප්‍රිය නම් මංගල යයි ද, කයට දැනෙන දේ සුව පහසක් නම් මංගල යැයි ද, කීහ.

මෙසේ ඔවුන් අතර මේ විවාදය ඉතා බලවත් විය. තව සමහර අය රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ප්‍රිය වන්නාක් මෙන් අප්‍රිය විය හැකි යැයි නොයෙක් විතර්ක පහළ කළහ.

මෙසේ මිනිස් ලොවින් පැන නැගුණු විවාදය දෙව්ලොව දක්වාද, එයින් බඹ ලොව දක්වාද පැතිරෙන්නට විය. මිනිසුන්ද, දෙවි බඹුන් ද දෙකොටසක්ව් මේ මංගල සිතුවිල්ලෙන් වෙහෙසට පත් වූහ. මෙසේ එය විසඳා ගන්නට බැරිව අවුරුදු දොළසක් ගත විය.

## මහා මංගල සූත්‍රය

**ඒවං මේ සුතං ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ අථඛෝ අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා අභික්කන්ත වණ්ණා කේවල කප්පං ජේතවනං ඔභාසෙත්වා යේන භගවා තේනුපසංකමි, උපසංකමිත්වා, භගවන්තං අභිවාදෙත්වා ඒකමංතං අට්ඨාසි. එකමංතං ඨිතා ඛෝ සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි**

මා විසින් මෙසේ අසන ලදී. එක සමයෙක් හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථ පිණ්ඩික සිටුතුමා විසින් කරන ලද ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන කල්හි එක්තරා දිව්‍ය පුත්‍රයෙක් රාත්‍රිය ඉක්ම වූ කල්හි ඉතා විශිෂ්ඨ සෝභාසම්පන්නව මුළු ජේතවනාරාමය ශරීරාලෝකයෙන් බබුළුවාගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනක වැඩහුන් සේක් නම් එතනට එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක සිට ගාථාවකින් මෙසේ කී සේක.

**1.බහුදේවා මනුස්සාච - මංගලානී අචින්තයුං**
**ආකංඛමානා සොත්ථානං - බ්‍රෑහි මංගල මුත්තමං**

මෙලොව පරලොව සැප කැමැති වන්නාවූ බොහෝ දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද, මංගල කරුණු සිතූහ. ඒ උතුම් මංගල කරුණු වදාළ මැනව යැයි කීහ.

**2. අසේවනා ච බාලානං - පණ්ඩිතානං ච සේවනා**
**පූජා ච පූජනීයානං - ඒතං මංගල මුත්තමං**

බාලයන් (ගුණයෙන් බාල) සහ අසත්පුරුෂයන් සේවනය නොකිරීම, පණ්ඩිතයන් සහ සත්පුරුෂයන් සේවනය කිරීම, උතුම් පිදිය යුත්තන් පිදීම, උතුම් මංගල කරුණකි.

**3. පතිරූපදේස වාසෝ ච- පුබ්බේ ච කතපුඤ්ඤතා**
**අත්තසම්මාපණිධි ච - ඒතං මංගල මුත්තමං**

සුදුසු ප්‍රදේශයක විසීම, (තුණුරුවන් පවතින) පෙරපින් කළ බවද, සිය ආත්මය දහමෙහි පිහිට වීමද, උතුම් මංගල කරුණකි.

**4. බාහු සච්චඤ්ච සිප්පඤ්ච -විනයෝ ච සුසික්ඛිතෝ**
**සුභාසිතා ච යා වාචා - ඒතං මංගල මුත්තමං**

බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවද, ශිල්පය දැන ගැනීමද, මනාව හික්මුණු විනය ඇති බවද, සුභාෂිත වචනය කියන ලද (යහපත් වචනය) උතුම් මංගල කරුණකි.

**5. මාතාපිතු උපට්ඨානං - පුත්තදාරස්ස සංගහෝ**
**අනාකුලා ච කම්මන්තා - ඒතං මංගල මුත්තමං**

මව්පියන්ට උපස්ථාන කිරීමද, අඹුදරුවන්ට සංග්‍රහ කිරීමද, නිරවුල් කර්මාන්ත කිරීමද, උතුම් මංගල කරුණකි.

**6. දානංච ධම්මචරියා ච - ඤාතකානඤ්ච සංගහෝ**
**අනවජ්ජානි කම්මානි - ඒතං මංගල මුත්තමං**

දන්දීමද, දස කුසලයෙහි යෙදීමද (හැසිරීමද) ඥාතීන්ට



සංග්‍රහ කිරීමද, නිවැරදි කර්මාන්ත කිරීමද, උතුම් මංගල කරුණකි.

**7. ආරති විරති පාපා - මජ්ජපානා ච සඤ්ඤමෝ**
**අප්පමාදෝ ච ධම්මේසු - ඒතං මංගල මුත්තමං**

පාපයෙහි නොඇලීමද, පාපයෙන් වෙන් වීමද, (වැළකීම) මත් පැනින් වැළකීමද, කුසල ධර්මයෙහි අප්‍රමාදව යෙදීමද මෙය උතුම් මංගල කරුණකි.

**8. ගාරවෝච නිවාතෝච - සන්තුට්ඨී ච කතඤ්ඤුතා**
**කාලේන ධම්ම සවණං - ඒතං මංගල මුත්තමං**

ගරු කළ යුත්තන්ට ගරු කිරීමද, නිහතමානී බවද, ලද දෙයින් සතුටු වීම, කළගුණ සැලකීම, කළගුණ දැනීම, සුදුසු කල්හි ධර්මය ඇසීමද, මෙය උතුම් මංගල කරුණකි.

**9. ඛන්තී ච සෝව චස්සතා -සමණානංච දස්සනං**
**කාලේන ධම්ම සාකච්ඡා - ඒතං මංගල මුත්තමං**

ඉවසීමද, කීකරු බවද (සුවච බවද) ශ්‍රමණයන් වහන්සේලා දැකීමද, සුදුසු කල්හි ධර්ම සාකච්ඡාවද මෙය උතුම් මංගල කරුණකි.

**10. තපෝච බ්‍රහ්මචරියා ච -අරිය සච්චාන දස්සනං**
**නිබ්බාන සච්ඡි කිරියා ච - ඒතං මංගල මුත්තමං**

තපසද (තපෝගුණයද) යහපත් හැසිරීමද, ආර්ය සත්‍ය දැකීමද, නිවන් අවබෝධ කිරීමද උතුම් මංගල කරුණකි.

**11.ඵුට්ඨස්ස ලෝකධම්මේහි-චිත්තං යස්ස න කම්පති**
**අසෝකං විරජං ඛෙමං - ඒතං මංගල මුත්තමං**

අෂ්ඨ ලෝක ධර්මයෙහි කම්පා නොවීමද (සැප දුක්, නින්දා ප්‍රසංසා, ලාභ අලාභ, යස අයස) සිත කම්පා නොවීම, සෝක නොවීම, රාගාදී කෙලෙස් නැති බව, භය නැති බව මෙය උතුම්

මංගල කරුණකි.

**12. ඒතාදිසානි කත්වාන - සබ්බත්ථ මපරාජිතා**
**සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති- තං තේසං මංගල මුත්තමන්ති**

මෙම මංගල කරුණු හේතු කොට ගෙන සෑම තැනකදීම නොපැරදී, සියලු තැන්හි සැපයට පැමිණෙයි. මෙම කරුණු උතුම් මංගල්‍යයක් වේ.

**ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජයමංගලං**
**ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජයමංගලං**
**ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජයමංගලං**

මෙම සත්‍යයේ හේතුවෙන් උතුම් මංගල්ල්‍යයක් වේවා!
මෙම සත්‍යයේ හේතුවෙන් උතුම් මංගල්ල්‍යයක් වේවා!
මෙම සත්‍යයේ හේතුවෙන් උතුම් මංගල්ල්‍යයක් වේවා!

## රතන සූත්‍ර නිධානය

රතන සූත්‍රය අන් අයගේ ආරක්ෂාව පිණිසත් අමනුෂ්‍යයන්ගේ උවදුරු වැළැක්වීම සඳහාත් දේශනා කරන ලදි.

අතීතයේ විශාලා මහ නුවර විශාල දුර්භික්ෂයක් විය. ආහාර හිඟවීම නිසා විශාල මිනිසුන් ප්‍රමාණයක් මැරෙන්නට විය. එම මළ කුණු ගඳින් අමනුෂ්‍යයෝ නුවරට ඇතුල් වූහ. එයින් තවත් වැඩියෙන් මැරෙන්නට වූහ. එය හේතු කොට ගෙන 'අහිවාතක රෝගය' ඇති විය. එම නිසා දුර්භික්ෂ, අමනුෂ්‍ය, රෝග යන ත්‍රිවිධ භය ඇතිවිය. විශාලා මහ නුවර වැසියෝ මහත් දුකකට පත් වූහ. මේ බව නගරවාසීහූ රජවරුන්ගේ වරදක් දැයි විමසා, එසේ නොවේ යැයි දැන දීර්ඝ සාකච්ඡාවකින් පසු තථාගත බුදුරජාණන් වහන්සේ මේ නුවරට වැඩමවා ගතහොත් සියලු උපද්‍රව දුරුවේයැයි තීරණය කළහ. බිම්බිසාර රජතුමාගේ කැමැත්ත පරිදි ලිච්ඡවී රජවරු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස විශාලා මහනුවර ත්‍රිවිධ භයකින් පෙළෙන අප රට වැසියන්ට (ජනතාවට) අනුකම්පා කොට රට වැසියන්ගේ නිදුක් නිරෝගී භාවය පිණිස අප නුවරට වඩින සේක් නම් ඉතා යහපත් වේ යැයි



දන්වා සිටියහ.

තථාගතයන් වහන්සේ ලිච්ඡවී රජ දරුවන්ගේ ආරාධනය පිළිගෙන රතන සූත්‍රයෙහි අනුහසින් කෙළ ලක්‍ෂයන් සක්වලට ආරක්‍ෂාව සිදුවන බවත් විශාල පිරිසකට ධර්ම අවබෝධය වෙතැයි සලකා පන්සීයක් භික්‍ෂූන් වහන්සේලා සමඟ විශාලා මහ නුවරට වැඩම කළ සේක. ඒ සමගම සිව් දිගින් කලුකොට නැගුණු මහ මේඝයෙන් ඇද හැලුණු මහ වර්ෂාවෙන් සියලු මළ කඳන් ගංගා නම් ගඟට පාවී ගියේය. නගරය පිරිසිදු විය. බුදු පාමොක් සඟ රුවන විශාලා මහ නුවරට පිවිසෙත්ම සක් දෙවිඳු මහානුභාව සම්පන්න දෙවියන් සමඟ පැමිණියහ. ඔහුගේ පැමිණීම සමඟ අමනුෂ්‍යයෝ ක්‍රමයෙන් ඉවත් වී ගියෝය. තථාගතයන් වහන්සේ නුවර දොරටුව අභියස සිට ආනන්ද හිමියන් අමතා ආනන්දය මෙම රතන සූත්‍රය දේශනා කරමින් ම විශාලා මහ නුවරටම පිරිත් පැන් ඉසින්න යැයි වදාළෝය. සියලු අමනුෂ්‍යයෝ පළා ගියහ. නගරය මනාව ආරක්‍ෂාව ඇති විය. සියලු උවදුරු දුරු විය. මනුෂ්‍යයෝ සැපවත් වූහ. අසූහාරදහසක් දෙනාට ධර්මාභිසමය විය.

## රතන සූත්‍රය

**යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යා නිව අන්තලික්ඛෙ**
**සබ්බේව භූතා සුමනා භවන්තු**
**අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං**

පොළොවෙහිද, අහසෙහිද, යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස් වූවාහු ද, ඒ සියලු අමනුෂ්‍යයෝ සතුටු සිත් ඇත්තෝ වෙත්වා. මාගේ වචනය සකස් කොට අසත්වා.

**තස්මා හි භූතා නිසාමේථ සබ්බේ**
**මෙත්තං කරෝථ මානුසියා පජාය**
**දිවා ච රත්තෝ ච හරන්ති යේ බලිං**
**තස්මා හි නේ රක්ඛථ අප්පමත්තා**

අමනුෂ්‍යානි, එසේ හෙයින් තොප සියලු දෙනා මාගේ

වචනය අසව්. මිනිස් ප්‍රජාවට මෛත්‍රී වඩව්, යම් කෙනෙක් දිවා රාත්‍රියෙහි පුද පඬුරු එලවත් ද එසේ හෙයින් අප්‍රමාදව ඔවුන් රකිව්.

**යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා**
**සග්ගේසුවායං රතනං පණීතං**
**නනෝ සමං අත්ථි තථාගතේන**
**ඉදම්පි බුද්ධෙ රතනං පණීතං**
**එතේන සච්චේන සුවත්ථි හෝතු**

මිනිස් ලොව, නා ලොව ආදී යම් ලොවක යම් ධනයක් වේද, ස්වර්ගයෙහි යම් කිසි උතුම් රත්නයක් වේද, ඔවුන් අතරින් තථාගතයන් වහන්සේට සමාන (රත්නයක්) කෙනෙක් නැත්තේය. බුදුරදුන් කෙරෙහි මේ රත්නභාවයද උතුම් ය. එම සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!

**ඛයං විරාගං අමතං පණීතං**
**යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ**
**නතේන ධම්මේන සමත්ථි කිඤ්චි**
**ඉදම්පි ධම්මේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

එකඟ වූ සිත් ඇති ශාක්‍යමුනි වූ (බුදුරජාණන් වහන්සේ කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින්) ක්‍ෂය නම් වූ රාගයෙන් වෙන් වූ මරණයක් නැති, යම් නිවනක් අවබෝධ කළේ ද, ඒ ධර්මයට සමාන කිසිවක් නැත්තේය. මේ ධර්ම රත්නය ඉතාම උතුම්ය. මේ උතුම් සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.
**යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයි සුචිං**
**සමාධිමානන්තරිකඤ්ඤමාහු**
**සමාධිනා තේන සමෝන විජ්ජති**
**ඉදම්පි ධම්මේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

බුද්ධ ශ්‍රේෂ්ඨ තෙමේ පිරිසිදු යම් ධර්ම මාර්ගයක් වර්ණනා කෙළේද, යම් මාර්ගයක් ආනන්තරික සමාධියක් යැයි කියයි ද, ඒ සමාධියට සමාන සමාධියක් නැත්තේය. ධර්ම රත්නය ඉතාම



උතුම්ය. මේ උතුම් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!

**යේ පුග්ගලාඅට්ඨ සතං ප සත්ථා**
**චත්තාරි ඒතානි යුගානි හොන්තී**
**තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා**
**ඒතේසු දින්නානි මහප්ඵලානි**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

සත්පුරුෂයන් විසින් පසන්නා ලද යම් ආර්ය පුද්ගලයෝ අට දෙනෙක් වෙත් ද, එකසිය අටක් ආර්ය පුද්ගලයෝ වෙත් ද, ඔවුන් අටදෙනා සතර යුගලයක් වේ. සුගතයන් වහන්සේගේ ශ්‍රාවක වූ ආර්ය පුද්ගලයෝ දක්ෂිණාවට සුදුසු වෙති. ඒ සත්‍යයන් කෙරෙහි දෙන ලද දානය මහත් ඵල ඇත්තේය. එම සංඝ රත්නය ඉතා උතුම්ය. මේ උතුම් සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**යේ සුප්පයුත්තා මනසා දළ්හේන**
**නික්ඛාමිනෝ ගෝතම සාසනම්හි**
**තේ පත්තිපත්තා අමතං විගය්හ**
**ලද්ධාමුධා නිබ්බුතිං භුඤ්ජමානා**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

යම් කෙනෙක් ස්ථිර වූ සිතින් මනාකොට යෙදුනා වූ ගෞතම ශාසනයෙහි කෙලෙසුන්ගෙන් මිදුනා වූද, නිවනට බැස නොමිලේම නිවන් සුවය වළඳා රහත් ඵලයට පැමිණියේ ද මේ සංඝ රත්නය ඉතා උතුම්ය. සංඝ රත්නයේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!

**යථින්දඛීලෝ පඨවිංසිතෝ සියා**
**චතුබ්භි වාතේහි අසම්ප කම්පියෝ**
**තථූපමං සප්පුරිසං වදාමි,**
**යෝ අරිය සච්චානි අවෙච්ච පස්සති**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**

**ඒතේන සච්චේන සුවත්ථී හෝතු**

යම් සේ පොළොවෙහි යටට බැස ගත් ඉන්ද්‍රඛීලය. සිව්දිගින් හමන සුළඟින් කම්පා නොවෙයි. (සෙලවිය නොහැකි වේද) යම් ආර්ය පුද්ගලයෙක් ආර්ය සත්‍යය නුවණින් අවබෝධ කළේද, ඒ සත්පුරුෂ තෙමේ ඉන්ද්‍රඛීලය බඳු වේ යැයි කියමි. මේ සංඝ රත්නය ඉතා උතුම්ය. මේ උතුම් සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**යේ අරිය සච්චානි විභාවයන්ති**
**ගම්භීරපඤ්ඤේන සුදේසිතානි**
**කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා**
**න තේ භවං අට්ඨමං ආදියන්ති**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථී හෝතු**

යම් සෝවාන් කෙනෙක් ගැඹුරු නුවණින් බුදුරජාණන් වහන්සේ විසින් මනා කොට දේශනා කරන ලද ආර්ය සත්‍යය අවබෝධ කෙරෙත්ද, ඔහු බෙහෙවින් නමුත් අට වෙනි ආත්මයක් නොගනී. එසේ හෙයින් මහා සංඝ රත්නය උතුම්ය. මේ උතුම් සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**සහාවස්ස දස්සනසම්පදාය**
**තයස්සු  ධම්මා ජහිතා භවන්ති**
**සක්කායදිට්ඨී විචිකිච්ඡිතඤ්ච**
**සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි**
**චතුහ පායෙහි ච විප්පමුත්තෝ**
**ඡ චාභිඨානානි අභබ්බෝ කාතුං**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථී හෝතු**

සෝවාන් පුද්ගලයාගේ දර්ශන සම්පත්තිය සමඟම (සෝවාන් මග නුවණ පහළ වීම සමඟම සක්කාය දිට්ඨී, විචිකිච්චාව, ශීලාවුතාදියක් වෙත් ද, ඒ සංයෝජන ධර්මයෝ තුන් දෙන දුරු කරන ලද්දාහු වෙත්, සතර අපායෙන් මිදුනේ වෙත්,



සවදෑරුම් පාප කර්මයෙන් කරන්නට නුසුදුසු වේ. එසේ හෙයින් මහා සංඝ රත්නය උතුම් වේ. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං**
**කායේන වාචා උද චේතසා වා**
**අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය**
**අභබ්බතා දිට්ඨ පදස්ස වුත්තා**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථී හෝතු**

ඒ සෝවාන් පුද්ගලයා කයෙන්, වචනයෙන්, සිතින් කිසියම් පාප කර්මයක් කෙරේද, ඒ පාප කර්මය සැඟවීමට නොහැක්කේය. වරද සැඟවීමෙහි අභාග්‍යයැයි බුදුරජාණන් වහන්සේ විසින් වදාරන ලදී. එම නිසා සංඝ රත්නය උතුම්ය. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**වනප්පගුම්බේ යථා ඵුස්සිතග්ගේ**
**ගිම්හාන මාසේ පඨමස්මිං ගිම්හේ**
**තථූපමං ධම්මවරං අදේසයි**
**නිබ්බාණ ගාමිං පරමං හිතාය**
**ඉදම්පි බුද්ධේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථී හෝතු**

වන ලැහැබ ග්‍රීස්ම ඍතුවේ පළමු මාසයෙහි හෙවත් බක් මස සුපිපි ඇත්තේ යම් සේද, එසේම නිවන් පමුණුවන ධර්ම රත්නය නිවන් සුව පිණිසම ඒ බුදුරජාණන් වහන්සේ දෙසූ සේක. එම නිසා බුද්ධ රත්නය ඉතා උතුම්ය. මේ උතුම් සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ**
**අනුත්තරෝ ධම්මවරං අදේසයි**
**ඉදම්පි බුද්ධෙ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථී හෝතු**

උතුම් වූ නිවන දන්නා වූ, උතුම් වූ නිවන් දෙන්නා වූ, උතුම් නිවන් ගෙන හැර පාන්නා වූ, අනුත්තර වූ බුදුරජාණන් වහන්සේ උතුම් දහමක් දෙසන ලද්දේද එම බුද්ධ රත්නය ඉතා උතුම්ය. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං**
**විරත්ත චිත්තා ආයතිකේ භවස්මිං**
**තේ ඛීණබීජා අවිරුළ්හිච්ඡන්දා**
**නිබ්බන්ති ධීරා යථා යම්පදීපෝ**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

යම් රහතන් වහන්සේ නමකගේ පුරාණ කර්මය ක්ෂය වූයේ ද, අලුත් භවයක් නැත්තේද, මතු භවය කෙරෙහි නොඇලූ සිත් ඇත්තේ වේද, ක්ෂය වූ විඥාන සිත් ඇත්තේද, පුනරුත්පත්තියෙහි ආශාවන් නැති ධෛර්‍ය සම්පන්න වූ ඒ රහතන් වහන්සේ වේ. පහන මෙන් පිරිනිවෙත්, මෙයද මහා සංඝ රත්නය උතුම්ය. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!

**යානීධ භූතානි සමාගතානි**
**භුම්මා නි වා යා නිව අන්තලික්ඛේ**
**තථාගතං දේවමනුස්ස පූජිතං**
**බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු**

මෙතැන්හි රැස් උනාවූ පොළොවෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, අහසෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, එම සැමදෙනා දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගතයන් වහන්සේ වූ බුදුරදුන් නමදිමු. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!

**යානීධ භූතානි සමාගතානි**
**භුම්මා නි වා යා නිව අන්තලික්ඛේ**
**තථාගතං දේවමනුස්ස පූජිතං**
**ධම්මං නමස්සාම සුවත්ථි හෝතු**



මෙතැන්හි රැස් උනාවූ පොළොවෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, අහසෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, එම සැමදෙනා දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගතයන් වූ ධර්ම රත්නය නමදිමු. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!

**යානීධ භූතානි සමාගතානි**
**භුම්මා නි වා යා නිව අන්තලික්ඛේ**
**තථාගතං දේවමනුස්ස පූජිතං**
**සංඝං නමස්සාම සුවත්ථි හෝතු**

මෙතැන්හි රැස් උනාවූ පොළොවෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, අහසෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, එම සැමදෙනා දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත වූ සංඝ රත්නය නමදිමු. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන්
සෙතක් වේවා.!

**එතෙන සච්ච වජ්ජේන දුක්ඛා වූපසමෙන්තු මෙ (තෙ) ඒතේන සච්ච වජ්ජේන භයා වූපසමෙන්තු මෙ (තෙ) එතෙන සච්ච වජ්ජේන රොගා වූපසමෙන්තු මෙ (තෙ)**

ඒ සත්‍යානුභාව බලයෙන් මට දුක් ගිනි නැති වේවා.
ඒ සත්‍යානුභාව බලයෙන් මට භය ගිනි නැති වේවා.
ඒ සත්‍යානුභාව බලයෙන් මට රෝග ගිනි නැති වේවා.
(මෙහිදී අන්‍යයන් වෙනුවෙන් මේ වෙනුවට තෙ යනුවෙන් ද මට වෙනුවට ඔබට යනුවෙන් ද භාවිතා කරන්න)

## කරණීයමෙත්ත සූත්‍ර නිධානය

මෙම කරණීය මෙත්ත සූත්‍ර දේශනය අමනුෂ්‍යයන්ගෙන් සිදුවන උවදුරු වැළැක්වීම සඳහා දේශනා කරන ලදී.

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන සමයක සසර කළකිරුණු ස්වාමීන් වහන්සේලා පිරිසක් බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් ගෙන ඉතා සිත්කලු රමණීය

වන ලැහැබකට පිවිසියාහ. එම සිල්වත් භික්ෂූන්ගේ ගුණානුභාවය නිසා ඒ වනයෙහි සිටි වන දේවතාවන්ට, වෘක්ෂ දේවතාවන්ට එම විමන්වල සිටිනට නොහැකි විය. මේ භික්ෂූන් වහන්සේලා ආගන්තුකව සිටිනු ඇතැයි සිතා විමන්වලින් බැස ඔබනොබ හැසිරෙන්නට විය. එහෙත් නොයෙන බව දැනගත් එම වෘක්ෂ වන දේවතාවෝ ඒ භික්ෂූන් වහන්සේලාට හිඳීමට නොහැකි වන සේ නොයෙක් බිය උපදවන අරමුණු පෙන්වූහ. බිය ගන්වන හඬ ඇති කළහ. නානාප්‍රකාර බියජනක රූප අරමුණු ඉපිද විය. ඉදිරියේ සිටින්නාක් මෙන් දැක්වූහ. භික්ෂූන් බියට පත්ව දුර්වර්ණ වූහ. නොයෙක් රෝගාබාධ ද ඇති විය. සිත එකඟ කර ගන්නට නොහැකි විය. ක්ලාන්තභාවයට පත් වූහ. මෙසේ එකිනෙකාගෙන් විමසූ කළ සැමදෙනා වහන්සේටම මෙවැනි උවදුරු ඇති බව දැනගත් සංඝ ස්ථවිරයන් වහන්සේ භික්ෂූන් සමඟ සාකච්ඡා කොට වස් විසීමට වෙන ස්ථානයක් සඳහා යනු පිණිස භාග්‍යවතුන් වහන්සේට සැලකරණු මැනවියි කියා සියලු දෙනා වහන්සේම භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගොස් සියලු තොරතුරු දන්වා සිටියහ.

භාග්‍යවතුන් වහන්සේ ඒ සියලු තොරතුරු අසා මහණෙනි, ඔබලාගේ ජය භූමිය එම ස්ථානයැයි වදාරා ඔබලා පළමු ගමනේ දී හිස් අතින් එතනට ගියේ. දැන් මම ඔබලාට ආයුධයක් දෙන්නම් යැයි, සතුරාට පහර දිය යුතු කරණීය මෙත්ත සූත්‍රය දේශනා කර, පාඩම් කර භාවනා කර්මස්ථානයක් ලෙසද භාවිතා කළ යුතු යැයි උගන්වා එම ස්ථානයට ආපසු පිටත් කර හැරියේය. එම භික්ෂූන් වහන්සේලා සජ්ඣායනා කරමින්, සාකච්ඡා කරමින්, ධර්ම දේශනා කරමින්, කර්මස්ථානය ලෙස භාවනා කරමින් භාවනා වඩා පිං අනුමෝදන් කරමින් පුහුණු කළ විට අමනුෂ්‍ය බිය දුරු වේය. දෙවියෝ හිතවත් කම් දක්වන්නේ යැයි වදාළේ යැයි මෙම කරණීය මෙත්ත සූත්‍රය දේශනා කළ සේක.



## කරණීය මෙත්ත සූත්‍රය

**1. කරණීය මත්ථ කුසලේන**
**යංතං සන්තං පදං අභිසමෙච්ච**
**සක්කෝ උජූ ච සූජූ ච**
**සුවචෝ චස්ස මුදු අනතිමානී,**

ශාන්ත නිවනට පැමිණවන්නාහු විසින් යමක් කළ යුතු ද අභිවෘද්ධියට දක්ෂයා විසින් ඒ දෙය කළ යුතුය. දක්ෂයෙක් විය යුතුය. සෘජු විය යුතුය. මනාකොට සෘජු විය යුතුය. කීකරු විය යුතුය. මෘදු විය යුතුය. නිහතමානී විය යුතුය.

**2. සන්තුස්සකෝ ච සුභරෝච**
**අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති,**
**සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච**
**අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ**

ලද දෙයින් සතුටු විය යුතුය. පහසුවෙන් පෝෂණය කළ යුතුය. ස්වල්ප වැඩ කටයුතු ඇති විය යුතුය. සැහැල්ලු පැවතුම් විය යුතුය. නුවණක් ඇති විය යුතුය. යටහත්භාවයෙන් සංවර විය යුතුය. කුලයන් කෙරෙහි නොඇලිය යුතුය.

**3. නච ඛුද්ධං සමාචරේ**
**කිඤ්චි යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං**
**සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු**
**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා,**

යම් ක්‍රියාවකින් අන් නුවනැත්තෙක් නින්දා කෙරේද එබඳු ස්වල්ප වූ වරදක් නොකරන්නේය. සියලු සත්ත්වයෝ සැප ඇත්තෝ වෙත්වා. භය නැත්තෝ වෙත්වා. සුඛිත සිත් ඇත්තෝ වෙත්වා.

**4. යේ කේචි පාණභූතත්ථි**
**තසාවාථාවරා වා අනවසේසා,**
**දීඝාවා යේ මහන්තා වා**
**මජ්ඣිමා රස්ස කාණුකථූලා,**

කෙලෙස් ඇති බැවින් හයින් තැතිගත්තාහුද, නිර්භය හෙයින් (කෙලෙස් නැති) ස්ථාවර වූ ද, සියලු යම් කිසි සත්ත්ව කෙනෙක් වෙත් ද, දීර්ඝ ජාති ඇත්තා වූද, මහත් සිරුරු ඇති සත්ත්වයෝද, මධ්‍යම ප්‍රමාණයේ සිරුරු ඇත්තෝද, මිටි සිරුරු ඇත්තෝ ද, ඉතා සියුම් සිරුරු ඇති සත්ත්වයෝද, ස්ථූල සිරුරු ඇති සත්ත්වයෝද,

**5. දිට්ඨා වා යේව අද්දිට්ඨා**
**යේව දූරේ වසන්ති අවිදූරේ**
**භූතා වා සම්භවේසී වා**
**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා,**

ඇසට පෙනෙන සත්ත්වයෝද, නොපෙනෙන සත්ත්වයෝද, දුර ඉන්නා සත්ත්වයෝද, ළඟ සිටින සත්ත්වයෝද, ඉපදුන සත්ත්වයෝද, ඉපදෙන සත්ත්වයෝද, සියලු සත්ත්වයෝ සුඛිත සිත් ඇත්තෝ වෙත්වා, මෙත් වඩන්නාහ

**6. නපරෝ පරං නිකුබ්බේථ**
**නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි**
**බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා**
**නාඤ්ඤ මඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය**

කෙනෙක් අනෙකෙකු නොරවටන්නේය. අනෙකෙකුට අවමන් නොකරන්නේය. කාය වාක් විකාරයෙන්, කෝපයෙන් පටිඝ සංඥාවෙන් අන් කෙනෙක් අන්කෙනෙකුට දුකක් නොකැමැති වන්නේය.

**7. මාතා යථා නියං පුත්තං**
**ආයුසා ඒකපුත්තමනුරක්ඛේ**
**ඒවම්පි සබ්බභූතේසු**
**මානසංභාවයේ අපරිමානං**

යම් මවක් තමාට ඇති එකම පුතු දිවි හිමියෙන් රකීද, එසේම සැම සතුන් කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රී සිතක් වඩන්නේය.



**8. මෙත්තංච සබ්බ ලෝකස්මිං**
**මාන සංභාවයේ අපරිමාණං**
**උද්ධං අධෝ ච තිරියඤ්ච**
**අසම්බාධං අවේරං අසපත්තං**

උඩ, යට, සරස සම්බාධ නැතිව, වෛර නැතිව, සතුරන් නැතිව, සියලු සත්ත්වයන් කෙරෙහි අප්‍රමාණ මෛත්‍රී සහගත සිතක් වඩන්නේය.

**9. තිට්ඨං චරං නිසින්නෝවා**
**සයානෝවා යාව තස්ස විගත මිද්ධෝ,**
**ඒතං සතිං අධිට්ඨෙය්‍ය**
**බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු**

සිටින්නේ, ඇවිදින්නේ, හිඳින්නේ, සයනය කරන්නේ, යම්තාක් නොනිදාද (ඒ තාක්) මේ මෛත්‍රී සහගත සිහිය අධිෂ්ඨාන කරන්නේ, මේ ශාසනයෙහි බ්‍රහ්ම විහාරයයි (බුද්ධාදී උතුමෝ කියති)

**10. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා**
**දස්සනේන සම්පන්නෝ,**
**කාමේසු විනෙය්‍යගේධං**
**නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතීති**

මිත්‍යාදෘෂ්ටියට නොපැමිණි සිල්වත් වූයේ, දර්ශනයෙන් යුක්ත වූයේ, කාමයන්හි ගිජුබව දුරු කොට ඒකාන්තයෙන් මව්කුස පිළිසිඳ ගැනීමට නැවත නොයෙන්නේය.

**ඒතේන සච්ච වජ්ජේන සොත්ථි මේ (තෙ) හෝතු සබ්බදා**
**ඒතේන සච්ච වජ්ජේන සොත්ථි මේ (තෙ) හෝතු සබ්බදා**
**ඒතේන සච්ච වජ්ජේන සොත්ථි මේ (තෙ) හෝතු සබ්බදා**

ඒ සත්‍යානුභාව බලයෙන් මට (ඔබට) යහපතක්ම වේවා!
ඒ සත්‍යානුභාව බලයෙන් මට (ඔබට) යහපතක්ම වේවා!
ඒ සත්‍යානුභාව බලයෙන් මට (ඔබට) යහපතක්ම වේවා!

## අන්තරාය නිවාරණ පිරිත

01. බුද්ධානං ජීවිතස්ස නසක්කා කේනචි අන්තරායෝ කාතුං
02. බුද්ධානං ඡබ්බණ්නරංසිනං නසක්කා කේනචි අන්තරායෝ කාතුං
03. බුද්ධානං ද්වත්තිංස මහා පුරිසලක්ඛණානං නසක්කා කේනචි අන්තරායෝ කාතුං
04. බුද්ධානං අභිහට චතුන්තං පච්චයානං නසක්කා කේනචි අන්තරායෝ කාතුං
ඉමේසං චතුන්නං අච්ඡරියානං නසක්කා කේනචි අන්තරායෝ කාතුං

ඒතේන සච්ච වජ්ජේන
අන්තරායා අසේසතෝ
මාරාජයෝ විනස්සන්තු
ජයසිද්ධී භවන්තු මෙ (තෙ)

අන්තරාය නිවාරණ පිරිතේ සිංහල තේරුම

1.සර්වඥයන් වහන්සේලාගේ ජීවිතයට අනතුරක් කිරීමට කිසිවකුටත් නොහැකිය.

2.සර්වඥයන් වහන්සේලාගේ ෂඩ් වර්ණ, ඝන බුද්ධ රශ්මි මාලාවන්ට අනතුරක් කිරීමට කිසිවකුටත් නොහැකිය.
3.සර්වඥයන් වහන්සේලාගේ ද්වත්තිංස මහා පුරුෂ ලක්ෂණයන්ට අනතුරක් කිරීමට කිසිවකුටත් නොහැකිය.

4. සර්වඥයන් වහන්සේලා වෙත පිරිනැමූ සිව්පස දානයන්ට අනතුරක් කිරීමට කිසිවකුට නොහැකිය.

සතරක් වූ මේ ආශ්චර්ය ධර්මයන්ට අනතුරක් කිරීමට කිසිවකුටත් නොහැකිය.



ගාථාවේ තේරුම

සතර ආකාරවූ මේ ආශ්චර්ය ධර්ම ඒකාන්තයෙන් සත්‍යය. ඒ සත්‍යය වචනයේ ආනුභාව බලයෙන් සකලාන්තරාද, මාරක බාධක සියල්ලද, විහත විද්වංසනය වෙත්වා. ආරක්ෂාව, සෙත් ශාන්තිය, ජය සිද්ධිය මාහට (ඔබ සැමට අත්වේවා)

උදේ සවස භාවිතා කළ යුතු ආරක්ෂක ගාථා

බුද්ධං සුද්ධ ගුණාකරං දසබලං - දේවාති දේවං ජිනං
ධම්මං තේන සුදේසිතං භවනුදං - දුක්ඛා පගගං නිම්ම ලං
සංඝාවාපි නිරංගණං මුනිසුතං - වන්දාමහං මුද්ධනා
බුද්ධො ධම්ම වරෝ තථාගත ගණෝ
පාලෙන්තු (ත්වං) මං සදා

## ඥාතීන්ට හා දෙවියන්ට පින්දීම

### ඥාතීන්ට පින් දීම

ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ
ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයො
ඉදං වො ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ

### දෙවියන්ට පින් දීම

එත්තාවතාච අම්හේහි
සම්පදං පුඤ්ඤ සම්පදං
සබ්බේ දේවා අනුමෝදන්තු
සබ්බ සම්පත්ති සිද්ධියා

එත්තාවතාච අම්හේහි
සම්පදං පුඤ්ඤ සම්පදං

සබ්බේ භූතා අනුමෝදන්තු
සබ්බ සම්පත්ති සිද්ධියා

එත්තාවතාව අම්හේහි
සම්පදං පුඤ්ඤ සම්පදං
සබ්බේ සත්තා අනුමෝදන්තු
සබ්බ සම්පත්ති සිද්ධියා

ආකාසට්ඨාච භුම්මට්ඨා
දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමෝදිත්වා
චිරං රක්ඛන්තු සාසනං

ආකාසට්ඨාච භුම්මට්ඨා
දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමෝදිත්වා
චිරං රක්ඛන්තු දේසනං

ආකාසට්ඨාච භුම්මට්ඨා
දෙවානා ගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමොදිත්වා
චිරං රක්ඛන්තු මං පරං

විහාරයේ ආරාමයේ සිටින දෙවියන්ට පින් දීම
අස්මිං විහාරේච ආරාමේ (අරඤ්ඤ ඛෙත්තම්හි)
අධිවත්ථා ච දේවතා
අනුමෝදිත්වා නිමං පුඤ්ඤං
රක්ඛන්තු ජින සාසනං

## සියලු සත්ත්වයන්ට පින් දීම

සබ්බෙ සත්තාච මජ්ඣත්තා - හිතාච අහිතාචමේ
අනුමෝදිත්වා ඉමං පුඤ්ඤං - බුජ්ඣන්තු අමතං පදං



මෛත්‍රී බෝධිසත්වයන්ට පින් දීම
කප්ප සත සහස්සානි - සෝළසාපි අසංඛියෙ
සම්භරං බෝධි සම්භාරේ - ආගතෝ ජාති ජාතිසු
නියතෝ බුද්ධ භාවාය - භද්ද කප්පේ ඉධන්තිමේ
බෝධි සත්තෝච මෙත්තෙයෝ - පුඤ්ඤං මේ අනුමෝදතු

කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ප්‍රාර්ථනා කිරීම
ඉමිනා පුඤ්ඤ කම්මේන
මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු
යාව නිබ්බාන පත්තියා

ඉමිනා පුඤ්ඤ කම්මේන
මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු
යාව නිබ්බාන පත්තියා

ඉමිනා පුඤ්ඤ කම්මේන
මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු
යාව නිබ්බාන පත්තියා

## නිවන් අවබෝධය ප්‍රාර්ථනා කිරීම

ඉදං මෙ පුඤ්ඤ කම්මං ආස වක්ඛයා වහං හෝතු
සබ්බ දුක්ඛා පමුඤ්චතු

## ප්‍රතිපත්ති පූජාව

ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා බුද්ධං පූජෙමි
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා ධම්මං පූජෙමි
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා සංඝං පූජෙමි
අද්ධා ඉමාය පටිපත්තියා ජාති ජරා මරණම්හා පරිමුච්චිස්සාමි

## තුණුරුවන් සමාකර ගැනීම

කායෙන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මෙ භන්තේ - භූරි පඤ්ඤ තථාගත
කායෙන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ ධම්ම - සන්දිට්ඨික අකාලික

කායෙන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ සංඝ - පුඤ්ඤක්ඛෙත්ත අනුත්තර

## ගරු ස්වාමීන් වහන්සේලාට වන්දනා කරනගාථා

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලභේන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපාටියා
සද්ධා සීලං දයාවාසං - බුද්ධ පුත්තං නමාමහං

## පියාට වදින ගාථාව

වුද්ධිකාරෝ ආලිංගිත්වා- චුම්භිත්වා පිය පුත්තකං
රාජ මජ්ඣං සුපටිත්තං - පීතු පාදං නමා මහං

දරුවා සිප වැළඳ ගෙන පෝෂණය කළ රාජ මධ්‍යයෙහි පිහිටු වන ලද දයාබර පියාණන්ගේ පාද මම බැතියෙන් නමස්කාර කරමි.

## මවට වදින ගාථාව

දසමාසේ උරේකත්වා - පොසේසි වුද්ධි කාරණං
ආයුදීඝං වස්ස සතං - මාතුපාදං නමා මහං

දස මාසයක් කුසෙහි දරා මාව පෝෂණය කළ මෑණියන් වහන්සේට සියවස් කලක් දීර්ඝායුෂ ලැබේවායි ඔබගේ පා බැති සිතින් නමදිමි.



## ශිල්පය ඉගැන්වූ ගුරුවරුන්ට වදින ගාථාව

සෝහි විසේසි මමං කරුණාය - සිප්ප පවෙසුච සත්ථ වරේසු
තංහි ගුරුං මම ගාරව චිත්තෝ - පඤ්ජලිකෝ පණමාමි හසම්මා

කරුණාවෙන් යුක්තව මට ශිල්ප ශාස්ත්‍රය උගන්වා වරදට අවවාද දෙමින් මට යහපත සාදා දුන් එම ගුරු උතුමාණන්ට ඇඟිලි බැඳ මම මනාකොට නමස්කාර කරමි.

## ශාසනික පුණ්‍ය ප්‍රාර්ථනාව

අප මහා බෝසතාණන් වහන්සේ විසින් විසිඅසංඛ්‍ය කල්ප ලක්ෂයකට ඉහතදී තබන ලද පාරමී ධර්මයන් සිහිපත් කරමින් සත් අසංඛ්‍ය කල්ප ලක්ෂයක් සිතින් බුදු බව පැතූ බව සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන් ද, නවාසංඛ්‍ය කල්ප ලක්ෂයක් වචනයෙන් බුදු බව පැතූ බව සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද, දීපංකර පාද මූලයේ පටන් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් දස පාරමී ධර්මයන් සමතිංසත් ආකාරයෙන් මනාව සම්පූර්ණ කළ බව සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද එම කාලය තුළ ලොව පහළ වූවා වූ (5-12-027) පන් ලක්ෂ දොළොස්දහස් විසිහත් නමක් වූ බුදුරජාණන් වහන්සේලාගේ සත්‍යානුභාව බලයෙන්ද, ලොව සියල්ල දන්නා වූ ලොව්තුරා බුද්ධත්වය ලැබූ බව ඒකාන්තයෙන් සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන් ද, එම බෝධි මූලයේ දී අවබෝධ කළ නව ලොව්තුරා ශ්‍රී සද්ධර්ම රත්නය ඒකාන්තයෙන් සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන් ද, එම සත්‍ය ධර්මය අවබෝධ කළ ධර්මයට අනුව පිළිවෙත් පුරන මහා සංඝරත්නය ඒකාන්තයෙන් සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද, සතර මාර්ග ඥාන, ෂඩ් අසාධාරණ ඥාන, දසබල ඥාන, චුද්දස මහා ඥාන, සෝළස මහා ඥාන, අට්ඨාරස ආවේණික බුද්ධ ගුණ ඥාන, සූවිසි කෝටිවාර අර්හත් ඵල වජ්‍රඥාන, අනන්තනය සමන්නාගත සමන්ත පට්ඨාන ප්‍රකරන විෂයන්තර්ගත ගම්භීර ඥාන ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥාන, ආසයානුසය ඥාන, යමක පටිහාරිය ඥාන මහා කරුණා සමාපත්ති ඥාන, සබ්බඤ්ඤුත ඥාන, අනාවරණ ඥාන ආදිය පරිවාර කොට ඇති සර්වඥතා ඥානය අවබෝධ කළ

බව ඒකාන්තයෙන් සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන් ද, ධර්ම රත්නයේ ආනුභාව බලයෙන්ද, මහා සංඝ රත්නයේ ආනුභාව බලයෙන් ද, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආනුභාව බලයෙන්ද, දන්ත ධාතුන් වහන්සේලාගේ ආනුභාව බලයෙන්ද, ලලාට ධාතුන් වහන්සේගේද, ග්‍රීවාහා ධාතුන් වහන්සේගේද, අකු ධාතුන් වහන්සේලාගේ ආනුභාව බලයෙන්ද, ද්‍රෝණයක් සර්වඥ ධාතුන් වහන්සේලාගේ ආනුභාවයෙන්ද, බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී ගුණ බලයෙන්ද, සත්බුදුවරුන් වහන්සේලාගේ ආනුභාවබලයෙන්ද, අටවිසි බුදුවරයන් වහන්සේලාගේ ගුණ බලයෙන්ද ලොව පහළ වී වදාළ සියලුම බුදුවරයින් වහන්සේලාගේ අනුභාව බලයෙන්ද, බුද්ධ තේජානුභාව බලයෙන්ද බුද්ධ ඍද්ධ්‍යානුභාව බලයෙන්ද, පින් අනුමෝදන් වන දෙවියන්ගේ රැකවරණයෙන්ද, කළ්‍යාණ මිත්‍රයන් වහන්සේලාගේ මෛත්‍රී පූර්වාඞ්ගම ආශිර්වාද බලයෙන්ද, නිවන් දක්නා ජාති දක්වාම සුවසේ පාරමී ධර්මයන් පුරාගැනීමට යම් බඳු බාධාවක් වශයෙන් පැමිණ ඇති සියලුම අපල උපද්‍රව ග්‍රහදොස සතුරු කරදර බාදක පීඩා අදෘශ්‍යමාන බලවේග ආදී සියලු විපත්ති දුරුවේවා. නිදුක් නිරෝගී භාවයෙන් සුවසේම ආමිස ප්‍රතිපත්ති ධර්මයන් පුරාගැනීමට භාවනා මනසිකාර දියුණු කර ගැනීමට ඇති සියලුම විපත්ති දුරු වේවා. සම්පත්ති ළඟා වේවා. අකුසල් සිත් දුරු වේවා. කුසල් සිත් පහළ වේවා. මෝහාන්ධකාරය දුරු වේවා. ප්‍රඥාලෝකය පහළ වේවා. අවිද්‍යා අන්ධකාරය දුරු වේවා. විද්‍යාලෝකය පහළ වේවා. අධර්මය දුරු වේවා. ධර්මය ළඟා වේවා. අසත් පුරුෂයෝ දුරු වෙත්වා. සත් පුරුෂයෝ ළඟා වෙත්වා. අධමයෝ දුරු වෙත්වා. උත්තමයෝ ළඟාවෙත්වා. ජනිත කරගත් කුසල් ශක්තිය අපගේ නමින් මිය පරලොව ගිය සියලු ඥාතීන්ට අත්වේවා. මේ පින් බලයෙන් උපනූපන් ජීවිතයක් පාසාම සුගති සැප විදිමින් සුවසේ පාරමී පුරා නිවන් අවබෝධ වේවා. ශාසන ආරක්ෂක, ආත්ම ආරක්ෂක දිව්‍ය රාජ මණ්ඩලය මේ පින් අනුමෝදන් වී අපවත්, ශාසනයත්, අපගේ ගෙවල්, දොරවල්, ඉඩකඩම්, යාන වාහන දූ දරුවන් , දේපළ, වෙළඳ ව්‍යාපාර, රැකියා ස්ථානයන් ආදි සෑම දේටත් සෑම දෙනාටත් මැනවින් දේවාරක්ෂාව ලබා දෙත්වා. අපගේ මවුපිය දූදරු නෑදෑ හිතමිත්‍ර ආදී සියලුම ඥාතීන්ටත්, හිතවතුන්ටත් සියලුම කළ්‍යාණ මිත්‍රයන්ටත් ආයුරාරෝග්‍ය සම්පත් ඇතුව සුවසේම මෙලොව



පරලොව දෙව් මිනිස් දෙගතියෙහි සුවසේම පාරමී පුරාගෙන නිවන් සුවය අවබෝධ වෙත්වා. සොර, සතුරු, ගිනිදිය, වස විස, අවි ආයුධයකින් කිසිදු අන්තරාවක් නොම වේවා. අපගේද වෙළඳ ව්‍යාපාර, රැකීරක්ෂා, අධ්‍යාපන කටයුතු හා අනාගත යහපත් පුණ්‍ය ප්‍රාර්ථනා පූර්ණ චන්ද්‍ර මණ්ඩලය සේ පිරී ඉතිරි සශ්‍රීක වී සෞභාග්‍යමත් අනාගතයක් උදාවේවා. ශාසනය පිහිට කරගෙන තව තවත් සීල, සමාධි, ප්‍රඥා, දාන, සීල, භාවනා, ආමිස, ප්‍රතිපත්ති,සමථ, විපස්සනා යන ආදී ශාසනික සාරණීය ගුණධර්ම සුවසේම පාරමී වශයෙන් පුරාගෙන සුවසේම භාවනා අරමුණෙහි සිත පිහිටුවා සමාධි ඥාන, භාවනා ඥාන, විදර්ශනා ඥාන, මාර්ග ඥාන, ප්‍රතිපත්ති ඥාන, අනුපිළිවෙලින් ලැබ සුවසේම ලෞකික ලෝකෝත්තර ප්‍රාර්ථනා මුදුන්පත් වී අති උතුම් පරම රමණීය ශාන්ති ලක්ෂණ නිර්වාණ අවබෝධයට පැමිණීම පිණිස ධර්මයම පිහිට වේවා. උතුම් වූ නිවන් අවබෝධය දක්වාම කළ්‍යාණ මිත්‍ර සම්පත්තිය සුවසේම ලැබේවා. සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා, නිවන් අවබෝධයෙන් සසරෙන් එතෙර වෙත්වා.

**චිරං තිට්ඨතු සාසනං**

සාධු! සාධු!! සාධු!!!

සම්මා සම්බුද්ධ සාසනය බොහෝ කල් පවතීවා.

## පුණ්‍යානුමෝදනා

**සබ්බ දානං ධම්ම දානං ජිනාති**
සියලු දානයන්ගෙන් ධර්ම දානය දිනයි.

මෙම පොත, අප දරුවන්ට සෙත්පතා වර්ෂයක් පාසා සිදුකරන ධර්ම දානමය පිංකමකි.

බෞද්ධ දරුවාට අත් පොතක් වන මෙම ධර්ම ග්‍රන්ථය නාතගන ආරණ්‍ය සේනාසනයේ වැඩ විසූ අපවත් වී වදාළ අතිපූජ්‍ය කර්මස්ථානාචාර්ය දාස්වත්තේ සුමනසීල හිමිපාණන් වහන්සේ විසින් සකස් කර ඇත්තේ යක්කල චන්ද්‍රජෝති මහා විද්‍යාලයේ ආචාර්ය සමීර මහතාගේ අදහසකට අනුවයි.

බෝධිසත්ව ගුණෝපේත අති පූජ්‍ය කර්මස්ථානාචාර්ය දාස්වත්තේ සුමනසීල ස්වාමීන් වහන්සේට උතුම්වූ බුදුබව ලබාගැනීම සඳහාම මෙම කුසලය හේතු වාසනා වේවා.

සංසාරයේ සැරිසරනතාතෙක් උන්වහන්සේට දීර්ඝයුෂ පිණිසම මෙම කුසලය හේතුවේවා.

මෙම ධර්ම දානමය කුසලය ශ්‍රී කළ්‍යාණි යෝගාශ්‍රම සංස්ථා ප්‍රධාන අනුශාසක අපවත් වී වදාළ අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඥානාරාම මහා ස්වාමීන් වහන්සේට නිවන් සුව පිණිසම උපකාර වේවා!

ශ්‍රී කළ්‍යාණි යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක බෝධිසත්ව ගුණෝපේත අපවත් වී වදාළ අතිගරු පූජනිය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මහා ස්වාමීන් වහන්සේට සුවසේම පාරමී පුරා ලොව්තුරා බුදුබව පිණිසම මේ කුසලය හේතු වේවා!

අපවත් වී වදාළ ශ්‍රී කළ්‍යාණි යෝගාශ්‍රම සංස්ථා ප්‍රධාන අනුශාසක බෝධිසත්වගුණෝපේත අතිගරු පූජනීය මහා කර්මස්ථානාචාර්ය නාඋයනේ අරියධම්ම මා හිමිපාණන් වහන්සේට සුවසේ පාරමී පුරා උතුම් බුදුබව පිණිසම මේ කුසලය හේතු වේවා!

ගරු සුමනසීල ස්වාමීන් වහන්සේ ගේ පරලෝ සැපත් පියාණන් වහන්සේටත්, ශ්‍රේෂ්ඨ ගුණයෙන් යුතු පුතෙකු බිහි කළ ජීවත්ව සිටින දයාබර මෑණියන්ටත්, සහෝදර සහෝදරියන් පිරිස ටත් අති උතුම් නිවන් සුවය ම ලැබේවා!

අප සැමගේ නමින් මිය පරලොව ගිය සියළු ම ඥාතිවරුන්ට මෙම පින් අනුමෝදන් වේවා!

මෙම පොත මුද්‍රණය කරවා ධර්ම දානමය වශයෙන් 



පිරිනැමීමට කටයුතු කළ අප සැම දෙනාටත්.අපගේ සුජීවත් ව සිටින මව්පිය දූ දරු සහෝදර සහෝදරියන් සැමටම, මුනුපුරු මිණිපිරි සැම දෙනාටම, ඥාති හිත මිත්‍රාදීන්ටද, මෙය කියවන සැමදෙනාටමත්, සුවසේ සීල, සමාධි, ප්‍රඥා ගුණ පුරාගෙන උතුම් නිවන් සුවයෙන් සැනසීමට හේතු වේවා!

මුද්‍රණ කටයුතු මැනවින් සම්පූර්ණ කළ දිමුතු මුද්‍රණාලයේ එච්. එම්. එච්. බණ්ඩාර මහත්මා ඇතුළු සැම දෙනාටත් නිවන් සුවය අත් වේවා!

මෙයට,
පින් කැමති
දෙමව්පිය පිරිස.

2015 මුද්‍රණය කල සූවිසි ගුණවන්දනාව පොතේ ගෞරවනීය දාස්වත්තේ සුමනසීල හිමියන්ගේ ලිපියෙන් දරුවන් වෙනුවෙන් ලියා තිබුන සෙත් පැතීම

මෙම උතුම් ධර්ම දානමය කුසලය වර්ෂයක් පාසා සිදු කරන පිංවත් දරුවන්ගේ ජීවිත වටා පැමිණ ඇති සියලු අපල උපද්‍රව, ග්‍රහ දෝස, සතුරු කරදර බාධක පිඩා මග හැරේවා! අසංවර, කම්මැළි ගති පැවතුම් දුරු වේවා.! කායික නිරෝගී සුවය මානසික නිරෝගී සුවය ලැබේවා. එළඹ සිටි සිහි නුවණින් තැනට සුදුසු නුවණින් සංවරව මව්පිය ගුරුවර වැඩිහිටියන්ට අවනතව සත් පුරුෂ ගුණ නුවණින් උසස් අධ්‍යාපන කටයුතු දිනෙන් දින දියුණු වේවා! අනාගත සෞභාග්‍ය උදා වේවා. සුවච කීකරු නිහතමානී සත්පුරුෂ කළගුණ සත්කාර කරන්නට හැකි වේවා! නිදුක් නිරෝගිව දීර්ඝායුෂ ලැබේවා!

## අපේ පැතුම

මෙම උතුම් කුසල් බලයෙන් අප සැම දෙනාටම සැපෙන් සතුටින් ජීවත් වෙන්න ලැබේවා. අපව හදා වඩා ගන්නා දයාබර මව්පියන්ට සුවච කීකරුව ජීවත් වෙන්න ලැබේවා.

◆අපට ශිල්ප උගන්වන ගුරුවරුන්ට සුවචව අවනතව හොඳින් ඉගෙන ගන්න ලැබේවා.
◆අපගේ සහෝදර සහෝදරියන් සමඟ සමඟියෙන් ඉන්න ලැබේවා.
◆අපට අනාගතයෙහි රට, දැය ආගම වෙනුවෙන් වැඩ කරන්න ලැබේවා.
◆එළඹ සිටි සිහි නුවණින් උසස් අධ්‍යාපන කටයුතු කරගන්න ලැබේවා.
◆අපගේ අනාගතය වාසනාවන්ත බවට පත්වේවා.

නිමෙත්මා සුහේලි, පවනි මුණසිංහ, කේතකී මුණසිංහ, හසිනි නවෝද්‍යා, ඉසුරු රසාංජන, කල්පනී චතුරිකා, ජලනි, ඔමිල ජනාන්දිත, පසන් මලීෂ, චතුරිකා මධුෂානි, චතුෂාන් මධුසංක, හර්ෂණ ලක්‍ෂාන්, අමාෂා තත්සරණී, උපේක්‍ෂා දහනායක, පවිත්‍රා දහනායක, රුචිර අංජන, මලිත් පබසර, අචිනි සෙව්වන්දි, තරිඳු නුරාජ්, සමාධි ඉඳුරංගා, කවිඳු ඩිල්ෂාන්, ජනිත් මිහිරංග, සමාධි දෙව්මිණී, සසුනි සිප්නාරා, දිසස් දම්සන, දුල්මි රචිකා, චමික ගිම්හාර, සචිනි සහංසා, සනුකි යෙහංසා, සවිත කෞෂල්‍ය, චනුදි ජනුල්‍යා, දෙව්ශානි තිසෙව්මි, ගවීන් චේතික, සෙනෙස් චින්තක, සසේන් චන්ද්‍රක, සිතිල සිව්හස්, අපාරා ලෝසත්මි, තෙනුම් සේනාරත්න සෙනෙති මිහිදිනී, නිපුන වේලතන්ත්‍රි, ඉනුර වේලතන්ත්‍රි, දෙනෙත් තීක්ෂණ, අංජනි එරංදිකා, කවිෂ්ක සිතුමිණ, දිනුක ශාමාල්, ඇසල සිළුමිණ, කෞශල්‍යා දර්ශනි, කෞෂිකා දර්ශනි, දූහැමි නෙත්මිණී, උමායා සිතුමිණී දිනුජය සත්සර, සමාධි දිනේශනි, ඔෂාන් ලක්ෂිත, සචින්ත දර්ශන, කසුන් දනංජය, ඉසුරු සංකල්ප, සදීප සෙහාන්, යසිත් වජ්‍ර, උචේන් පියනෙතු, නිසල් හිමංස, නිසල්නි යසංගා, නෙතුමිණී ගුණවර්ධන, ලසිත් ගුණවර්ධන, හර්ෂණ ලක්ෂාන්, අමාෂා තත්ෂරණී, පින්සර හසරංග, හසිඳු පැහැසර, දිල්මා සේමිණී, නෙත්මා රිත්මිණී, රුවන්ගි තාරකා, තරන හංසක, මෙත්මිණී කව්‍යාංගනී, ඉසිර ගෝෂිත, දසිඳු නිම්නාල්, ආර්.වී.කේ. දිහිනි, සිතිල බිනෝද්, සනුල ඉනොත්, මිනාලී මදාරා, ඇතුළු සියළු දරු දූරියන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක වේවායි. ප්‍රාර්ථනා කරමු.

දායක වු වැඩිහිටි පිරිස :- වින්ධ්‍යා සංජීවනි, සුමනාවතී කාරියප්පෙරුම,